විගණකාධිපතිවරයාගේ

ත්‍රෛවාර්ෂික වාර්තාව

2021-2023

රාජ්‍ය බැංකු

පටුන

			පිටු අංක.
1.	විධායක සාරාංශය		2
2.	මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය		4
3.	රජය සතු බැංකු වල නිරීක්ෂණ		
	3.1	ශ්‍රී ලංකා මහා බැංකුව	6
	3.2	ලංකා බැංකුව	8
	3.3	මහජන බැංකුව	63
	3.4	ජාතික ඉතිරිකිරීමේ බැංකුව	112
	3.5	නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව	127
	3.6	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	156
	3.7	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	161
	3.8	මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනැන්ස් පීඑල්සි	167
	3.9	ශ්‍රී ලංකා ඉතිරි කිරිමේ බැංකුව	181

1. විධායක සාරාංශය

2023 වසර අවසන් වන විට, බැංකු අංශය, බැංකු 30කින්, එනම් විදේශ බැංකු ශාඛා 11ක් ද ඇතුළුව බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6කින් සමන්විත විය. මූල්‍ය අංශයේ ප්‍රධාන අංශය වන බැංකු අංශය, 2023 වසර අවසාන වන විට මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් සියයට 61.5කට හිමිකම් කියමින්, අවම නියාමන අවශ්‍යතාවන්ට වඩා වැඩියෙන් පවත්වාගත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටම් වල සහාය ඇතිව, ආර්ථික අර්බුදයෙන් හා අහිතකර ගෝලීය තත්වයන්ගෙන් පැන නැගුනු අභියෝගවලට ඔරොත්තු දීමට සමත් විය.

බැංකු අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය වසර තුල රුපියල් බිලියන 989.4කින් ඉහල ගිය අතර 2023 දෙසැම්බර් වන විට එය රුපියල් ට්‍රිලියන 20.0 ඉක්ම විය. 2022 වසර අවසානයේ වාර්තා වූ සියයට 15.4ක වාර්ෂික වර්ධනයට සාපේක්ෂව, 2023 වසර අවසානයේ සියයට 5.1ක වාර්ෂික වර්ධනයක්, බැංකු අංශයේ වත්කම් වාර්තා කරන ලදී. විනිමය අනුපාතිකය අධි ප්‍රමාණය වීමත් සමග විදේශ මුදල් වලින් නාමනය කරන ලද ණය සහ ලැබිය යුතු දැ සහ ආයෝජන ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය වීම මෙම වර්ධනයේ පසුබෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. ණය සහ ලැබිය යුතු දෑ, 2022 අවසානයේ පැවති සියයට 5.5ක වාර්ෂික වර්ධනයට සාපේක්ෂව, 2023 අවසානයේ දී සියයට 2.6කින් වාර්ෂික සංකෝචනයකට ලක් වූ අතර, 2023 වසරේ පළමු භාගය තුළ පැවති දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මෙයට හේතු විය.

බැංකු අංශයේ අරමුදල් සැපයීමේ ප්‍රධාන ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති තැන්පතු, 2023 වසර අවසානය වන විට මුළු ශේෂ පත්‍ර වගකීම්වලින් සියයට 81.5 ක් වූ අතර, ණය ගැනීම් වල දායකත්වය සියයට 6.8 ක් විය. '

3 වන අදියර යටතේ පවතින ණය අනුපාතය මගින් නිරූපණය කෙරෙන පරිදි, 2023 වසර අවසානයේ දී බැංකු අංශයේ ණය අවදානම ඉහල මට්ටමක පැවතුණි. ප්‍රධාන වශයෙන් 3 වන අදියර යටතේ පවතින ණය වැඩිවීම සහ ණය සහ ලැබිය යුතු දෑ වල සංකෝචනය හේතුවෙන්, බැංකු අංශයේ 3 වන අදියර යටතේ පවතින ණය අනුපාතය, 2022 වසර අවසානයේ පැවති සියයට 11.3 ට සාපේක්ෂව 2023 වසර අවසානයේ දී සියයට 12.8 දක්වා වැඩි වූ අතර, එමගින් බැංකු අංශයේ ණයවල ගුණාත්මකභාවය පිලිබඳ ගැටලුකාරී තත්ත්වයක් පෙන්නුම් කෙරිණි. කෙසේ වුව ද, 3 වන අදියර යටතේ පවතින ණය සඳහා වෙන් කිරීම් (භාවිතා නොකළ ණය සීමා ඇතුළුව) සියයට 18.4කින් (වාර්ෂික) වර්ධනය වීම මගින්, 2022 වසර අවසානයේ පැවති 3 වන අදියර යටතේ පවතින ණය හානිකරණ ආවරණ අනුපාතය වූ සියයට 44.9 ට සාපේක්ෂව, 2023 වසර අවසානයේ දී එය සියයට 49.3 දක්වා ඉහල යෑමක් වාර්තා කළේය.

රුපියල් වලින් නාමනය කරන ලද රජයේ සුරැකුම්පත් වලින් නියෝජනය වන ද්‍රවශීල වත්කම්වල ඉහල වර්ධනය හේතුවෙන්, ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය (SLAR) සහ ද්‍රවශීලතා ආවරණ අනුපාත (LCRs) මගින් පෙන්නුම් කෙරෙන බැංකු අංශයේ ද්‍රවශීලතාවය 2023 වසරේ දී වර්ධනය විය.

ප්‍රධාන වශයෙන් නව ණය හානිකරණ ගාස්තු අඩුවීම හේතුවෙන් වසර තුළ දී ලාභදායීත්වය වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. 2023 වසර තුළ බැංකු අංශයේ පොලී ආදායම සියයට 25.5කින් ඉහළ ගිය අතර, පොලී වියදම් සියයට 42.7කින් වැඩි වීම, ශුද්ධ පොලී ආදායම සියයට 4.9කින් අඩු වීමට හේතුවිය. එහි ප්‍රතිඵලයක්

වශයෙන්, වසර අවසානයේ සියයට 4.0 ක්ව පැවති ශුද්ධ පොලී ආන්තිකය, 2023 වසර අවසානයේ දී සියයට 3.6 දක්වා අඩු විය.

සමස්තයක් වශයෙන්, 2023 වසර තුළ දී, අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට අනුකූල වීමට බැංකු අංශය සමත්විය. ප්‍රධාන වශයෙන්, සමස්ත ණයවල සංකෝචනය, රජයේ සුරැකුම්පත්වල ආයෝජන ඉහල යෑම, සහ ශ්‍රී ලංකා රුපියල අධි ප්‍රමාණය වීම හේතුවෙන්, 2023 වසර තුළ දී අවදානම මත බර තැබූ වත්කම් ප්‍රමාණය පහත වැටීමෙන් 2022 වසර අවසානයට සාපේක්ෂව, 2023 වසර අවසානයේ දී බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමනාත්මකතාවයෙහි දියුණුවක් වාර්තා විය.

2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

රාජ්‍ය බැංකු විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. රාජ්‍ය බැංකුන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලිමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හෝ අනුකූල නොවීම වාර්තා වී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

තත්ත්වාගණනය කළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හෝ නොගැලපීම් වාර්තා කර ඇති නමුත් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වලට පැතිරී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

අහිතකර මතය

මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර ඇති ප්‍රමාණාත්මක / සාවද්‍ය ප්‍රකාශයන් මූල්‍ය ප්‍රකාශන වලට ව්‍යාප්ත වී ඇති විට, අහිතකර විගණන මතය ප්‍රකාශ කෙරේ.

මතය ව්‍යාචනය කිරීම

විෂය පථය සීමා වීම හේතුවෙන් විගණකට විගණන මතය සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීම හා විගණක විසින් මූල්‍ය ප්‍රකාශන වල හෙළි නොවූ සාවද්‍ය ප්‍රකාශ තිබිය හැකි යැයි තීරණය කරන විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

රාජ්‍ය බැංකු වල මතය පිළිබඳ විස්තර

2021, 2022 සහ 2023 වසර සඳහා රාජ්‍ය බැංකු 09කට අදාළව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන මතයන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

	2021	2022	2023
තත්ත්වාගණනය නොකල	9	9	9
තත්ත්වාගණනය කල	-	-	-
අහිතකර	-	-	-
වියාචනය	-	-	-
මතය තවමත් තීරණය කර නොමැති ගණන	-	-	-
මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැති ගණන	-	-	-

	නම	2021	2022	2023
1.	ශ්‍රී ලංකා මහා බැංකුව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
2.	ලංකා බැංකුව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
3.	මහජන බැංකුව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
4.	ජාතික ඉතිරිකිරීමේ බැංකුව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
5.	නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
6.	ප්‍රාදේශිය සංවර්ධන බැංකුව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
7.	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
8.	මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
9.	ශ්‍රී ලංකා ඉතිරි කිරිමේ බැංකුව	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ

3. රජය සතු බැංකු වල නිරීක්ෂණ

3.1 ශ්‍රී ලංකා මහා බැංකුව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,046,278,158,000	2,582,659,114,000	463,619,044,000	158,162,666,000	තත්ත්වාගණනය නොකළ
2022	4,510,347,102,000	4,428,094,250,000	82,252,852,000	(374,320,973,000)	තත්ත්වාගණනය නොකළ
2023	4,205,444,261,000	4,194,259,205,000	11,185,056,000	(114,430,814,000)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය, 2016 ජුලි 15 දින සිට බලපැවැත්වෙන පරිදි 2016 අංක 06 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලබයි.තැන්පතු භාර ගන්නා සහ ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් (ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර) මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගත යුතුය. තැන්පතු භාර නොගන්නා නමුත් රට තුළ සිටින අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට	2021, 2022	තැන්පතු භාර නොගන්නා නමුත් අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් නියාමනය අවශ්‍ය වේ.	ශ්‍රී ලංකා ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පිහිටුවීම සඳහා පනත් කෙටුම්පත 2024 ජනවාරි මස 09 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබිණි.	ක්‍රියාත්මක වෙමින් පවතී.

	මූල්‍ය සේවා සපයන සමාගම් මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවේ. එබැවින් එවැනි සමාගම්, මෙම පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2023 නොවැම්බර් අවසාන වන විටත් නියාමනය හා අධීක්ෂණය නොකරනු ලබයි.				
(ආ)	2020.11.09 දින පැවති ආයතනික කළමනාකරණ කමිටු රැස්වීමේදී, බැංකුවේ අධිපතිවශයෙන් පත්කරන ලද තැනැත්තකු වෙනුවෙන් විශ්‍රාම ප්‍රතිලාභ සඳහා රීති, නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේරීතිවලට ඇතුළත් කිරීමට නිර්දේශ කර තිබුණු අතර මුදල් මණ්ඩලය 2020.12.23 දින පැවති එහි රැස්වීමේදී එය අනුමත කර තිබුණි. ඒ අනුව, බැංකුවේ අධිපති වශයෙන් පත්කරන තැනැත්තකු විශ්‍රාම ප්‍රතිලාභවලට හිමිකම් ලබන ලදි. කෙසේ වෙතත්, විශ්‍රාම ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබීමට බැංකුවේ අධිපතිවරයා ලෙස සේවය කළ යුතු අවම කාලයක් අධිපතිවරයාට සම්බන්ධ විශ්‍රාම රීතිවල දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.	2021 ,2022	මෙය නැවත සමාලෝචනය කිරීමට එකග වී ඇති අතර එම ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි.	2024.09.11දිනැති අංක 2024/14 දරණ පාලක මණ්ඩල රැස්වීම ප්‍රකාරව, බැංකුවේ අධිපතිවශයෙන් පත්කරන ලද තැනැත්තකු වෙනුවෙන් 2024.09.11 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම ප්‍රතිලාභ සඳහා හිමිකම් නොලබන බවට තීරණය කෙරිණි.	ක්‍රියාත්මක කර තිබුණි.

3.2 ලංකා බැංකුව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	3,803,283,843,000	3,602,524,011,000	200,759,832,000	37,590,107,000	තත්ත්වාගණනය නොකළ
2022	4,336,459,704,000	4,082,275,561,000	254,184,143,000	31,972,408,000	තත්ත්වාගණනයනො කළ
2023	4,411,748,315,000	4,160,033,595,000	251,714,720,000	26,693,526,000	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමහර පද්ධති අසාර්ථක වීම් හේතුවෙන් පොදු ලෙජර් ශේෂය සහ බැංකු වෙළඳ මූල්‍ය පද්ධතියේ හිඟ ශේෂයන් අතර රු.397,565,454 ක වෙනසක් වාර්තා විය. 2021 මුදල් වර්ෂය තුළදී මේ සම්බන්ධයෙන් සම්පූර්ණ ප්‍රතිපාදන සලසා ඇත.	2021	නියමිත දිනට අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම සහ පොදු ලෙජරය සහ උප පද්ධති අතර ශේෂයන් නිරන්තර පදනමින් සැසඳීමට නිර්දේශ කෙරේ.	හිඟ පොලී ශේෂයන් සැසඳීමක් සිදු කෙරේ. 2024.09.30 වන විට සැසඳීමෙන් 90%කට වඩා අවසන් කර ඇත. ඉතිරි ශේෂයන් සැසඳීම 2024.11.15 දිනට පෙර අවසන් කෙරෙන අතර 2024.11.30 දිනට පෙර ප්‍රතිපාදන ආපසු හැරවීමට කළමනාකාරීත්ව අනුමැතිය ලබාගනු ඇත.	
(ආ)	<u>**සීලෝන් නිව්ස් පේපර්ස් සමාගම වෙත ලබා දී (පුද්) ඇති ණය**</u> සීලෝන් නිව්ස් පේපර්ස් (පුද්) සමාගම වෙත ප්‍රථම පහසුකම 2011 දී ප්‍රදානය කරන ලද අතර 2014 දී	2021	කිසියම් ගනුදෙනුකරු වෙකුට ණය ලබා දීමට පෙර බැංකුව විසින් සතුටුදායක පාරිභෝගික ඇගයීම් සිදු කර	1. පහසුකම් ප්‍රතිලේඛනගත කිරීම මත 2017 වර්ෂයේ උපචිත පොළී ප්‍රාග්ධනීකරණයත් සමඟ මුලින් ප්‍රදානය කරන ලද පහසුකම්	

ඒවා වැඩි කර ඇත. මුල් වරට 2015 දී සහ නැවත වරක් 2017 දී කාල සීමාව වැඩි කිරීම සහ පැවති පොලී අනුපාත අඩු කිරීම මගින් පහසුකම් ප්‍රතිලේඛණගත කර තිබුණි. සමාගමේ මුළු ණය කළඹ 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ණය 13 කින් සහ උප ණය 11 කින් සමන්විත වන අතර සමස්ත සමූහයේ ණය ප්‍රමාණය රු. මිලියන 2,370 කි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

- 2019 දෙසැම්බර් මාසයේ සිට ලබා දී ඇති ප්‍රධාන ණය 13 න්, පවතින ණය ප්‍රතිලේඛනගත කිරීමට හෝ පවතින ණයවර ලිපි / බිල්පත් ප්‍රතිග්‍රහණය / ණය මාලාවක් (එක්වර සහ සියල්ලට) යටතේ වූ හිඟ මුදල් පරිවර්තනය කිරීමට ණය 11 ක් ලබා දී ඇත.
- ප්‍රධාන ණය 13 න්, ණය 9 ක් මාස 24 ක සහන කාලයක් ද තවත් එක් ණයක් මාස 12 ක සහන කාලයක්ද සහිතව ලබා දී ඇත. එබැවින්, මෙම ණය 10 තවමත් ක්‍රියාකාරී කාණ්ඩයේ පවතී.
- සමාගමේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය අහිතකර විය. ඇති බව සහතික කිරීමට නිර්දේශ කෙරේ.

වැඩි දියුණු කරන ලදී.

2. සියලුම මුදල් ප්‍රවාහ ගැටළු සහ සමාගමේ නුසුදුසු මූල්‍ය පසුබිමක් තිබියදීත්, ව්‍යාපාරය කරගෙන යාමට අවශ්‍ය ණය පහසුකම් කිහිපයක් බැංකුව විසින් සලකා බලා ඇති අතර කොවිඩ් -19 පැතිරීම හේතුවෙන් රටේ තත්ත්වය සලකා බලමින් අවස්ථා කිහිපයකදී ණය සහන කාලයක් ලබා දී ඇත.
3. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ඔවුන්ගේ ආදායම මන්දගාමීව සාක්ෂාත් කර ගැනීම සැලකිල්ලට ගනිමින්, ඔවුන්ගේ පුරෝකථනය කළ මුදල් ප්‍රවාහයන් සමඟ මාසික ආපසු ගෙවීම ගැලපෙන පරිදි මුළු කළඹ ප්‍රතිව්‍යුහගත කිරීමට සමාගම ඉල්ලා ඇත.
4. නාස්තිය අවම කිරීම සහ නිෂ්පාදනයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම අපේක්ෂා කරන නව අර්ධ ස්වයංක්‍රීය මුද්‍රණ යන්ත්‍රයක් ආනයනය කිරීමත් සමඟ ආදායම වැඩි කර ගනිමින්

සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, එය 2011/12 සිට 2019/20 දක්වා සැලකිය යුතු ශුද්ධ අලාභයක් වාර්තා කර ඇති අතර පසුගිය වසර නවයක කාලය පුරා අලාභය සැලකිය යුතු ලෙස වැඩි වෙමින් පවතුණි. සමාගමේ සෘණ ශුද්ධ වටිනාකම 2019/2020 දී රු. බිලියන 3.7 දක්වා ළඟා වී ඇත. මෙම ණය ලබාදීමට පෙර බැංකුව සමාගමේ අහිතකර මූල්‍ය තත්ත්වය සලකා බලා නොමැත.

- පිරිනැමීමේ ලිපියේ දක්වා ඇති පහත කොන්දේසි සපුරාලීමට සමාගමට නොහැකි විය.

- 2018 මාර්තු 31 දිනට හෝ ඊට පෙර ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 300 දක්වා වැඩි කිරීම.

- අධ්‍යක්ෂවරුන් විසින් මාසිකව සහතික කරන ලද තොග සහ ලේඛනගත ණය ප්‍රකාශනයන් සැපයීම.

- කොළඹ 07, හෝර්ටන් පෙදෙසේ පිහිටි සමාගමේ සභාපතිවරයාගේ පුද්ගලික දේපළ විකිණීමෙන් ලැබීමට නියමිත මුදලින් රු. මිලියන 365.4 ක ව්‍යාපාරය පුනර්ජීවනය කිරීමේ අරමුණින් නැවුම් ණය පහසුකම් ප්‍රදානය කිරීමත් සමඟ ණය ප්‍රමාණය රුපියල් බිලියන 2.3 දක්වා ඉහළ නංවා ඇත. තවද, සමාගම නව මුද්‍රණ යන්ත්‍රය භාවිතයෙන් සඟරා මුද්‍රණය, අභ්‍යාස පොත් මුද්‍රණය සහ පොත් කවර මුද්‍රණය ලෙස නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමට අපේක්ෂා කරයි.

5. නව අර්ධ ස්වයංක්‍රීය මුද්‍රණ යන්ත්‍රය පැමිණීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට නව ව්‍යාපාර උපාය මාර්ග සහිත ව්‍යාපාර සැලැස්මක් සමාගම විසින් ඉදිරිපත් කර ඇත. සිඑන්එල් විසින් පැහැදිලි කරන ලද පරිදි, නව යන්ත්‍රය මඟින් කඩදාසි, තීන්ත නාස්තිය අවම කිරීම, නිෂ්පාදනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කරන අතරම විදුලි පරිභෝජනය අඩු කිරීම තුලින් රුපියල් මිලියන 10 ක මාසික පිරිවැයක් ඉතිරි කර ගැනීමට අපේක්ෂා කෙරේ.
6. කර්මාන්තශාලාවේ සවි කර ඇති

කාලීන ණය පහසුකම යටතේ මුළු හිඟය පියවීම.

- 2020 මැයි 12 දිනැති අංක 2.12 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන අනුව, මෙම සමාගමට තවත් පහසුකම් ලබා නොදීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ ඉල්ලීම මත පදනම්ව රු. මිලියන 850 ක නව ණය පැකේජයක් 2021 මැයි 06 දින අනුමත කර ඇත.
- 2021 නොවැම්බර් 17 දිනැති අංක: 2.6 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන අනුව, උකස් කළ දේපල සඳහා තක්සේරු කණ්ඩායම විසින් අගය කර ඇති වෙළඳපොළ වටිනාකම මත සියයට 100 ක් දක්වා අත්තිකාරම් අනුපාතය සලකා බැලීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, අනෙකුත් පහසුකම් සඳහා වන චක්‍රලේඛ උපදෙස් අනුව, බැංකුවේ තක්සේරුකරුවන් විසින් අගය කර ඇති බලකල විකුණුම් අගය මත පදනම්ව අත්තිකාරම් අනුපාතය සියයට 60 ක් ලෙස සැලකේ. යන්ත්‍රය ආනයනය කිරීමට ගතවන කාලය සහ ආර්ථිකයේ මන්දගාමී ස්වභාවය සැලකිල්ලට ගනිමින්, සිඑන්එල් විසින් ඔවුන්ගේ පුරෝකථනය කරන ලද මුදල් සමඟ මාසික ආපසු ගෙවීම් ගැලපෙන පරිදි ආපසු ගෙවීමේ කාල සීමාවේ වැඩි කිරීමක් සමඟ මාස 24 ක සහන කාලයක් ඉල්ලා සිටියේය.

7. කම්හල් පරිශ්‍රයේ පිහිටා ඇති දේපල සහ යන්ත්‍රෝපකරණ 4ක දැනට පවතින සහ අතිරේක උකස් මගින් සම්පූර්ණ ණය ප්‍රමාණය ආවරණය කරනු ලැබුවේ පැනල් තක්සේරුකරු විසින් තබන ලද 100% වෙළඳපල වටිනාකම දක්වා අත්තිකාරම් අනුපාතය සලකා බලමිනි.
8. 2018 මාර්තු 31 හෝ ඊට පෙර ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 300 දක්වා වැඩි කිරීම.

මෙම කොන්දේසිය පහත සඳහන් පරිදි අවස්ථා කිහිපයකදී සමාගමට දන්වා ඇත;

එබැවින්, බැංකුව විසින් සමාගමට වැඩි ණය පහසුකම් ලබා ගැනීමට ඉඩ සලසා දෙමින් වඩාත් හිතකර පිළියම් ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

a) 2020.05.22 දිනැති ඒජීඑම් (ආයතනික සබඳතා) විසින් අත්සන් කරන ලද ලිපියක්, අපගේ බැංකු කළමනාකාරිත්වයේ ගැටළු දන්වා සිඑන්පි හි කළමනාකාර අධ්‍යක්ෂ වෙත යවා ඇත.
b) පාරිභෝගිකයාට වරින් වර නිකුත් කරන ලද පිරිනැමීම් ලිපිවල සඳහන් කර ඇති විශේෂ කොන්දේසි යටතේ, "2022.03.31 හෝ ඊට පෙර ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 300 දක්වා වැඩි කළ යුතුය" යනුවෙන් සඳහන් කර ඇත.
c) තවද 2022.03.31 දින හෝ ඊට පෙර ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 300 ක් දක්වා වැඩි කරන බවට අපි සමාගමෙන් සහතිකයක් ලබාගෙන ඇත.
d) බැංකුව විසින් ප්‍රකාශ කරන ලද කොන්දේසි සම්බන්ධයෙන් පාරිභෝගිකයා සාධනීය ප්‍රතිචාරයක් හෝ නිර්දේශිත ක්‍රියාමාර්ගවලට අනුකූලතා නොපෙන්වා ඇතත්, එවකට

පැවති පශ්චාත් කොවිඩ් -19 ප්‍රතිවිපාකවල පවතින තත්ත්වයන් අනුව, සියලුම ආර්ථික පසුබෑම් මධ්‍යයේ වුවද සාමාන්‍ය මෙහෙයුම් තත්ත්වයට පත්වීමේ අවශ්‍යතාවය සහ අපගේ බැංකුව එවැනි උත්සාහයකට සහාය විය යුතුය යන අපේක්ෂාවෙන් සමාගමට තවදුරටත් අරමුදල් සැපයීමට බැංකුව අනුමත කර ඇත.

9. අධ්‍යක්ෂවරුන් විසින් මාසිකව සහතික කරන ලද තොග සහ පොත් ණය ප්‍රකාශයන් සැපයීම.

සමාගම කලින් මාසික වාර්තා නිතිපතා එවා නොතිබුණද, 2021 ජුනි මාසයේ සිට, අපි සමාගමේ සාමාන්‍යාධිකාරීවරයාගේ (බලයලත් අත්සන්කරුවෙකුගේ) අත්සන යටතේ අප විසින් සකස් කරන ලද විශේෂ ආකෘතියකින් මාසික වාර්තා ලබාගෙන ඇත.

10. කොළඹ 07, හෝර්ටන් පෙදෙසේ පිහිටි

සමාගමේ සභාපතිවරයාගේ පුද්ගලික දේපළ විකිණීමෙන් ලැබෙන ආදායමෙන් රුපියල් මිලියන 365.4ක කාලීන ණය පහසුකම යටතේ ඇති මුළු හිඟ ශේෂයන් පියවීම. මෙම දේපල විකුණා ණය වාරික පියවීමට සමාගමට අදහසක් තිබුණි. සමාගමේ සාමාන්‍යාධිකාරීව රයා විසින් දන්වා ඇති පරිදි, ටිරාන් අලස් මහතාට අයත් හෝර්ටන් පෙදෙසේ පිහිටි දේපළ විකිණීම සඳහා සාධාරණ අගයක් ඔවුන්ට නොලැබුණු බැවින් එය ක්‍රියාත්මක නොවීය. එබැවින් දීර්ඝ කාලයක් තුළ ආපසු ගෙවීමට හැකි වන පරිදි ණය ප්‍රතිව්‍යුහගත කරන ලෙස ඉල්ලා සිටියේය.

11. 2020 මැයි 12 දිනැති අංක 2.12 දරන අධ්‍යක්ෂ මණ්ඩල සටහනට අනුව, මෙම සමාගමට තවත් පහසුකම් ලබා නොදීමට

මණ්ඩලය තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ ඉල්ලීම මත පදනම්ව රුපියල් මිලියන 850 ක නව ණය පැකේජයක් 2021 මැයි 06 දින අනුමත කර ඇත.

1.0 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ තත්ත්වය, එහි ණය සුදුසුකම් නොමැතිකම, සමාගමේ දිගින් දිගටම පාඩු ලබන තත්ත්වය සහ මේ සම්බන්ධයෙන් ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් දක්වන ලද සවිස්තරාත්මක අදහස් සලකා බලා ඇතත්, ප්‍රතිව්‍යුහගත කිරීමේ පැකේජයට සහ නව ණය සඳහා අනුමැතිය ලබා දී ඇත්තේ සංදේශයේ දක්වා ඇති සියලුම සුරකුම් සහ කොන්දේසි සහ සීඅර්ඕ විසින් නියම කර ඇති පහත සඳහන් කොන්දේසි වලට යටත්වය.

i. සමාගම පසුගිය වසර 10 ක පාරිභෝගිකයෙකු

වේ.

ii. මෙම පහසුකම සමඟ නව/නැවුම් ඇපකර ගෙන එනු ලැබේ.

iii. මිලදී ගැනීමට සැලසුම් කර ඇති නව යන්ත්‍රය මඟින් සමාගමේ ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා නාස්තිය අවම කරනු ඇත.

iv. එය රටේ දෙවන විශාලතම සංසරණයක් ඇති පුවත්පත් සමාගම බැවින් මෙම සමාගමට උදව් කිරීමේ අවශ්‍යතාවය මත.

2.0 සමාගම පැහැදිලි කරන පරිදි නව අර්ධ ස්වයංක්‍රීය මුද්‍රණ යන්ත්‍රය පැමිණීමත් සමඟ අභ්‍යාස පොත් සහ සඟරා නිෂ්පාදනය කිරීමෙන් ව්‍යාපාරය විවිධාංගීකරණය කිරීමට ඔවුන් සැලසුම් කරයි. මෙම ප්‍රවේශය සමාගම විසින් ඉදිරිපත් කරන ලද පුරෝකථනය කරන ලද මුදල් ප්‍රවාහ වාර්තා අනුව ව්‍යාපාරයට සැලකිය යුතු අමතර ආදායමක් එක් කරනු ඇත.

3.0 සමාගම විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපාර සැලැස්මට

අනුව පුරෝකථනය කරන ලද අතිරේක ආදායම භාවිතා කරමින්, ව්‍යාපාරය පුනර්ජීවනය කිරීමේ අරමුණින් සහ සමාගමට ලබා දී ඇති පවතින ණය ආපසු අයකර ගැනීමේ අරමුණින් බැංකුව සමාගමට නව පහසුකම් අනුමත කර ඇත.

12. 2021 නොවැම්බර් 17 දිනැති අංක: 2.6 දරන මණ්ඩල සටහනට අනුව, උකස් කළ දේපල සඳහා පැනල් තක්සේරුකරු විසින් තබා ඇති වෙළඳපල වටිනාකම මත සියයට 100 දක්වා අත්තිකාරම් අනුපාතය සලකා බැලීමට තීරණය කරන ලදී. කෙසේ වෙතත්, අනෙකුත් පහසුකම් සඳහා වන චක්‍රලේඛ උපදෙස් අනුව බැංකු තක්සේරුකරු විසින් තබන ලද අපේක්ෂිත විකුණුම් අගය මත පදනම්ව අත්තිකාරම් අනුපාතය සියයට 60ක් ලෙස සැලකේ. එබැවින්, බැංකුව විසින් සමාගමට වැඩි ණය පහසුකම් ලබා

ගැනීමට ඉඩ සලසා දෙමින් වඩාත් හිතකර පිළියම් ලබා දී ඇති බව නිරීක්ෂණය විය..

2020.01.29 දිනැති ඕඅයිසී 13/2020 ඇමුණුම II (ඊ) ට අනුව, ලබා දී ඇති උපරිම මුදල බැංකුවේ නිශ්චල දේපල තක්සේරු කිරීමේ එෆ්එස්වී 60% කට සීමා කළ යුතු බව සටහන් වේ.

පහත සඳහන් කර ඇති කරුණු සලකා බලමින්. තක්සේරු කණ්ඩායම විසින් 100% ක තක්සේරුවකට යටත්ව දැනට පවතින/යෝජිත පහසුකම් සුරක්ෂිත කිරීමට අපි යෝජනා කර ඇති අතර ඒ සඳහා 2021.05.06 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියද ලබාගෙන ඇත.

i. දැනට පවතින අනාරක්ෂිත පහසුකම් සුරක්ෂිත කිරීමේ අරමුණින් යෝජිත පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සිදු විය.
ii. ඉඩම් මිල ඉහළ යෑම සහ යෝජිත පහසුකම්වලින් වැඩි ප්‍රමාණයක් මාසික ආපසු ගෙවීම් සහිත කාලීන ණය වන අතර, එම නිසා සම්පූර්ණ ණය

				ප්‍රමාණය අඩු වෙමින් පවතී. කෙසේ වෙතත්, 2021.04.29 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලද සංදේශයේ ණය ප්‍රතිපත්තියෙන් බැහැරවීමේ 4.2 වගන්තිය යටතේ, නිශ්චල දේපල වලට එරෙහිව සලකා බලන ලද අත්තිකාරම් අනුපාතිකයට අදාළව බැංකුවේ අනුමත ණය ප්‍රතිපත්තියෙන් එම යෝජනාව බැහැර වන බව සඳහන් විය. ගනුදෙනුකරුගේ ණය ගොනුව 2022.08.31 ව්‍යාපාර පුනර්ජීවනය සහ පුනරුත්ථාපන ඒකකය වෙත මාරු කර ඇත. තවමත් පුනර්ජීවන ක්‍රියාවලිය යටතේ පවතින ව්‍යාපාරය පුනර්ජීවනය කිරීම සඳහා 2022.11.24 දින අදාළ නියෝජිත බලධාරින්ගේ අනුමැතිය ඇතිව පුනර්ජීවන පැකේජය ලබා දී ඇත.
(ඇ)	**<u>ඩබ්ලිව් එම් මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි සමාගමට ලබා දී ඇති ණය</u>** ඩබ්ලිව් එම් මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි සමාගම යනු පුද්ගලික සීමිත	2021	කිසියම් ගනුදෙනුකරු වෙකුට ණය ලබා දීමට පෙර බැංකුව විසින් සතුටුදායක පාරිභෝගික	2023.03.31 දින දැනට පවතින සුරැකුම් වලට එරෙහිව සම්පූර්ණ ණය කළඹ ප්‍රති ලේඛනගත කිරීම සඳහා සහ එතනෝල්

වගකීම් සහිත සමාගමක් වන අතර පුළුල් පරාසයක පොල් සහ මිශ්‍ර අරක්කු නිෂ්පාදන නිෂ්පාදනය සහ බෝතල් කිරීමෙහි නිරත වේ. බැංකුව විසින් සමාගමට ණය පැකේජයක් ලබා දී ඇති අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. • බැංකුව විසින් 2016 ජූනි 8, 2018 ජූලි 09, 2019 සැප්තැම්බර් 18 සහ 2020 මැයි 12 යන දිනයන්හිදී ඩබ්ලිව් එම් මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි සමාගම වෙත නව පහසුකම් සහ දැනට පවතින පහසුකම් සඳහා පුළුල් කිරීම් කිහිපයක් අනුමත කර ඇත. • 2020 මැයි 12 වන දින සමාගමට අනුමත කළ ණය පැකේජයට රු. මිලියන 2,055 ක ප්‍රතිලේඛණගත කළ කාලීන ණයක්, රු. මිලියන 240 ක කාලීන ණයක්, තවත් රු. මිලියන 318 ක ප්‍රතිලේඛණගත කළ ණයක් සහ රු. මිලියන 500 ක අයිරා පහසුකමක් ඇතුළත් වේ .2020 සහ 2021 වර්ෂ තුළදී සියලුම පහසුකම් අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත . • නිෂ්පාදන බලපත්‍රය අලුත් නොකිරීම	ඇගයීම් සිදු කර ඇති බව සහතික කිරීමට නිර්දේශ කෙරේ	ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය dryer tube bundle (යන්ත්‍ර සූත්‍රවල කොටසක්) ආනයනය කිරීම සඳහා එක් වරක් සහ සියලු පදනම මත රුපියල් මිලියන 110 ක ණය සීමාවේ නැවුම් ණයවර ලිපියක්/ බිල්පත් ප්‍රතිග්‍රහනය ලබා දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. (කුකුල් කර්මාන්තය සඳහා කුකුල් මස් / සත්ව ආහාර ලෙස විකිණීමට අපේක්ෂා කරන එතනෝල් නිස්සාරණ ක්‍රියාවලියේ (මඩ) නිෂ්පාදනයෙන් දියර කුඩු බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය යන්ත්‍රයේ කොටසක්). සමාගමේ ව්‍යාපාරික පිබිදීම සැලකිල්ලට ගනිමින් මෙම පහසුකම අනුමත කර ඇති අතර නව යන්ත්‍ර කොටසක් ආනයනය කර කල්කුඩා කර්මාන්ත ශාලාවේ සවි කරන තෙක් මාස 4ක සහන කාලයක් සහිතව ස්ථිර ප්‍රාග්ධන ගෙවීමේ ක්‍රමයට ආපසු ගෙවීම ව්‍යුහගත කර ඇත.

හේතුවෙන් සමාගමේ ව්‍යාපාරය 2020 ඔක්තෝබර් මාසයේ සිට අත්හිටුවා ඇත. මේ වන විට සුරාබදු දෙපාර්තමේන්තුව විසින් කල්කුඩා කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා එතනෝල් බලපත්‍රය නිකුත් කර ඇති අතර වැලිසර කර්මාන්ත ශාලාවේ එතනෝල් මිශ්‍ර කිරීම නැවත ආරම්භ කිරීම සඳහා මිශ්‍ර කිරීමේ බලපත්‍රය නිකුත් කර ඇති අතර 2022 සැප්තැම්බර් 02 වන දින මිශ්‍ර කිරීමේ නිෂ්පාදනය දැනටමත් ආරම්භ කර ඇත.

- 2017/2018 විගණක වාර්තාවට අනුව, සමාගමේ අඛණ්ඩ අලාභ හා සෘණ ශුද්ධ වත්කම් තත්ත්වය හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම සැක සහිතය. කෙසේ වෙතත්, බැංකුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටලුව සැලකිල්ලට නොගෙන අඛණ්ඩව ණය ප්‍රදානය කර ඇත.

- 2021 දෙසැම්බර් 31 දිනට ගනුදෙනුකරුගේ මුළු හිඟ ශේෂය රු. මිලියන 3,417 කි. මුළු හිඟ මුදල්වලින්, රු. මිලියන 858.6 ක් හෙවත් සියයට 25 ක් වැලිසර, කොළඹ පාර, අංක 309 හි පිහිටි ප්‍රති ලේඛනගත කිරීමේ පහසුකම් 2023 ජූනි මස ලබා දෙන ලදී. කෙසේ වෙතත්, අයහපත් කාලගුණික තත්ත්වයන් සහ පාරිභෝගිකයා විසින් පැහැදිලි කරන ලද විවිධ හේතු නිසා යන්ත්‍රය පැමිණීම සහ කර්මාන්තශාලා පරිශ්‍රයට සවි කිරීම අනපේක්ෂිත ලෙස ප්‍රමාද විය. Dryer tube bundle 2024 පෙබරවාරි සිට ක්‍රියාත්මක වේ. දැනට අතුරු නිෂ්පාදන කුකුළු කර්මාන්තයට විකුණනු ලැබේ. කෙසේ වෙතත්, අපේක්ෂා කළ පරිදි එතනෝල් නිෂ්පාදනය අඛණ්ඩ පදනමින් ක්‍රියාත්මක නොවේ.

සමාගම විසින් පැහැදිලි කරන ලද පරිදි ඔවුන් ඩබ්එම්එම්සී හි බෙදාහැරීමේ හස්තය ලෙස සහෝදර සමාගම් වන Walt & Row Associates සහ Business Process Management Pvt Ltd විසින් සංවර්ධනය කරන ලද ඉදිරි ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සමඟින් බෝතල් කිරීමේ ක්‍රියාවලිය

උකස් දේපලට එරෙහිව පමණක් සුරක්ෂිත කර ඇත. ඉතිරි රු. මිලියන 2,558 ක් හෙවත් සියයට 75 ක් ණය ගැතියන් මත ඇති උකසට සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ ඒකාබද්ධ සහ තනි ඇපකරවලට එරෙහිව පමණක් සුරක්ෂිත කර ඇත.

ක්‍රමයෙන් වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටිති. පවතින ණය ප්‍රතිලේඛනගත කිරීමෙන් පසු බැංකුවට ඉදිරිපත් කරන ලද පුරෝකථනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට කුකුල් මස් කර්මාන්තයට කුකුළු ආහාර විකිණීම සහ එතනෝල් පිටස්තර පාර්ශවයන්ට විකිණීම යන ප්‍රධාන ආදායම් මාර්ග දෙකම සමාගම සලකා බැලුවද, මේ දක්වා එය ක්‍රියාත්මක වී නොමැත. එබැවින්, ප්‍රතිලේඛනගත ණය ක්‍රමවත්ව ක්‍රියාත්මක වී නොමැත. කෙසේ වෙතත්, සමාගම ඔවුන්ගේ ආදායම වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර දළ වශයෙන් 80% කට වැඩි මුදල් ප්‍රවාහයක් මේ වන විට ලංකා බැංකුව හරහා යොමු කර ඇත. සමාගමට 2022 සැප්තැම්බර් සිට මේ දක්වා ඔවුන්ගේ මාසික මුදල් ප්‍රවාහය ශුන්‍යයේ සිට රුපියල් මිලියන 660 දක්වා ඉහළ නැංවිය හැකිය. පසුගිය මාස හය ඇතුළත රුපියල්

මිලියන 660.0 ක මාසික සාමාන්‍ය මුදල් ප්‍රවාහයක් අපගේ ගිනුම් වෙත යොමු කරනු ලැබුවද, ව්‍යාපාරය කරගෙන යාම සඳහා මත්පැන් බලපත්‍රය බාධාවකින් තොරව සුරක්ෂිත කර ගැනීම සඳහා ගෙවීම්වලින් 55% කට වඩා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදන බදු සහ අයිආර්ඩී ගෙවීම් සඳහා භාවිතා කර ඇත. එබැවින්, ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයට දැනට අරමුදල් සපයනු ලබන්නේ ඔවුන්ගේ ව්‍යාපාරික මුදල් ප්‍රවාහයන් හරහා බැවින්, ඒවා විකිණීම සැලකිය යුතු මට්ටමකට ගෙන එන තෙක් ප්‍රතිලේඛනගත ණය සඳහා අවම කොටස අයකර ගැනීමට පමණක් සමාගම ඉල්ලා සිටියේය. අපගේ ගිනුම් හරහා ලැබෙන විකුණුම් ආදායමෙන් සමාගම විසින් 2024 පෙබරවාරි වන විට රුපියල් මිලියන 110 ක එක් වරක් සහ සියලු පදනම මත වූ ණය පහසුකම පියවා ඇත.

දැනට, අපි මසකට රුපියල් මිලියන 45.0 - 47.0 (ණය සඳහා

				මාසික අවශ්‍යතාවය - රුපියල් මිලියන 60) අයකර ගනිමින් සිටින අතර 2024 දෙසැම්බර් වන විට පියවා ගැනීමට අවශ්‍ය මට්ටම දක්වා ඉහළ නැංවීමට සමාගම එකඟ විය.
(ඇ)	2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා පසුගිය වර්ෂ 5 තුළ ශ්‍රී ලංකා රජයට සහ රජය සතු ව්‍යවසායන්වලට (SOEs) අයිති ණය හා අත්තිකාරම්වල මුළු හිඟ ශේෂය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. මුළු ණය හා අත්තිකාරම්වලින් රජය සතු ව්‍යවසායන්වල හිඟ ශේෂය වැඩි වීමේ ප්‍රවණතාවය 2019 සිට 2022 කාලය තුළ සියයට 36.53 සිට සියයට 45.67 දක්වා පැවතුණි. රජය සතු ව්‍යවසායන්වලට අයත් ශේෂ පත්‍රයෙන් පිටත වට්නාකම් (ණයවර ලිපි, ප්‍රතිග්‍රහණයන් සහ බැංකු ඇපවීම්) 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 197,087 ක් වූ අතර, එම ශේෂයද ඇතුළත්ව රජය සතු ව්‍යවසායන් සඳහා මුළු වට්නාකම (Exposure) රු.මිලියන 2,385,602 ක් ලෙස වාර්තා විය. එය බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 62.72 ක් නියෝජනය කරයි.	2022	ශ්‍රී ලංකා රජය සහ රජය සතු ව්‍යවසායන් (SOEs) යන දෙකම ‘‘රජය’’ ලෙස එකම අවදානම් වර්ගීකරණයේ ඇති බැවින් ඒවායේ අයවීම් සමීපව නිරීක්ෂණය කිරීමට නිර්දේශ කෙරේ .	කරුණාකර අදහස් සඳහා ඇමුණුම I බලන්න.
(ඉ)	2022 දෙසැම්බර් 31 දිනට රජය සතු ව්‍යවසායන් තුළ (ශ්‍රී ලංකා රජය ඇතුළුව)	2022	ණය අවදානම අඩු කිරීම සඳහා අයවීම් පසු	2024.06.30 දිනට ඉහළම SOEs 10 හි ණය ප්‍රමාණය (සෘජු

ඉහළ හිඟ ශේෂ 10 හි සමස්ත එකතුව රු. මිලියන 1, 026, 996 ක් ලෙස වාර්තා වූ අතර, ඒ තුළ හිඟ ප්‍රාග්ධන ශේෂය රු, මිලියන 1,003,725 ක් සහ හිඟ පොලිය රු, මිලියන 23,271, ක් ඇතුළත් වේ. මෙය රජය සතු ව්‍යවසායන් වලට අයත් (ශ්‍රී ලංකා රජය ඇතුළත්ව) මුළු හිඟ ණය හා අත්තිකාරම් ශේෂයෙන් සියයට 96.31 ක් නියෝජනය කරයි. එබැවින්, ඉහළම ගණුදෙනුකරුවන් 10 හි ප්‍රධාන රඳාපැවතීම පහත පරිදි නිරීක්ෂණය විය.

ආයතනය	දිනට හිඟ 2022.12.31 ශේෂය (රු(මිලියන.	ඇපකරය	ඇපකරයේ වටිනාකම
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	575,958	විදේශ ව්‍යවහාර මුදලේ ඩොලර් ශේෂය මත සියයට හා 100 ආන්තිකයක්	එ.ජ.ඩො. මිලියන 700.
			එ.ජ.ඩො. මිලියන 400.
			එ.ජ.ඩො. මිලියන 750 .
මාර්ග සංවර්ධන අධිකාරිය	143,350	භාණ්ඩාගාර ඇපකරය	රු.මිලියන 149,164 .
ශ්‍රී ලංකා රජය	115,502	ණය ගිවිසුම	-
ශ්‍රී ලංකන් එයාර් ලයින්ස්	71,473	සහන ලිපිය	රු.මිලියන 49,190 .
		ශ්‍රී ලංකා කේටරින් ලිමිටඩ් හි කොටස් උකසට තැබීම	රු.මිලියන 67,499
ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	51,363	ඉතිරි කිරීමේ ගිණුම් හා ස්ථාවර තැන්පතු	රු.මිලියන 166,822
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	18,297	සහන ලිපිය	රු.මිලියන 24,000
ලංකා විදුලිබල මණ්ඩලය	17,241	භාණ්ඩාගාර ඇපකරය	රු.මිලියන 5,000
		කල්බදු විකුණුම් ඇටවීම	
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	12,284	අයවැය ප්‍රතිපාදන මත මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කළ , සහන ලිපි	රු.මිලියන 5,876
		ඖෂධ සහ බිම්පිරිපැවිශා කිරීමේ / ලේඛන	
ශ්‍රී ලංකා ටෙලිකොම්	11,651		
වී අලෙවි මණ්ඩලය	9,246	භාණ්ඩාගාර වගකීම	
		භාණ්ඩාගාර ඇපකරය	රු.මිලියන 500,000
එකතුව	1,026,995		

විපරම් කිරීමටත් , සුදුසු සීමාවන් පවත්වා ගැනීමටත් නිර්දේශ කෙරේ .

සහ වක්‍ර) පහත පරිදි වේ:

(රුපියල් මිලියන)

	පාරිභෝගික නම	30.06.2024 දිනට ණය ප්‍රමාණය
1	ශ්‍රී ලංකා රජය	487,199.73
2	මාර්ග සංවර්ධන අධිකාරිය	119,627.46
3	ශ්‍රී ලංකන් එයාර් ලයින්ස්	69,326.36
4	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	56,294.75
5	ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	42,703.43
6	ශ්‍රී ලංකා වරාය අධිකාරිය	41,715.65
7	රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC)	22,091.46
8	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	19,231.30
9	ලංකා විදුලිබල මණ්ඩලය	14,739.24
10	ශ්‍රී ලංකා ගුවන් හමුදාපති	11,183.90

එස්එල්ඒඑල් (SLAL)

එස්එල්ඒඑල් (SLAL) විසින් පොලී ගෙවීම ආරම්භ කර ඇති අතර පහසුකම්වල සැලකිය යුතු කොටසක් භාණ්ඩාගාර ඇපකර/භාණ්ඩාගාර සහන ලිපි මත සුරක්ෂිත කර ඇත.

ලංකා බැංකුවේ වගකීම් ඩොලර් මිලියන 105 ක්

සහ රුපියල් බිලියන 12.9 ක් ශ්‍රී ලංකා රජයට පැවරීමට 2024.03.04 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ගනු ලැබුවේ ය. කෙසේ වෙතත්, ඒ සම්බන්ධයෙන් බැංකුවට නිල සන්නිවේදනයක් ලැබී නොමැත.

2024.02.14, 2024.04.15, 2024.06.03 සහ 2024.09.18 යන දිනයන්හිදී රජයේ භාණ්ඩාගාරය වෙත හිමිකම් පෑම් ඉදිරිපත් කරන ලදී. සියලුම ණය ආපසු ගෙවීම 2024.12.31 දක්වා හෝ ප්‍රතිලේඛනගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වන තෙක් අත්හිටුවන ලදී. 2024.08.22 සහ 2024.09.10 යන දිනවලදී මහා භාණ්ඩාගාරය වෙත ලිපි යවා ඇති අතර, දැනටමත් ඉදිරිපත් කර ඇති හිමිකම් පෑම් පියවීමට හෝ නොඑසේ නම් දීර්ඝ කල සහන ලිපිය සහ භාණ්ඩාගාර ඇපකරය ලබා දෙන ලෙස ඉල්ලා ඇත.

ජීඕඑස්එල්(GOSL) සහ එස්ඕඊ (SOE) සඳහා වූ ණය ප්‍රමාණය අඩු කිරීමට බැංකුව සෑම උත්සාහයක්ම ගනු ඇත. CPC, CEB, Lanka Coal වැනි

ව්‍යාපාරික SOEs ඔවුන්ගේ ව්‍යාපාර මුදල් ප්‍රවාහය මත පදනම්ව මූල්‍යකරණය කරනු ලැබේ.

තවද, SOE සඳහා ලබා දී ඇති කාලීන ණය පහසුකම් ලබා දෙන අවස්ථාවේදී එකඟ වූ ආපසු ගෙවීමේ සැලැස්ම මත පදනම්ව ක්‍රමානුකූලව පියවනු ලැබේ.

ශ්‍රී ලංකා රජය

2023 අයවැය යෝජනා අංක 42.1 අනුව, භාණ්ඩාගාර ලේකම් 2023.02.14 දිනැති ලිපිය මගින් බැංකුවට දන්වා ඇත්තේ CPC හි සහතික කළ විදේශ විනිමය ණය ලෙස ශ්‍රී ලංකා රජය විසින් දැනටමත් 2022.12.31 දිනට ඩොලර් මිලියන 1,341.19 (31.03.2023 දිනට රුපියල් බිලියන 488) BOC වෙත පවරාගෙන ඇති බවයි.

Lazard (GOSL හි උපදේශක), මුදල් අමාත්‍යාංශයේ (MOF) සහ CBSL සමඟ සාකච්ඡා, රැස්වීම්, කේවල් කිරීම් වලින් පසු, බැංකුවට 2024.06.04 සහ 2024.06.07 දිනැති ලිපි මගින් ST විසින් නවතම ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවක් ලැබුණු අතර

2024.06.06 දිනැති ලිපිය සඳහා 2024.07.29 දිනැති වැඩ බලන GM ගේ ලිපිය මගින් අපගේ පිළිතුරු පැහැදිලි කිරීම් සහ එම යෝජනාව සඳහා කැමැත්ත පළ කර ඇත.

2024.08.27 දින පැවති කැබිනට් අමාත්‍යවරුන්ගේ රැස්වීමේදී (BOC සහ PB යන දෙකටම) පුනරාවර්තන වියදම් සඳහා රුපියල් බිලියන 130ක් ලබා දීම සඳහා පාර්ලිමේන්තු යෝජනාවක් ඉදිරිපත් කිරීමට යටත්ව අවසන් කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනාවට අනුමැතිය ලබා දෙන ලදී. තවද, ණය ගිවිසුම් කෙටුම්පත 2024.09.11 දින මහා භාණ්ඩාගාරය විසින් හුවමාරු කර ගන්නා ලද අතර බැංකුවේ අදහස්/අපේක්ෂිත සංශෝධන ආදිය සමඟ එය GOSL සමඟ හුවමාරු කර ගන්නා ලදී.

තවද, 2024.09.18 දින පැවති ඔවුන්ගේ රැස්වීමේදී 2024.06.04 සහ 2024.06.07 දිනැති ලිපි මගින් ST විසින් බෙදාගත් ප්‍රතිව්‍යුහගත ණය පහසුකම් සඳහා 2024.09.13 දින ණය කමිටුවේ නිර්දේශය

				සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය, අනුමැතිය ලබා ගන්නා ලදී. **ශ්‍රී ලංකා ටෙලිකොම්** ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී යනු ලාභ ඉපැයීම සඳහා ව්‍යාපාරය සාර්ථකව කළමනාකරණය කරන පොදු ලැයිස්තුගත සමාගමකි. එබැවින් සමාගමේ ලාභදායීතාවය සහ මූල්‍ය තත්ත්වය පිළිගත හැකිය. මෙම පාරිභෝගිකයා රජයෙන් යැපීම ඉතා අඩුය.
(ඊ)	2022 දෙසැම්බර් 31 දිනට, ඉහළම අක්‍රීය ණය 10 හි සමස්ත හිඟ ශේෂය, ප්‍රාග්ධනය රු .මිලියන 27,781.85 ක් සහ පොලිය රු. මිලියන 6,001.7 ක් ඇතුළත්ව රු. මිලියන 33,783.63 ක් විය. එය 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු අක්‍රීය ණය හා අත්තිකාරම් වලින් සියයට 28.50 ක් නියෝජනය කරන අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 57.5 ක වැඩි වීමක් නිරූපනයකරයි. කේ.ඩී.ර්බට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අනුදාන් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, රුහුණු ඩිවොලොප්මන්ට් කන්ට්‍රක්ටර්ස් ඇන්ඩ්	2022	අයකිරීම් පසුවිපරම් කිරීම සහ අනාගතයේදී ණය ලබාදීමට පෙර ණයකරු ඇගයීම් තහවුරු කිරීමට නිර්දේශ කෙරේ.	**ශ්‍රී ඉක්විප්මන්ට් ෆයිනැන්ස් ලිමිටඩ්** SIFL සහ SEFL පරිපාලකගේ CoC රැස්වීමේදී යෝජිත විභේදන සැලසුම් වලට ඡන්දය දෙන ලෙස ඉල්ලා සිටියේය. ඉහත අනාගත ගැනුම්කරුවන් තිදෙනෙකුගෙන් ලැබුණු මූල්‍ය යෝජනාව සහ ණය දෙන්නන් අනුව බෙදාහැරීමේ සැලැස්ම කෙටුම්පත් කිරීමෙන් පසු, අනෙකුත් කෙටුම්පත් යෝජනා සැලසුම් තුනෙන් සීමාසහිත ජාතික වත්කම් සැසඳීමේ සමාගම (NARCL) වෙතින් ලැබුණු යෝජනා කෙටුම්පත

ඉන්ජිනියරින්, (ප්‍රයිවට්) ලිමිටඩ්, සින්ටෙසි ලිමිටඩ්, ඩබ්ලිව්.එම්.මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්, ශ්‍රී ඉක්විප්මන්ට් ෆයිනෑන්ස් ලිමිටඩ්, අල්මාර් ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් පිළිවෙලින් 2018, 2019, 2020, 2021 හා 2022 වර්ෂවල බැංකුවේ ඉහළම අක්‍රිය ණය අත්තිකාරම් ගණුදෙනුකරුවන් 10 ලැයිස්තුවෙහි අඛණ්ඩව ශ්‍රේණිගත විය. තවද, ලාෆ්ස් ගෑස් පී.එල්. දේශිකා එම්බ්‍රොයිඩර් සොලුයුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් බැංකුවේ, ඉහළම අක්‍රිය අත්තිකාරම් ගණුදෙනුකරුවන් 10 දෙනා අතරට 2022.12.31 දිනට අලුතින්ම ලැයිස්තු ගත විය.

අංකය	ණය කරුගේ නම	2022.12.31 දිනට මුළු ණය ශේෂය (රු.මිලියන)
1	ශ්‍රී ඉක්විප්මන්ට් ෆයිනෑන්ස් ලිමිටඩ්	6,079.78
2	සින්ටෙසි ලිමිටඩ්	4,222.82
3	ජේ.ඩී.ටීඑම් ඇන්ඩ් සන්ස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	3,919.34
4	දෙලියා ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්	3,505.80
5	ඩබ්ලිව්.එම්.මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්	3,406.34
6	ලාෆ්ස් ගෑස් පීඑල්සී	3,172.84
7	අල්මාර් ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්	2,667.30
8	අතුකෝන් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,	2,614.04
9	දේශිකා එම්බ්‍රොයිඩර් සොලුයුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්	2,338.63
10	රුහුණු ඩිවෙලොප්මන්ට් කන්ට්‍රැක්ටර්ස් ඇන්ඩ් ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්	1,856.74
	එකතුව	33,783.63

සඳහා ඡන්දය දීමට BOC අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත්තේය.

සියලුම ණය දෙන්නන් ඡන්දය දුන් අතර අනුමත විභේදන සැලැස්ම ලෙස සීමාසහිත ජාතික වත්කම් නැවත සලකා බැලීමේ සමාගම (NARCL) තෝරා ගන්නා ලදී.

RBI අනුමත බෙදාහැරීමේ සැලැස්මට අනුව, ලංකා බැංකුව Assent Security ECB (බාහිර වාණිජ ණය ගැනීම්) ණය දෙන්නන් කාණ්ඩයට අයත් වේ.

CIRP ක්‍රියාවලියට අනුව USD මිලියන 2.35 ක් අයකර ගන්නා ලදී.

ශේෂ විභේදන සැලැස්ම පහත දැක්වෙන පරිදි වේ.

විකල්ප පරිවර්තනය කළ හැකි ණයකර (OCD) නිකුත් කර ඇත- INR 349.7 M (USD මිලියන 4.19)

හිමිකම් කොටස්

INR මිලියන 11.3 (USD මිලියන 0.13)

ලැබිය යුතු මුළු මුදල USD මිලියන 4.66

ඉන්දියානු සංචිත

බැංකුවේ (RBI) / ණය හිමියන්ගේ කමිටුවේ (COC) රැස්වීම්වලට සහ ලංකා බැංකුව වෙනුවෙන් ලංකා බැංකුව - අක්වෙරළ බැංකු අංශය නියෝජනය කරමින් වෙනත් අදාළ කරුණුවලට සහභාගි වීමට බලයලත් නියෝජිතයකු ලෙස ජ්‍යෙෂ්ඨ උප සභාපති ක්‍රෙඩිට් (චෙන්නායි ශාඛාව) S රාමනුජම් මහතා පත් කිරීමට අධ්‍යක්ෂවරු තීරණය කර ඇත.

සින්ටෙසි ලිමිටඩ්:

දැනටමත් ආරම්භ කර ඇති නීතිමය ක්‍රියාමාර්ග දිගටම කරගෙන යනු ලැබේ. පහත සඳහන් නඩු පවරා ඇත:

CHC 151/2022/MR - මීළඟ විභාග කරන දිනය - 07.03.2024 දින කැඳවීමට නියමිතය. (steps and moved)

CHC 153/2022/MR – මීළඟ විභාග කරන දිනය - 16.10.2024

CHC152/2022MR - මීළඟ විභාග කරන දිනය – 27.01.2025

උකසට තබා ඇති දේපලවලට එරෙහිව ක්‍රියාත්මක කරන ලද වෙන්දේසියේ ආදායම සඳහා නීති

දෙපාර්තමේන්තුව විසින් වෙන්කර ගැනීමේ නියෝගයක් ලබා ගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

කේ.ඩී.ර්බට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

පුනර්ජීවන පාරිභෝගිකයින්ට පහසුකම් ලබා දෙන අතර BRRU මාර්ගෝපදේශයන්ට අනුකූලව පුරෝකථනය කළ හැකි ව්‍යාපාර කාර්ය සාධනය මත පදනම්ව සුදුසු ණය ඇගයීමක් සිදු කරනු ලැබේ.

දොලියාදෝ ඉන්වෙස්ට්මෙන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

ඇපකරුවන්ගෙන් මුදල් අයකර ගැනීම සඳහා බැංකුව විසින් බලාත්මක කිරීමේ නඩුව සිවිල් අධිකරණයට ඉදිරිපත් කර ඇත. බලාත්මක කිරීමේ ක්‍රියාවලිය අතරතුර, BML සහ SBI මැදිහත් වන ලෙස ඉල්ලා සිටියේය. දැන් SBI විසින් **දොලියාදෝ** (Dolhiyadhoo) දූපත සඳහා නව තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර, එම දූපත විකිණීම සඳහා උසාවිය ඉක්මනින්ම රාජසන්තක කිරීමේ නියෝගයක් නිකුත්

කරනු ඇත.

ඉන්දීය රාජ්‍ය බැංකුව (සහකාර උප සභාපති - ණය) පහත පරිදි ඊමේල් මගින් වත්මන් තත්ත්වය යාවත්කාලීන කර ඇත.

අධිකරණ තීන්දුවට අනුව, SBI විසින් වෙන්දේසි දැන්වීම දේශීය පුවත්පතක් වන මිලාරු ("Mihaaru") සහ වෙබ් අඩවියේ 2024.09.03 සිට 15.10.2024 දක්වා ප්‍රකාශයට පත් කරන ලද අතර SBI වෙබ් අඩවියේ දැන්වීම පළ කරන ලදී.

ඩබ්ලිව්.එම්.මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්

ඉහත 3 වන ඡේදයේ පැහැදිලි කර ඇති පරිදි, දැනට අපි මසකට රුපියල් මිලියන 45.0 - 47.0 (ණය සඳහා මාසික අවශ්‍යතාවය - රුපියල් මිලියන 60.0) අයකර ගනිමින් සිටිමු. පවතින පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු, ව්‍යාපාරික මුදල් ප්‍රවාහය අපගේ ගිනුම් හරහා යොමු කර ඇති බැවින්, පවතින පහසුකම් සඳහා 2024.10.13 දිනට ප්‍රාග්ධනය ලෙස රුපියල් මිලියන 75.06ක් සහ පොලිය ලෙස රුපියල් මිලියන

365.0ක් අය කර ගෙන ඇත.

එම්/එස් ලාෆ්ස් ගෑස් පී.එල්.සී

1. රජය විසින් LPG මිල පාලනය කිරීම හේතුවෙන් සමාගමේ ව්‍යාපාරික මුදල් ප්‍රවාහයට බලපෑම් එල්ල විය. එබැවින් 2021 ඔක්තෝම්බර් මාසයේ සිට LPG හි පාරිභෝගික මිල තීරණය කරනු ලබන්නේ වෙළඳපල බලවේග විසින් පමණක් වන අතර බලධාරීන්ගේ නියාමන පාලනයකින් තොරය.
2. දෙවන මාර්ගය සලකා බැලීමට පෙර බැංකුව ව්‍යාපාරික මුදල් ප්‍රවාහයෙන් අක්‍රීය ණය පහසුකම් පියවා දැමීමේ ක්‍රියාවලියක නිරත විය. අවශ්‍ය අතිරේක මුදල් ප්‍රවාහය මාර්ගගත කිරීම මගින් පාරිභෝගිකයා අක්‍රීය ණය පියවීමට ධනාත්මකව අනුගත විය.
3. 2022 වසර අවසානයේදී, සමාගමෙහි අක්‍රීය ණය හිඟය රු.

මිලියන 3,480.36 ක් වන අතර සමාගමට 2024 මැයි වන විට සම්පූර්ණ අක්‍රීය ණය පියවා ගත හැකිය.

පහසුකම් වර්ගය	2022.12.31 දිනට අක්‍රීය ණය හිඟ ශේෂය (ප්‍රාග්ධනය) (රුපියල් මිලියන)	15.05.2024 දිනට අක්‍රීය ණය හිඟ ශේෂය (ප්‍රාග්ධනය) (රුපියල් මිලියන)
ආනයන ණය / බිල්ල්ආර් (BLR)	832.89	නැත
කාලීන ණය	2,634.07	නැත
අයිරා	13.38	නැත
මුලු එකතුව	3,480.36	නැත

4. අද (2024.10.15) වන විට සමාගමේ පවතින සියලුම පහසුකම් ක්‍රමවත් අංශයේ පවතින අතර, හිඟ මුදල් වාර්තා කර නොමැති අතර පියවීම් සතුටුදායක වේ.

5. හිතකර වෙළඳපල තත්ත්වයන් යටතේ, සමාගමට තම නිෂ්පාදන ලාභදායී මිලකට අලෙවි කිරීමට අවස්ථාව ඇති අතර එමගින් එහි ආදායම් උත්පාදනය සහ

ලාභය ශක්තිමත් වනු ඇත. අවසානයේ එය සතුටුදායක ආකාරයෙන් ණය පහසුකම් පියවීම සහතික කරනු ඇත.

6. ණය සම්බන්ධතා කණ්ඩායම සමාගමට ලබා දී ඇති පහසුකම් සහ ඒවා නියමිත වේලාවට පියවීම දැඩි ලෙස නිරීක්ෂණය කරයි.

අල්මාර් ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්

නඩු අංක CHC/21/2024/MR CHC/22/2024/MR සහ CHC/23/2024/MR යටතේ ඩොලර් මිලියන 5.5 ක පහසුකම සඳහා නඩුවක් ගොනු කර ඇත.

2024.12.06 දින නඩු අංක CHC/21/2024/MR සහ CHC/22/2024/MR සඳහා පූර්ව නඩු කැඳවීම.

නඩු අංක CHC/23/2024/MR සඳහා පූර්ව නඩු කැඳවීමේ දිනය 2025.01.27 ලෙස නියම කර ඇත.

අනෙකුත් පහසුකම් සඳහා ඉල්ලීම් ලිපි යවා ඇති අතර, ණය අයකර ගැනීම/මුදල් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග යටතේ නඩු පැවරීම සඳහා නීතිඥයන් පත් කර ඇත.

අනුදාන් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම ජූනි, ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාස සඳහා රුපියල් මිලියන 8.0ක් තැන්පත් කර ඇත (එක් එක් මාසය සඳහා රුපියල් මිලියන 2.0). ටීඕඩී(TOD) පහසුකම පොලී සහනයක් සහිතව සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පත් කර ඇත. සාමාන්‍යාධිකාරීවරයා සමඟ සාකච්ඡා කර දැන් ව්‍යාපාරය නැවත පණ ගැන්වීමේ හැකියාව සොයමින් සිටී. පුනර්ජීවනය කළ නොහැකි නම් බැංකුව පිටවීමේ උපාය මාර්ගය අනුගමනය කරයි.

දේශිකා එම්බ්‍රොයිඩර් සොලූයුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්

පහසුකම 1-5-2024.12.15 න් පසු පරාටේ ක්‍රියාමාර්ග නැවත ආරම්භ කළ

				යුතුයි. පහසුකම 6-8 – මොරටුව දිසා අධිකරණය හි නඩු ගොනු අංක 4319/2024/DMR සහ 4320/2024/DMR පහසුකම 9- වාහනය අත්පත් කර ගන්නා ලදී. පහසුකම 10- කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කර ඇත (පූර්ව නඩු විභාගය) රුහුණු ඩිවොලොප්මන්ට් කන්ට්‍රක්ටර්ස් ඇන්ඩ් ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් පුනර්ජීවන පාරිභෝගිකයින්ට පහසුකම් ලබා දෙන අතර BRRU මාර්ගෝපදේශයන්ට අනුකූලව පුරෝකථනය කළ හැකි ව්‍යාපාර කාර්ය සාධනය මත පදනම්ව සුදුසු ණය ඇගයීමක් සිදු කරනු ලැබේ.
(උ)	2022 වර්ෂය තුළ ණය ප්‍රදානය කළ හා එම වර්ෂයේදීම අක්‍රීය ණය වර්ගීකරණයට මාරුකළ (නැවත උපලේඛණ ගත කළ පහසුකම් හැර) ඉහළම අක්‍රීය ණයකරුවන්ගේ මුළු හිඟ ශේෂය 2022 දෙසැම්බර් 31 දිනට රු මිලියන	2022	නිශ්චිත ණයකරුවන්ට ණය ප්‍රදානය කිරීමට පෙර බැංකුව විසින් ප්‍රමාණවත් ණයකරු ඇගයීම් සිදුකිරීම තහවුරු කිරීමට නිර්දේශ	NPCF ලෙස සැලකෙන පහසුකම් මාසිකව ප්‍රදානය කළ දින සිට පළමු මාස හය ඇතුළත වාර්තා කිරීමට සහ ඇගයීමට යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික කළමනාකරණ කමිටුවේ (CMC)

1,555.66 විය. මෙය 2022 වර්ෂය තුළදී ලබා දුන් හා අක්‍රීය ණය කාණ්ඩයට මාරු කළ (නැවත උපලේඛණ ගත කළ පහසුකම් හැර) ණයවල මුළු හිඟ ශේෂයන් සියයට 73.5 ක් නියෝජනය කරයි.

ණයකරුගේ නම	දිනට 2022.12.31		
	ණය සංඛ්‍යාව	වර්ෂයේ ලබාදුන් 2022 මුළු මුදල (රු.මිලියන	මුළු හිඟ මුදල (රු.මිලියන)
ට්‍රෙන්ඩ් සෙටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	5	951.12	979.79
හයිලෝක පයිලින් (ප්‍රයිවට්) ලිමිටඩ්	10	131.50	138.58
ඒම් ජී කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	4	121.20	137.68
ඇක්සෙන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	12	83.52	95.53
එච්ඇයිපීසී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	6	59.71	63.46
සී.ජේ.ජයතිලක මහතා	1	35.00	39.51
වයඹ ලංකා කොෆෙක් (ප්‍රයිවට්) ලිමිටඩ්	1	27.77	30.84
ඒ.එම්.එස්.ජේ. කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	2	22.96	27.12
ඩී.ඒ.ජයසේකර මහතා.	1	20.50	21.93
එම්.එච්.නිරෝෂන් ප්‍රනාන්දු මහතා	1	19.78	21.22
එකතුව		1,473.06	1,555.66

කරනු ලැබේ .

අනුමැතිය 2022.05.25 දින පැවති ඔවුන්ගේ රැස්වීමේදී ලබාගෙන ඇත.

ඒ අනුව මාසිකව ණය කමිටුවට සංදේශ ඉදිරිපත් කෙරේ.

ශාඛා ගනුදෙනුකරුවන්ගේ ඇගයීම් සහ ප්‍රදානය කිරීම අදාළ ණය අංශ විසින් සිදු කර ඇත. (ශාඛා ණය පරාසය 1, පරාසය 11).

කෙසේ වෙතත්, අක්‍රීය ණය අංශයට මාරු වීමෙන් පසු ඉහත ඉහළම 10 හි සිටින පාරිභෝගිකයින් සඳහා හැකි සෑම නැවත පියවා ගැනීමේ ක්‍රියාමාර්ගයන් සහ ක්‍රියා පටිපාටි අනුගමනය කර ඇත.

ට්‍රෙන්ඩ් සෙටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ට්‍රෙන්ඩ් සෙටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නිමි ඇඳුම් නිෂ්පාදනය සහ අපනයනය කිරීමේ නිරතව සිටී. කොවිඩ්-19 වසංගතයට පෙර මූල්‍ය දුෂ්කරතා යටතේ ව්‍යාපාර කළමනාකරණය කිරීමට සමාගමට හැකි විය.කෙසේ වෙතත්, සාමාන්‍ය ගැනුම්කරුවන්ගෙන් ඔවුන්ගේ අඩුතම කාලය සඳහා ප්‍රමාණවත් ඇණවුම්

ලබා ගැනීමට සමාගමට නොහැකි වී ඇත. එබැවින් සමාගම 2022 ඔක්තෝම්බර් මාසයේ සිට සිය මෙහෙයුම් නවතා දැමුවේය. ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයන් නොමැතිකම හේතුවෙන් සමාගමට බැංකු පහසුකම් කඩිනමින් සේවා සැපයීමට අපොහොසත් වූ අතර 2022.10.30 දින සිට ඉහත ණය පහසුකම් අක්‍රීය ණය අංශයට මාරු කර ඇත.

සමාගමේ නොගෙවූ වගකීම් පියවීම සඳහා බැංකුව සමාගම් නිලධාරීන් සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වීය. මේ අතර, සමාගම දැනටමත් 2024.07.16 දින රුපියල් මිලියන 80 ක් දක්වා සියලුම රුපියල් ණය පහසුකම් පියවා ඇත. එම වර්ෂය තුළම අක්‍රීය ණය වෙත මාරු කරන ලද රුපියල් මිලියන 14.65 ක් වූ එක් ණයක් ඉහත සඳහන් පියවීම මගින් දැනටමත් පියවා ඇත.

ඉතිරි අනෙකුත් පහසුකම් සඳහා බැංකුව දැනටමත් ඉල්ලීම් ලිපි සහ අවසන් නිවේදන යවා ඇත.

නවලෝක පයිලින් (ප්‍රයිවට්) ලිමිටඩ්

2022 වර්ෂය තුළ සමාගම රුපියල් මිලියන 150.0 ක අනුමත ණය පහසුකම් යටතේ පහසුකම් 10 ක් ලබාගෙන ඇත. එම කාල සීමාව තුළ සමාගම විසින් සිදු කරන ලද ව්‍යාපෘතියේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ව්‍යාපෘතියේ ආදායම බැංකුව වෙත පැවරීමෙන් බැංකුව එම පහසුකම් ලබා දී ඇත. රටේ පවතින ආතති තත්ත්වය හේතුවෙන් සමාගමට අයවැය ඇස්තමේන්තුව සමඟ කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට නොහැකි වූ අතර බැංකු පහසුකම් පියවීමට නොහැකි විය. වාණිජ දේපළ සම්බන්ධයෙන් උකස් සුරැකීමට එරෙහිව විෂය පහසුකම් ලබා දී ඇත.

පහසුකම් ආපසු ගෙවීම සඳහා විසඳුමක් සෙවීමට බැංකුව සමාගම සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වූ අතර ඒ සඳහා පිළිගත හැකි විසඳුමකට පැමිණීමට නොහැකි විය. එබැවින්, ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා සියලු පහසුකම් 2024 සැප්තැම්බර් මාසයේදී ආයතනික ණය අය

කර ගැනීමේ දෙපාර්තමේන්තුව වෙත මාරු කර ඇත.

එම් ජී කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

අනුමත බිල්පත් වට්ටම් පහසුකම යටතේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම පහසුකම් සමාගමට ලබා දී ඇත. මාර්ග සංවර්ධන අධිකාරියේ ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් එකඟ වූ කාල සීමාව තුළ එය පියවීමට සමාගමට නොහැකි විය.

පහසුකම් 4 න්, පාරිභෝගිකයා ව්‍යාපාර ආදායම භාවිතා කරමින් පහසුකම් 2 ක් පියවා ඇති අතර අනෙකුත් පහසුකම් දෙක සඳහා කොටසක් පියවීම් කර ඇත. ඉතිරි ප්‍රාග්ධනය රු. මිලියන 49.3 ක් සහ උපචිත පොලිය රුපියල් මිලියන 23 ක් 2024.06.26 දින ප්‍රතිලේඛනගත කර ඇති අතර 2024.10.15 දිනට වාරික 03ක් පාරිභෝගිකයා ගෙවා ඇති අතර හිඟ වාරික නොමැත.

ඇක්සෝන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

තවමත් පුනර්ජීවන ක්‍රියාවලිය යටතේ

පවතින ව්‍යාපාරය පුනර්ජීවනය කිරීම සඳහා 2023.12.27 දින අදාළ නියෝජිත බලධාරින්ගේ අනුමැතිය ඇතිව පුනර්ජීවන පැකේජය ලබා දී ඇත.

එෆ්අයිබීසී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

ගනුදෙනුකරු ක්‍රමවත් අංශයේ සිටියි.

පී.කේ.ජයතිලක මහතා

ණය පහසුකම සම්පූර්ණයෙන්ම පියවා ඇත.

වයඹ ලංකා කොකෝ (ප්‍රයිවට්) ලිමිටඩ්

ණය පහසුකම ප්‍රතිලේඛනගත කර ඇති අතර ගනුදෙනුකරු විසින්ණය පියවමින් සිටියි.

ඒඑම්එස්කේ කන්ස්ට්‍රක්සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

මෙය RDA විසින් මෙහෙයවනු ලබන 100,000Km වැඩසටහන් මාර්ග ව්‍යාපෘතිය සඳහා ලබා දුන් ඉන්වොයිස් වට්ටම් ණයකි. මාස 9කට වැඩි කාලයක් RDA විසින් ඉන්වොයිසි සඳහා ගෙවීම ප්‍රමාද වී ඇති බැවින් ණය අක්‍රීය ණය වෙත මාරු කර

				ඇත. කෙසේ වෙතත්, අරමුදල් ලැබී ඇති අතර ඉහත හඳුනාගත් ණය දැනටමත් පියවා ඇත. **බී.ඒ.ජයසේකර මහතා** කොවිඩ් 19 වසංගත කාලසීමාව තුළ පාරිභෝගිකයාගේ අධ්‍යක්ෂ ගාස්තු ගිනුම වෙත ලැබී නොමැති බැවින් අක්‍රීය ණය වෙත මාරු කරන ලදී. කෙසේ වෙතත්, ගණුදෙණුකරු ඔහුට ලබා දී ඇති සියලුම ණය සම්පූර්ණයෙන්ම පියවා ඇත. **එම්.එෆ්.නිරෝෂන් ප්‍රනාන්දු මහතා** ගනුදෙනුකරු විසින්ණය වාරික පියවමින් සිටියි.
(ඌ)	2006 අංක 6 දරන මූල්‍ය ගණුදෙනු වාර්තා කිරීමේ පනත. එකී රෙගුලාසියට අනුව, සියලුම ව්‍යාපාරික සම්බන්ධතා වලින් පාරිභෝගිකයකු හඳුනාගැනීමට අපොහොසත් වීම හේතුවෙන් 2022 ඔක්තෝබර් 13 දින රු.මිලියන 3 ක දඩයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා තිබුණි.	2022	අදාල රෙගුලාසියට අනුකූල වීම අවශ්‍ය වේ .	• මූල්‍ය බුද්ධි ඒකකය (FIU) වෙතින් නව සම්බාධක ලැයිස්තුව හෝ සම්බාධක ලැයිස්තුවට සංශෝධන පිළිබඳ දැනුම්දීම ලැබීමෙන් පසු, අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් අත් හිටුවීමට නිසි යාන්ත්‍රණය ක්‍රියාත්මක කර ඇත. • නව ගනුදෙනුකරුවන්

ඇතුළත් කර ගැනීමේදී, ඩව් ජෝන්ස් දත්ත සංග්‍රහය භාවිතයෙන් බැංකුවේ ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) හරහා Clari5 පද්ධතිය මඟින් අනුමත කිරීමේ ලැයිස්තුවට එරෙහිව තත්‍ය කාලීන පරීක්ෂණය සිදු කරනු ලැබේ.

- ඕනෑම පාරිභෝගිකයෙකු ඕනෑම වේලාවක පරීක්ෂා කිරීමේ පහසුකම පද්ධතිය තුළ පවතින අතර සියලුම ශාඛා/ව්‍යාපාරික ඒකකවල පරිශීලකයින්ට එවැනි පහසුකමක් ඇත.
- සම්බාධක ලැයිස්තුවේ සෑම යාවත්කාලීන කිරීමකටම පසුව බැංකුව විසින් දැනට පවතින පාරිභෝගික දත්ත ගබඩාව අතින් සහ අර්ධ ස්වයංක්‍රීයව පිරික්සීමක් සිදු කරන අතර හඳුනාගත් සියලුම ව්‍යාපාරික සබඳතා වහා නවතා දමනු ලැබේ.
- ඒ සමගම DMS හරහා හඳුනාගත්

සම්බාධක පාර්ශ්වයන් සඳහා නව ගිණුම් විවෘත කිරීම වැළැක්වීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේ.

- අනුමත ගිණුම් හසුරුවන අදාළ අනුකූලතා කාර්ය මණ්ඩල සාමාජිකයින් හැර අනෙකුත් සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ප්‍රවේශ ක්ෂේත සීමාවන් ක්‍රියාත්මක කිරීම හරහා අනුමත ගිණුම් සහ ඒවායේ CIF වල ප්‍රවේශය සහ වෙනස් කිරීම් සීමා කර ඇත.
- කිසියම් නව සබඳතා ඇති වුවහොත් හඳුනා ගැනීම සඳහා ප්‍රාදේශීය අනුමත කිරීමේ ලැයිස්තුවට එරෙහිව පශ්චාත් සම්බාධක පිරික්සීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේ.
- පසුදින සම්බාධක පාර්ශවයේ ගිණුමක් හරහා සිදුකරන ඕනෑම ගනුදෙනුවක් ග්‍රහණය කර ගැනීම සඳහා විශේෂ ගනුදෙනු අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කර ඇත.

- සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ප්‍රවේශය ලබා ගත හැකි සියලුම අදාළ දේශීය සහ ජාත්‍යන්තර සම්බාධක ලැයිස්තු බැංකුවේ අන්තර් ජාලයට උඩුගත කර ඇත.
- අවශ්‍යතාවය සම්පූර්ණයෙන් සපුරාලීම සඳහා, සියලුම පාරිභෝගික සේවා පද්ධති ඒකාබද්ධ කිරීම සමඟ විස්තීර්ණ AML විසඳුමක් අවශ්‍ය වන අතර බැංකුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේ යෙදී සිටී.
- ඉහත පද්ධති පියවරයන්ට අමතරව, ඉලක්කගත මූල්‍ය සම්බාධක සහ සම්බාධක පිරික්සීම ප්‍රධාන මොඩියුල වන කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා අනුකූලතා දෙපාර්තමේන්තුව භෞතික සහ මාර්ගගත පුහුණු වැඩසටහන් පවත්වයි. ඉලක්කගත මූල්‍ය සම්බාධක සඳහා වන පද්ධති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක බව

				සහතික කිරීම සඳහා අභ්‍යන්තර හා බාහිර විගණනයක් සිදු කරනු ලැබේ.
(එ)	2022 දෙසැම්බර් 31 දිනට, ව්‍යාජ චෙක්පත් හා වංචා ගිණුමේ රු.මිලියන 78.5 ක ශේෂයක් වාර්තා විය. මෙම ප්‍රතිපාදනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ 2022 නොවැම්බර් 11 දින මිය ගිය ගනුදෙනුකරුවකුට අයත් අංක 88380782 දරන ඉතිරි කිරීමේ ගිණුමෙන් රු.මිලියන 65 ක වංචා සහගත මුදල් ආපසු ගැනීමකි. අදාල ගිණුම කිහිපවරක්ම විමර්ශනය කර ඇති අතර එම විමර්ශනයන්ගෙන් බොහොමයක් පුද්ගලික ශාඛාවෙන් සිදු කර ඇත. මුදල් නිලධාරියාගේ මුරපදය භාවිතා කරමින් 2022 සැප්තැම්බර් 12 දින රු.මිලියන 95 ක මුදල් රඳවාතබා ඇති අතර සැකසහිත මුදල් ටෙලර්වරයකුගේ මුරපදයක් භාවිතා කරමින් නව පාස් පොතක් නිකුත් කර යාවත්කාලීන කර ඇත. පාස් පොත් සම්බන්ධ තොග පාලනයන්ගේ අඩපාඩු මෙම වංචා සහගත ක්‍රියාව සඳහා දායක වී තිබුණි. මුදල්	2022	අභ්‍යන්තර පාලන ක්‍රියාපටිපාටිවලට අනුගතවීම හා ඒවාට අනුකූලවීම අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.	ප්‍රකාශිත සිද්ධිය සම්බන්ධයෙන් අභ්‍යන්තර විමර්ශන සිදු කර ඇති අතර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය මගින් පරීක්ෂණ පවත්වයි. ඒ අනුව අදාළ විනය ක්‍රියාමාර්ග බැංකුවේ විනය අධිකාරී මණ්ඩලයේ විමර්ශනවලින් අනතුරුව සිදුකිරීමට නියමිතය. තවද, විමර්ශන දෙපාර්තමේන්තුව විසින් සේවකයින් 26 දෙනෙකු සඳහා විනය ක්‍රියාමාර්ග නිර්දේශ කර ඇති අතර විමර්ශන වාර්තාව හරහා මිලියන 1.0 ට වැඩි ගෙවීම් සඳහා නියෝජිත අධිකාරී සීමාවන් පිළිබඳව සුදුසු තීරණයක් ගැනීමට නිර්දේශ කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණනයේදී හඳුනාගත් පොදු අඩුපාඩු සම්බන්ධයෙන් පළාත් බලධාරීන් දැනුවත් කිරීම. පළාත් මට්ටමින් අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත්

	ටෙලර්වරයෙක් (පුද්ගලික ලිපිගොනු අංක 219338) විසින් පුද්ගලික ශාඛාවේදී රු.මිලියන 65 ක මුදල් ආපසු ගැනීම සිදුවී ඇති අතර, මුදල් ලබාගැනීමේ පෝරමය A පංතියේ හෝ B පංතියේ අත්සන වෙත යොමු කර නොතිබුණි. මුදල් ටෙලර්වරයා ඔහුගේ මුරපදය සහ A පංතියේ නිලධාරියාගේ මුරපදය, අභිබවා යාම සඳහා භාවිතා කර ඇති අතර 116/2006 චක්‍රලේඛයේ අවශ්‍යතාවය පරිදි, මෙම මුදල් ආපසු ගැනීම මව් ශාඛාවට යොමු කිරීමට අපොහොසත් වී තිබුණි. මෙම සිදුවීමට මූලික හේතුව වූයේ මුරපද පාලනය වැනි මූලික පාලනයන් ඇතුළත් දක්වා ඇති ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම වේ.			කිරීමට පහත පියවර ගෙන ඇත • කලාප අභ්‍යන්තර පාලන නිලධාරීන් අධීක්ෂණය කිරීම සඳහා පළාත් මට්ටමින් ශාඛා නියාමන අධීක්ෂණ නිලධාරීන් ලෙස නිලධාරීන් හඳුන්වා දීම. • ශාඛාවේ ශ්‍රේණිය අනුව කලාප අභ්‍යන්තර පාලන නිලධාරීන් ශක්තිමත් කිරීම.
(ඒ)	**අක්‍රීය කාර්යය මණ්ඩල ණය** 2023 අප්‍රේල් 30 දිනට අක්‍රීය කාර්යය මණ්ඩල ණයවල මුළු හිඟ ශේෂය රු.මිලියන 248.6 ක් විය. වයස් විශ්ලේෂණය අනුව, රු.මිලියන 28.7 ක,රු.මිලියන 54.9 ක සහ රු .මිලියන 165 ක කාර්යය මණ්ඩල ණය ශේෂයන් පිළිවෙලින් වසරකට අඩු, වසර එක	2022	අයකර ගැනීමේ ක්‍රියාමාර්ග පසුවිපරම් කිරීම අවශ්‍ය වේ.	නීතිමය ක්‍රියාමාර්ග ඇතුළුව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර 2023 අප්‍රේල් 30 දින සිට බැංකුව අක්‍රීය කාර්ය මණ්ඩල ණය වලින් රුපියල් 42,983,376.84ක් අයකරගෙන ඇත. පහත පරිදි නැවත අය කර ගැනීම් සිදු කර

සිට දෙක දක්වා, වසර දෙකකට වැඩි කාලයක් පුරා අයකර ගැනීමකින් තොරව හිඟව පැවතුණි.

ඇත:

වසරකට වැඩි

රුපියල් 23,495,989.16

වසර දෙකකට වැඩි

රුපියල් 6,047,711.19

වසර තුනකට වැඩි

රුපියල් 13,439,676.49

මුලු එකතුව- රුපියල් 42,983,376.84

(ඔ) 2018සිට 2022 දක්වා ලියා හරින ලද ශේෂයන් හා ලියා හරින ශේෂයන්ගෙන් අයකර ගැනීම් පිළිබඳ විශ්ලේෂණය පහත පරිදි වේ .

වර්ෂය	ලියා හරින ලද වටිනාකම (රු.මිලියන)	අයකර ගත් වටිනාකම (රු.මිලියන)	අයකර ගත් වටිනාකමේ ප්‍රතිශතය (%)
2018	35.5	47.65	134
2019	710.30	36.50	5
2020	5.63	57.03	1,012
2021	73.73	1.66	2
2022	13.61	0.65	5
එකතුව	838.77	143.48	17

- බැංකුවේ පසුගිය වසර **5** සඳහා ලියා හරින ලද සමස්ත වටිනාකම රු.මිලියන **838.77** ක් ලෙස වාර්තා වූ අතර මෙය තුළ **2019** වර්ෂයේදී ටැන්ඩන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිඩට් ට අයත් රු.මිලියන

2022

අයකර ගැනීම් පසුවිපරම් කිරීම අවශ්‍ය වේ.

බැංකුවේ ණය අය කර ගැනීමේ ඒකකය සාකච්ඡා, නඩු පැවරීම් සහ දේපල සාක්ෂාත් කර ගැනීම හරහා NPCF අයකර ගැනීමට සෑම උත්සාහයක්ම ගනී.

සියලුම පියවර අසාර්ථක වුවහොත්, පහත සඳහන් කරුණු වලට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව, කපා හැරීමේ ප්‍රතිපත්තියට අනුව බැංකුව විසින් පහසුකම් කපා හරිනු ඇත.

- ණය ගැනුම්කරුගේ/ ඇපකරුවන්ගේ නම් පෙරනිමි වාර්තා සහ ණය තොරතුරු කාර්යාංශයේ තබා ගත යුතුය.
- මෙම කපා හරින

	616.46 ක ඉහළම ලියාහැරීම් ශේෂය ඇතුළත් විය. - ලියා හරින ලද ශේෂයන්ගෙන් අයකර ගැනීම් 2020 වර්ෂය හැර පසුගිය වර්ෂ 5 තුළ ක්‍රමානුකූලව අඩුවී ඇති අතර ණයපත් මධ්‍යස්ථානයේ හැර ලියා හරින ලද ශේෂයන්ගෙන් අයකර ගැනීම් 2022 වර්ෂයේදී වාර්තා නොවිණි.			ලද ණය ආපසු අයකර ගැනීමට බැංකුව විසින් ගත යුතු සෑම උත්සාහයක්ම ගෙන ඇත. • කපා හැරීම කිසිදු තත්වයක් යටතේ ණය ගැනුම්කරුට හෝ වෙනත් පාර්ශවයකට හෙළි නොකෙරේ.
(ඕ)	බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ (2014) නිර්වචනයට අනුව, සේවා යනු උපදේශන සේවා හැර සේවාවන් වේ. කෙසේ වෙතත්, බැංකුව සඳහා උපදේශන සේවා ප්‍රසම්පාදනය වෙනුවෙන් කිසිදු අභ්‍යන්තර මාර්ගෝපදේශයක් සංවර්ධනය කර නොමැත. එහෙයින්, ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය (NPA) විසින් 2007 නිකුත් කරන ලද උපදේශකයක් තෝරා ගැනීම හා යෙදවීම සඳහා වන මාර්ගෝපදේශය බැංකුව විසින් පිළිපැදිය යුතු වේ. කෙසේ වෙතත්, බැංකුවට අයත් මාර්ගෝපදේශ නොමැති වුවද, බැංකුව එම මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි.	2022	බැංකුව සඳහා මාර්ගෝපදේශය ක් පිළියෙල කිරීම හෝ ජාතික ප්රසම්පාදන නියෝජිත ආයතනයේ මාර්ගෝපදේශ අදාල කර ගැනීම අවශ්‍ය වේ.	උපදේශක තෝරා ගැනීම සඳහා දැනට ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ (NPA) මාර්ගෝපදේශය අදාල කර ගන්නා අතර මූල්‍ය අනුමැතිය සඳහා ලංකා බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතෙහි අධිකාරී මට්ටම් භාවිතා කරයි. එසේම මෙය 2025 වසර සඳහා අලුත් කරන අවස්ථාවේදී ප්‍රසම්පාදන අත්පොතට ඇතුළත් වේ.

යෝජිත ඒකාබද්ධ වීම සැලකිල්ලට ගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව ණය ගැනුම්කරුගේ මූල්‍ය තත්වයන් ඇගයීමට ලක් කර තිබුණි. කෙසේ වෙතත් අයිඩියා මෙටල් සමාගම සහ අයිඩියා ඉන්ඩස්ට්‍රීස් ඒකාබද්ධ කිරීම සනාථ කිරීමට කිසිදු ලේඛනගත සාක්ෂියක් ණය ලිපි ගොනුව තුල නොතිබුණි. තවද, අයිඩියා ඉන්ඩස්ට්‍රීස් සඳහා පමණක් ණය ලබා දෙන බැවින් ඒකාබද්ධ සංඛ්‍යා (consolidated figures) මත පදනම්ව ඇගයීම් සිදු කිරීම නිවැරදි නොවේ.

(ඉ) තවද, අයිඩියා ඉන්ඩස්ට්‍රීස්හි රු. මිලියන 2.5 ක ප්‍රකාශිත ප්‍රාග්ධනය හා සසඳන විට අනෙකුත් බැංකු වෙත ගෙවිය යුතු රු. මිලියන 1,115 ක ණය ශේෂය ඉතා අධික වන අතර මෙම කරුණ BECC අංක 239/2021 සීමා පත්‍රිකාව තුල ඇතුළත් ව නොතිබුණි. තවද, අවදානම් අංශය විසින් ආන්තික පොලී සේවා ආවරණ අනුපාතය සහ 3 ට වැඩි තෝලන අනුපාතය පමණක් ඉස්මතු කර තිබුණි.

(ඊ) ඒ අනුව, නැව්ගත කරන ලද භාණ්ඩ සඳහා හිමිකම, අධ්‍යක්ෂවරයාගේ පුද්ගලික ඇපකරය සහ

මසකට රු. මිලියන 1 ක මුදල් ආන්තිකයක් ගොඩනැගීම යන සුරැකුම් මත 2021 මාර්තු 12 දිනැති අංක 239/2021 දරන අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු පත්‍රිකාව හරහා ණයවර ලිපි /ප්‍රතිග්‍රහණයන්/කෙටි කාලීන ණය ඇතුලත් රු. මිලියන 600 ක ණය පැකේජයක් අයිඩියා ඉන්ඩස්ට්‍රීස් වෙත අනුමත කර තිබුණි.

- 2015 ඔක්තෝබර් 07 දිනැති අංක 581/2004 (66) දරන බැංකුවේ ණය පටිපාටි අත්පොතේ 5 වැනි මාතෘකාවේ 9.4.1 පරිච්ඡේදයට අනුව සහ 5 වන මාතෘකාවේ 8.13 පරිච්ඡේදයට අනුව ණය ආපසු ගෙවීමේ හැකියාව සහතික කිරීම සඳහා එක් එක් ඇපකරු සතු වත්කම් ලැයිස්තුවක් ලබා ගත යුතු අතර බැංකුවේ පූර්ව අනුමැතියකින් තොරව එම වත්කම් බැහැර නොකිරීමට ලිඛිත ගිවිසුමක් ලබා ගත යුතුය. කෙසේ වෙතත්, ඇපකරුවන්ගේ මූල්‍ය ශක්‍යතාව ඇගයීම පිළිබඳ විස්තර සහ ඇපකරු සමඟ එවැනි ගිවිසුමක් නොතිබුණි. ඇපකරුගේ වත්කම් පිළිබඳ විස්තර බැංකුව ලබා ගත්තද උකසක්

මඟින් වත්කම් වල නිරවුල් අයිතිය ලබාගෙන නොමැත. එබැවින් ඉහත කී ගිවිසුම වලංගු ලියවිල්ලක් බවට පත් නොවේ.

- 2021 පෙබරවාරි 18 වන දින ආයතනික බැංකු අංශය (CBD-1) විසින් විධායක ණය කමිටුව වෙත ඉදිරිපත් කරන ලද පත්‍රිකාවට අනුව ප්‍රධාන විධායක නිලධාරියා ව්‍යාපාරික වීසා මත ස්ථිර පදිංචිය සඳහා ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වීමට නියමිත බව සඳහන් වූ අතර සහකාර සාමාන්‍යාධිකාරී (අක් වෙරළ සහ ආයතනික බැංකුකරණය – ණය) හි 2023 ජනවාරි 31 දිනැති පරීක්ෂණ වාර්තාවට අනුව ඉහත පුද්ගලයා ඕස්ට්‍රේලියාවේ පදිංචිව බව සඳහන් කර තිබුණි . මේ අනුව, ඔහු ස්ථිර පදිංචිය මත ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වීමට නියමිතව තිබුණද, ප්‍රධාන විධායක නිලධාරියාගේ පුද්ගලික ඇපකරය බැංකුව පිළිගෙන ඇති බව නිරීක්ෂණය විය.
- 2021 මාර්තු 12 දිනැති අංක 239/2021 දරන BECC පත්‍රිකාවේ තීරණයට අනුව, මසකට රු. මිලියන 1

බැගින් ආන්තික ගිණුමක් ගොඩනැගීම සඳහා මාරු කරන ලෙස නිර්දේශ කර ඇතත් 2021 මාර්තු 15 දිනැති පිරිනැමීමේ ලිපියට අනුව, මසකට රු. මිලියන 2ක් මාරු කරන ලෙස බැංකුව ණය ගැනුම්කරුට දන්වා ඇත. කෙසේ වෙතත්, 2021 ඔක්තෝබර් 27 දිනැති අංක 1119/2021 BECC පත්‍රිකාවට අනුව, (ප්‍රදානය කළ දින සිට මාස 6ක් පමණි) මසකට රු. 2,000,000 ක ආන්තික ගිණුමක් ගොඩනැගීමේ අවශ්‍යතාවය විදේශ ණයවර ලිපි පහසුකම් සඳහා ලිහිල් කර තිබුණි. සීමාව රු. මිලියනයක් වුවද,සමාගම විසින් රු.මිලියන 2 ක් තැන්පත් කර ඇත්තේ සමාගමේ යහ චර්යාව (discipline) හේතුවෙන් බව සඳහන් කරමින් ඉහත තීරණය සාධාරණීකරණය කර ඇති අතර බැංකුව විසින් පිරිනැමීමේ ලිපියේ වූ කොන්දේසියක් පිළිබඳව සඳහන් කර නොතිබුණි.

(උ) ණය ගෙවීම පැහැර හැරීම හේතුවෙන් අයිඩියා ඉන්ඩස්ට්‍රීස් ණය පැකේජය

පසුකාලීනව අක්‍රීය කාණ්ඩයට මාරු කර තිබුණි. ඒ අනුව 2023 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 257.2 ක ප්‍රාග්ධන ශේෂයක් සහ රු. මිලියන 58.9 ක පොලී ශේෂයක් වාර්තා වී තිබුණි.

(xvii) ශ්‍රී ලංකා මහ 2023 බැංකුව වෙතින් ලැබිය යුතු ඇ.ඩො මිලියන 29.6 ට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ඇ.ඩො මිලියන 43 ක හුවමාරු ගිවිසුම (swap agreement) පියවීම

අංක 624/2023 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ විස්තර අනුව, 2023 මැයි 02 වන දින කල් පිරෙන ඇමරිකානු ඩොලර් මිලියන 43 ක SWAP නිරවුල් කළ යුතු බවත් අඛණ්ඩව චක්‍රීයකරණය (roll -over) කල නොහැකි බවත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව අප්‍රේල් මාසයේදී දැනුම් දී තිබුණි. ඒ අනුව, 2023 මැයි මස 02 වන දින කල් පිරෙන ඇමෙරිකානු ඩොලර් මිලියන 43 ක swap වටිනාකම වෙනුවෙන් බැංකුව විසින් ගෙවන ලද ශ්‍රී ලංකා මහා බැංකුවේ බිල්පත් (committed bill) ඩොලර් මිලියන 29.6 කින් පියවීමට ද ඉතිරි මුදල වූ ඩොලර් මිලියන

බැංකුවේ පාලනයන් ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.

පවතින තොරතුරු මත භාණ්ඩාගාර ඉදිරි කාර්යාලය (TFO) විසින් පුරෝකථනය කරන ලද ශ්‍රී ලංකා රුපියල් සහ විදේශ මුදල් මුදල් ප්‍රවාහයන් අඛණ්ඩව අධීක්ෂණය කරයි.

තවද, TFO විසින් වරින් වර බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳව වත්කම් හා වගකීම් කමිටුව (ALCO) වෙත යාවත්කාලීන කරයි.

ගනුදෙනු පියවීම පිළිබඳ අවශ්‍ය වෙනස්කම් භාණ්ඩාගාර ප්‍රතිපත්තියට ඇතුළත් කිරීමට බැංකුව අවශ්‍ය පියවර ගන්නා ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලදී.

මේ වන විට බැංකුව ද්‍රවශීලතා හිඟයකට මුහුණ දී නැත.

2024 සැප්තැම්බර් 30 වන විට බැංකුව අන්තර් බැංකු වෙළඳපොලේ ශුද්ධ අතිරික්තය USD මිලියන 109 ක් වාර්තා කර ඇත.

අයවිය යුතු SWAP ගනුදෙනු අනුමත සීමාවන් තුළ ඇත.

13.4 වටිනාකම 2023 මැයි 02 වැනි දින පියවීමටද බැංකුව ඉල්ලා තිබුණි. තවද රුපියල් වටිනාකම දළ පදනම මත ද ඇ.ඩො. ගනුදෙනු ශුද්ධ පදනම මත පියවීමටද බැංකුව විසින් ඉල්ලීම් කර තිබුණි. කෙසේ වෙතත්, ඇ .ඩො (USD) සහ රුපියල් ගනුදෙනු දෙකම SWAP හි far leg රේටය භාවිතා කරමින් ශුද්ධ පදනම මත සමථයකට පත් කර අතර එහි ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුව වෙතින් ලැබිය යුතු ඩොලර් මිලියන 29.6 ට සාපේක්ෂව ඩොලර් මිලියන 43 ක් පියවීම හේතුවෙන් බැංකුවේ ගිණුම්වල රු. මිලියන 1,613.36 ක පාඩුවක් වාර්තා වී තිබුණි. කෙසේ වෙතත්, බැංකුවේ අනුමත භාණ්ඩාගාර ප්‍රතිපත්තිය හෝ - භාණ්ඩාගාර ඉදිරි කාර්යාලය මෙහෙයුම් ක්‍රියා පටිපාටිය මඟින් SWAP ගනුදෙනු පියවන ආකාරය පිළිබඳව ආවරණය කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් පැහැදිලි මාර්ගෝපදේශයක් නොතිබුණි. තවද, ඉහත ගනුදෙනුව සඳහා පූර්ව අනුමැතියක් නොතිබූ අතර, අදාල SWAP එරෙහිව සිදු කරන ලද LC බිල්පත් හිලව් කිරීමට පෙර මහ බැංකුව සමඟ නිසි ගිවිසුමකට පැමිණ නොතිබුණි.

(xviii) ගමනාගමන කාඩ් 2023 පත් (Transit card) සඳහා මහජන බැංකුවේ ආයෝජනය 2018 ඔක්තෝබර් 17 දිනැති අංක 18/1960/808/051 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ගමනාගමන කාඩ්පත් සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික අනුමැතිය ලබා දී තිබුණි. අනතුරුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ලංකා ක්ලියර් සමා (පුද්)ගම විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණික යෝජනාව මත පදනම්ව ගමනාගමන කාඩ්පත් නොමිලේ ලබා දීම සඳහා 2021 පෙබරවාරි 23 දිනැති අංක 21/0125/312/005 දරන තීරණය මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත .බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිලාභ 2 ක් එක් කාඩ් පතකින්(2 in 1) ලැබෙන (හර + ගබඩා කළ අගය) Japan Credit Buro (JCB) ගමනාගමන කාඩ්පත් ව්‍යාපෘතිය සඳහා 2021 මාර්තු 26 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක : 272/2021 මගින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ගමනාගමන කාඩ්පත ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික ප්‍රවාහන කොමිෂන්	බැංකුවට සිදු වූ පාඩුව අයකර ගැනීමට පසු විපරම් ක්‍රියාමාර්ග සහ ඇගයීම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්න.	ව්‍යාපෘතිය අසාර්ථක වූ බැවින්, අපගේ සාමාන්‍ය ව්‍යාපාරයේදී හර කාඩ්පත් නිකුත් කිරීම සඳහා ඉතිරි කාඩ්පත් තොගය භාවිතා කිරීමට බැංකුව කටයුතු කරන ලදීඒ . අනුව2024 අප්‍රේල් 30 වන විට හර කාඩ්පත් 12,964ක් නිකුත් කර ඇත. ඉතිරිකිරීම් සහ ජංගම ගිණුම් ගනුදෙනුකරුවන් සඳහා NCS/JCB ඩෙබිට් කාඩ්පත් නිකුත් කරන්නා ලෙස , කාඩ්පත් නිකුත් කිරීම .සඳහා දරන ලද රු මිලියන55.4 තවමත් භාවිතා කළ හැකිය. NCS/JCB අත්පත් කර ගැනීමේ ව්‍යාපෘතිය සඳහා දරන ලද රු . මිලියන21.7 ක වියදම CBSL මාර්ග සිතියමට අනුව අනිවාර්ය වූවකි . මහජන බැංකුව සහ අනෙකුත් බැංකු විසින් NCS/JCB කාඩ්පත් නිකුත් කිරීමත් සමඟ මෙම ආයෝජනයේ ප්‍රතිඵලය භාවිතයේ පවතී. මහජන බැංකුවට ද නව RFP ක්රියාවලියට සහභාගී විය හැකි අතර	-

සභාව, ලංකා ක්ලියර් සහ මහජන බැංකුව සමඟ සිව්පාර්ශව ගිවිසුමක් 2021 අප්‍රේල් 22 වන දින අත්සන් කර තිබුණි. එම ව්‍යාපෘතියේ ආරම්භක අදියරේදී සියලුම බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍ර ලාභී මූල්‍ය සමාගම් වෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද විවෘත ආරාධනයකට ප්‍රතිචාර වශයෙන් මහජන බැංකුව විසින් රු. මිලියන 93 කට අධික ආයෝජනයක් (වාර්ෂික බලපත්‍ර ගාස්තු, කාඩ්පත් බලපත්‍ර ගාස්තු සහ Lanka Pay සඳහා වන මාසික ගාස්තු යන සියල්ල හැර) සිදු කර තිබුණි.

(අ) 2020 දෙසැම්බර් 30 දිනැති අංක 1312/2020 දරන විධායක මෙහෙයුම් කමිටු පත්‍රිකාවට අනුව, එක් කාඩ්පතක පිරිවැය රු. 250.00 පමණ වන අතර කමිටුවේ අදහස වූයේ පාරිභෝගිකයාගෙන්රු. 200.00 අය කිරීම විචක්ෂණ වන බව හෝ වියදමෙන් 1/3 වන පදනම මත එය බැංකුවෙන්, ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් සහ ලංකා පේ ආයතනයෙන් අය කිරීම වේ. මෙය 2021 ජනවාරි 29 පෙරගෙවුම් කාඩ්පත්, ක්‍රෙඩිට් සහ ඩෙබිට් කාඩ්පත් සහ ලංකා QR යන විකල්ප පිරිනැමිය හැකමේ අනුව ., ආයෝජනය තවමත් භාවිතා කළ හැකි තත්වයක පවතී.

දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 41/2021 මඟින් අනුමත කර තිබුණි. අංක 166/2021 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව, යෝජිත පරිදි ව්‍යාපෘතියේ පිරිවැයෙන් 1/3 ක් බෙදා ගැනීම ප්‍රතික්ෂේප කරමින් ලංකා පේ ආයතනය ප්‍රතිචාර දක්වා ඇති අතර ජාතික ගමනාගමන කොමිෂන් සභාව එයට ප්‍රතිචාර දක්වා නොතිබුණි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය අනුව මහජන බැංකුවට සුවිශේෂී අයිතිය හෝ පිරිවැය බෙදාගැනීමේ විකල්පය තිබිය යුතු බව අධ්‍යක්ෂ මණ්ඩලය අවධාරණය කරන ලදී. කෙසේ වෙතත්, එය සාර්ථක නොවූ අතර රු.300 කට හර කාඩ්පත නිකුත් කිරීමට සහ රු.250 කට ගමනාගමන කාඩ්පත සඳහා ලෙස JCB කාඩ්පත නිකුත් කිරීමට 2021 මාර්තු 26 වන දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී. 2021 පෙබරවාරි 23

දිනැති අංක 21/0125/312/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ගමනාගමන කාඩ්පත නොමිලේ ලබා දීමට අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද බැංකුව එම තීරණය සලකා බලා නොතිබුණි.

(ආ) ලංකා ක්ලියර් (පුද්) සමාගම විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණික යෝජනාව සම්බන්ධයෙන් බැංකුව විසින් ශක්‍යතා තක්සේරු කිරීමක් කල බවට කිසිදු සාක්ෂියක් නොතිබුණි .

(ඇ) යෝජිත ව්‍යාපෘතියේ දුෂ්කරතා ඉස්මතු කරමින් අංක 23/0909/608/060 දරන කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන ලදී. (දැනට පවතින ප්‍රවේශපත්‍ර යන්ත්‍ර හඳුන්වා දුන් JCB කාඩ්පත් භාවිතා කිරීමට නොගැලපීම, JCB කාඩ්පත් මගීන් අතර ජනප්‍රිය නොවීම, නැවත මුදල් ඇතුලත් කර ගැනීම (TOP UP) අපහසුය), තවද කැබිනට් පත්‍රිකාවේ අන්තර්ගතය වැඩිදුර අධ්‍යයනය කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම් හෝ

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකුගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කිරීමටත් සති දෙකක් ඇතුළත නිර්දේශ සහිත සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කිරීමටත් තීරණයක් ගෙන තිබුණි. එම කමිටුව සාමාජිකයින් 9 දෙනෙකුගෙන් සමන්විත වූ අතර 2023 අගෝස්තු 25 දිනැති අංක 23/0909/608/060-I දරන කැබිනට් පත්‍රිකාව හරහා සිය වාර්තාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණි. ඒවා මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සමඟ අමාත්‍ය මණ්ඩල අනුකමිටුව විසින් සලකා බලා තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා ගමනාගමන කොමිෂන් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දැනටමත් ආරම්භ කර ඇති සියලුම පියවර අවලංගු කිරීමටත්, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය විසින් මෙම ව්‍යපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා නව යෝජනා (RFP) කැඳවීමටත්,

කැබිනට් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමටත් ඊට අනුමැතිය ලබා ගැනීමට තීරණය විය. පසුව 2023 සැප්තැම්බර් 11 වන දින පැවති කැබිනට් රැස්වීමේදී ඉහත සඳහන් තීරණය සඳහා කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි.

(ඇ) කමිටුව විසින් නිර්දේශ කර ඇති පරිදි හා 2023 සැප්තැම්බර් 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පත්‍රිකා අංක: NP/CM/COM/TRN/ 2023/11 අනුව සුදුසු සේවා සපයන්නෙකු (මහජන බැංකුව හැර) තෝරා ගැනීම සඳහා යෝජනා කැඳවීමට (RFP) ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට අවසර ලබා දී තිබුණි. එබැවින් ඉහත ව්‍යාපෘතිය සඳහා මහජන බැංකුව දරන ලද වියදම බැංකුවට සම්පූර්ණ පාඩුවක් විය හැකිව තිබේ.

(xix) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙහි(COPE) උපදෙස් වලට අනුගත නොවීම (අ) 2018 ජූලි 17 වන දින පවත්වන ලද කෝප් රැස්වීමේ නියමයන්ට	2023	කෝප් කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශ පිළිපැදීමට සහ බැංකු අරමුදල් නිසි ලෙස භාවිතා කිරීම සහතික කිරීමට අවශ්‍ය	**2019** සැප්තැම්බර් **5** වන දින පැවති කෝප් රැස්වීමෙන් නිකුත් කරන ලද නිර්දේශ බැංකුව විසින් දැනටමත් සිදුකර ඇත. ඉන් අනතුරුව**,** බැංකුව විසින් කෝප් කමිටුව

අනුව, අනෙකුත් රාජ්‍ය බැංකුවලට පූර්වාදර්ශයක් ලබා දෙන පරිදි වයස අවුරුදු 60 ට වැඩි නිලධාරීන්ගේ සේවය දීර්ඝ නොකරන ලෙස කෝප් කමිටුව නියෝග කර තිබුණි ඉහත තීරණය . වන 10 අගෝස්තු 2018 දින බැංකුව වෙත දැනුම් දී තිබුණි. කෙසේ වෙතත්, ඉහත කෝප් රැස්වීමට පෙර එනම් 2018 ජූනි 29 වන දින ලබාගත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පදනම්ව හිටපු සාමාන්‍යාධිකාරී (GM) මාස 6 ක කාලයකට සේවා දිගුවක් සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගෙන තිබුණි. 2019 සැප්තැම්බර් මස 05 වන දින පැවති කෝප් රැස්වීමේදී කමිටුව විසින් ලබා දුන් නියෝගයකට අනුව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් දැඩි අප්‍රසාදය පළ කර තිබූ අතර මාස හයක සේවා දිගුවක් ලබා දීමේ වගකිවයුතු පාර්ශවයන් සඳහා විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, පාඩුව අයකර ගන්නා ලෙසත් උපදෙස් ලබා දී තිබුණි. එහෙත් බැංකුව ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. (ආ) මර්සිඩිස් බෙන්ස්	ක්‍රියාමාර්ග ගන්න.	වෙත නිර්දේශ වලට අදාල ප්‍රගතිය වාර්තා කර ඇති අතර, ඉතිරි කරුණු වූ හිටපු ප්‍රධාන විධායක නිලධාරී/ජීඑම් වසන්ත කුමාර මහතා වෙත භාරදුන් වාහන සම්බන්ධයෙන් 2022 මැයි 04 වැනි දින පැවති 13 වැනි කෝප් කමිටු රැස්වීමේදී සාකච්ඡාවට ගැනිණි. ඒ අනුව එම රැස්වීමේදී CAI - 4646 වාහනය භාරදීම සම්බන්ධයෙන් කමිටුව ප්‍රශ්න කර ඇති අතර ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබාගෙන ඇති බව සඳහන් විය. තවද රාජ්‍ය බැංකුවල වාහන ගැටළු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙන් පොදු මාර්ගෝපදේශයක් නිකුත් කරන ලෙස කමිටුව විසින් නියෝග කර ඇති අතර ඉදිරියේදී මෙවැනි ගනුදෙනු අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත සිදු කළ යුතු බව ද එම කමිටුවේ අදහස විය. කිසියම් සැකයක් ඉතිරි කර නොගැනීම සඳහා, ඉහත රැස්වීම් වාර්තාවේ අදාළ කොටස උපුටා

වාහන අංක CAI - 4646 බැහැර කිරීම 2019 ජූලි 19 දිනැති අංක 487/2019 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව, පහත කරුණු වලට යටත්ව කර්මාන්තයේ පවතින භාවිතය ලෙස සලකා ඉහත වාහනය හිටපු සාමාන්‍යාධිකාරී වෙත මුදා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි.

- භාවිතා කරන ලද අංක KM-9238 දරන වාහනය ආපසු ලබා දීම
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෙන්වන ලද ඔහුට සිදු කළ වැඩිපුර ගෙවීම් පියවා ගැනීම
- වාහනය පොත් වටිනාකමට මුදා හැරීම
- බැංකුවේ වෙනත් කිසිදු හිමිකම් පෑමක් නොමැති බවට හිටපු සාමාන්‍යාධිකාරී ගෙන් තහවුරුවක් භාර ගැනීම

2019 සැප්තැම්බර් මස 05 වන දින පැවති කෝප් රැස්වීමේදී එම වාහනය නැවත බැංකුව වෙත ලබා ගන්නා ලෙස කමිටුව උපදෙස් දී තිබුණි. දක්වා ඇත.

උපුටා ගන්නා ලදී.

"රු මිලියන .16.6 කට මිලදී ගත්)CAI- 4646**)** මර්සිඩීස් බෙන්ස් රථය ඔහුට රු.113,698.63 කට ලබා දීම සහ ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ විශේෂ අනුමැතියක් තිබුණේද යන්න කමිටුව ප්‍රශ්න කරන ලදී.

විශ්‍රාම යන සාමාන්‍යාධිකාරීවරයාට **(GM)** තම නිල වාහනය රැගෙන යා හැකි බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අනුව වාහනය ලබා දී ඇති බව **AO** ප්‍රකාශ කළේය. ඒ පිළිබඳව සොයා බලා රාජ්‍ය බැංකුවල වාහන ගැටළු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙන් පොදු මාර්ගෝපදේශයක් නිකුත් කරන ලෙස කමිටුව ප්‍රධාන ගණන් දීමේ නිලධාරීවරයාට නියෝග කළේය. කමිටුවේ අදහස වූයේ මෙවැනි ගනුදෙනු ඉදිරියේදී කැබිනට් අනුමැතියකින් සිදු කළ යුතු බවයි. "උපුටා ගැනීම අවසන්.

කෙසේ වෙතත්,

- 2020 ජුනි 11 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක : 470/2020 අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාහනය නිදහස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක: 487/2019 අනුව කටයුතු කර අනුමැතිය දී තිබූ නමුත් කෝප් කමිටුව විසින් ලබා දී ඇති උපදෙස් වලට පටහැනි විය. 89/2016 දරන බැංකුවේ ප්‍රවාහන ප්‍රතිපත්තියේ 15-A ඡේදය අනුව, වසර 7 ක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආයතනික කළමනාකරණ සාමාජිකයා භාවිතා කළ වාහනය රැගෙන යාමට අවසර දී ඇතත්, කොන්ත්‍රාත් පදනම මත සේවය කළ හිටපු සාමාන්‍යාධිකාරීව රයාට වාහනය රැගෙන යාමට සුදුසුකම් නොතිබුණි. තවද, එවැනි කොන්දේසියක් කොන්ත්‍රාත්

ඉහත උපදෙස් වලට ප්‍රතිචාර වශයෙන්, රාජ්‍ය බැංකුවල වාහන ගැටළු සම්බන්ධයෙන් පොදු මාර්ගෝපදේශයක් සැකසීමේදී බැංකුව විසින් පහත සඳහන් ලියකියවිලි පරීක්‍ෂා කිරීම සහ සලකා බැලීම සඳහා 2022 ජූනි 10 වැනි දින භාණ්ඩාගාරයේ මුදල් - ශයේ ලේකම් අමාත්‍යාං වෙත ඉදිරිපත් කරන .ලදී

(i) 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ විධිවිධානවලින් සහ සියලුම භාණ්ඩාගාර සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලින් බැංකු දෙකම නිදහස් කර ඇති ලංකා බැංකුව සහ මහජන බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ රජයේ තීරණය

(ii) ආයතනික කළමනාකරණ සාමාජිකයින් සඳහා ප්‍රවාහන ප්‍රතිපත්තිය- BP අංක 723/2019.

ගිවිසුමේද ඇතුළත් වී නොතිබුණි. දැනට පවතින තොරතුරු වලට අනුව ඉහත සඳහන් වාහනය 2015 අප්‍රේල් 27 වන දින රු. මිලියන 16.6 ක වියදමින් මිලදී ගෙන ඇති අතර 2021 ජූලි 20 වන දින රු. 113,698 ක පොත් වටිනාකමකට හිටපු සාමාන්‍යාධිකාරීව රයා වෙත ලබා දී තිබුණි.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවධාරණය කරන ලද පරිදි රු. මිලියන 3.3 ක වැඩිපුර ගෙවීම් පියවීමට යටත්ව ඉහත වාහනය හිටපු සාමාන්‍යාධිකාරීව රයා වෙත මුදා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ඉහත අයකර ගැනීම් සඳහා බැංකුව විසින් පියවර ගෙන නොතිබුණි.

3.4 ජාතික ඉතිරිකිරීමේ බැංකුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පසු ලාභය (අලාභය) රු.	මතය
2021	1,579,097,748,000	1,503,084,991,000	76,012,757,000	22,119,624,000	තත්ත්වාගණනය නොකළ
2022	1,616,686,128,000	1,543,793,899,000	72,892,229,000	2,529,667,000	තත්ත්වාගණනයනො කළ
2023	1,686,964,592,000	1,605,590,339,000	81,374,253,000	7,216,483,000	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	මුල්‍ය ප්‍රකාශන අතින් පිළියෙල කිරීම පිළිබඳ අර්ථකථනයේදී ඉහල අවදානමක් ඇත .ප්‍රධාන කාර්යාල ශේෂ පිරික්සුමක් සහ ශාඛා ශේෂ පිරික්සුමක් වශයෙන් වෙනම ප්‍රධාන ශේෂ පිරික්සුම් 2ක් පිළියෙල කරනු ලබයි .සියළුම ශාඛාවන්හි ශේෂ පිරික්සුම් සීබීඕඑස් (CBOS) පද්ධතිය තුළින් උපුටා ගෙන එය එක්සෙල් පැතුරුම්පත් (MS excel spread sheet) ආකෘතියකට හරවා තනි ශාඛා ශේෂ පිරික්සුමක් උපදවයි.ප්‍රධාන කාර්යාලීය අංශ වල ශේෂ පිරික්සුම් වෙනම ලබා ගන්නා අතර ඒවා ප්‍රධාන කාර්යාලීය තනි ශේෂ පිරික්සුමකට සම්බන්ධ	2021	මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අතින් පිළියෙල කිරීම පිළිබඳ අර්ථකථනය අවම කරගත යුතුය.	වත්මන් ක්‍රමයේ අතින් පිළියෙළ කිරීම මගහරවා ගැනීම සඳහා හර බැංකු පද්ධතිය දැනටමත් ක්‍රියාත්මක කර ඇත	2024 සැප්තැම්බර් 13 වන විට බැංකුව හර බැංකුකරණ පද්ධතිය ක්‍රියාත්මක කර ඇත.

	කරනු ලබයි .අවසානයේදී ශේෂ පිරික්සුම් දෙකම භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.				
(ආ)	මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට අන්තර් ශාඛා පාලන ගිණුමේ ශේෂය රු.407,412,355 කි. මූල්‍ය අංශයෙන් ලබාදුන් උපලේඛනය අනුව එම ශේෂයන්හි රු. 408,813,260 ක එකතුව නොසැසඳෙන ශේෂ කිහිපයක් තිබුණි. එබැවින් රු.1,400,905 ක වෙනසක් නිරීක්ෂණය වී ඇති අතර මෙම අන්තර් ශාඛා ගිණුම් ශේෂයන් සැසඳීම සඳහා බැංකුව විසින් කිසිදු ක්‍රියා පටිපාටියක් සකස් කර නොතිබුණි.	2021	පාලන ගිණුම්වල ශේෂයන් අවම කර ගැනීමට බැංකුව විසින් ශක්තිමත් ක්‍රියාපටිපාටියක් අනුගමනය කළ යුතුය.	වෙනස පසුකාලීන ප්‍රතිසන්ධාන මගින් රු. 269,328,017 ක් දක්වා අඩු කොට ඇති අතර, එම ශේෂයට එරෙහිව රු. 269,328,017 ප්‍රතිපාදන වෙන් කොට ඇත.	2024 සැප්තැම්බර් 13 වන විට හර බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ පොදු ලේජර ගිණුම් ස්වයංක්‍රීය කිරීම හේතුවෙන් ගැටලුව නිවැරදි වනු ඇත.
(ඇ)	බැංකුව විසින් පිටකොටුව ශාඛාවේ භාවිතය සඳහා මහල් 4 කින් යුත් ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබූ අතර, වර්ග අඩි 4,629 ක ප්‍රමාණයකින් යුත් ගොඩනැගිල්ලේ මහල් 2 ක් භාවිතයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. බැංකුව විසින් 2021 දෙසැම්බර් දක්වා කුලී වියදම් වශයෙන් රු. මිලියන 47.55 ක් ගෙවා තිබුණි.	2021/2022/2023	බැංකුව විසින් එහි වත්කම් ආර්ථිකව භාවිතා කළ යුතුය	බැංකුව මෙම ගොඩනැගිල්ල එලෙසම යොදාගෙන ඇත්තේ ඉතිරි මහල් දෙක බැංකුවේ සංචාරක බංගලා සඳහා හෝ වෙනත් ප්‍රයෝජනවත් කටයුත්තක් සඳහා වෙන් කිරීමේ අදහසිනි	තවමත් ගොඩනැගිල්ලේ තට්ටු දෙකක් අනාර්ථිකව පවතී
(ඈ)	කොට්ටාව ශාඛාව විසින් 2020 අගෝස්තු සිට 2025 අගෝස්තු දක්වා කාලය (වර්ෂ 5) සඳහා	2021/2022/2023	බැංකුව විසින් එහි වත්කම් ආර්ථිකව භාවිතා කළ යුතුය	අයවැය සීමාවන් සහ වර්තමාන ආර්ථික තත්ත්වයන් හේතුවෙන් එහි අභ්‍යන්තර කටයුතු	බැංකුව මේ දක්වා නවීකරණය සම්පූර්ණ කර නැත.

	රු.200,000 ක මාසික කුලියකට පවතින ගොඩනැගිල්ලේ පළමු මහල ලබාගෙන තිබුණ අතර ආරම්භයේදී ශාඛාව විසින් රු.3,600,000 ක කුලී අත්තිකාරමක් (කුලී වාරික 18) ගෙවා තිබුණි. කෙසේ වෙතත් අළුත්වැඩියා කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් බැංකුව විසින් මේ දක්වා එම මහල භාවිතා කර නොතිබුණි.			කල් දමා ඇත. කෙසේ වෙතත්, ශාඛාව නිසි අභ්‍යන්තර සැකැස්මකින් තොරව එම තට්ටුව ඔවුන්ගේ ගබඩාව ලෙස භාවිතා කරයි	
(ඉ)	බැංකුව විසින් පුද්ගලයන් දෙදෙනෙකුට රුපියල් 164,730,000 ක ඒකාබද්ධ දේපල ණයක් ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ අදාළ වේ.	2021/2022/2023	අනුමත මාර්ගෝපදේශ හා චක්‍රලේඛවලට අනුකූලව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීමට සහ ඵලදායි හා කාර්යක්ෂම ලෙස හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.	දේපල බැංකුව විසින් අත්පත් කර ගෙන ඇත	2024 පෙබරවාරි 06 දිනට ණයෙහි මුළු හිඟ ශේෂය රුපියල් 222,381,178 කි. මෙම දේපල වෙන්දේසියෙන් පසු 2024 පෙබරවාරි 06 දින බැංකුව වෙත පවරා ඇත. කෙසේ වෙතත්, 2024 ජූලි 04 වන දින මෙම ඉඩම සඳහා ලබාගත් තක්සේරු වාර්තාවට අනුව, මෙම ඉඩමේ වෙළඳපල වටිනාකම රු. 197,400,000. එබැවින් ඉතිරි හිඟ ශේෂය වූ රු. 24,981,178 අයකරගැනීම පිළිබඳ සැක සහිතයි.

(i) එකී ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් ණය හිමියන්ගේ ආදායම් මාර්ග සත්‍යාපනය කිරීමට බැංකුව නිසි ඇගයීමක් කර නොතිබුණි.

(ii) ආරම්භක අදියරේදී, ණය තොරතුරු කාර්යාංශ වාර්තාවන් සහ ව්‍යාපාරවල අහිතකර තත්ත්වයන් හේතුවෙන් ණය ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහ ණය කමිටුව එකඟ නොවීය. කෙසේ වෙතත්, අවසානයේ ණය තොරතුරු කාර්යාංශ වාර්තාවන්හි හිඟ මුදල් නොසලකමින්, ගනුදෙනුකරුවන්ගෙන් DTA ප්‍රතිපත්තියක් නොගෙන, ආපසු ගෙවීමේ කාලය වසර 15 සිට වසර 20 දක්වා දීර්ඝ කර, අධ්‍යක්ෂක මණ්ඩල විශේෂ රැස්වීමක් මඟින් සියයට 75 ක අගය අනුපාතය ඉක්මවා යමින් ඉහත ණය මුදල ලබා දීමට අධ්‍යක්ෂක මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

(iii) එකී ණය සඳහා අනුමැතිය ලබා දීම ප්‍රතික්ෂේප කළ

භාණ්ඩාගාර නියෝජිතයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරුන් දෙදෙනකුට , ඉතිරි ණය අධ්‍යක්ෂවරුන් සහ ගැණුම්කරුවෙකුගේ සහභාගිත්වයෙන් පැවති ඉහත සඳහන් විශේෂ රැස්වීමට ආරාධනා කර නොතිබුණි. එම නිසා අධ්‍යක්ෂ මණ්ඩල තීරණවල විනිවිදභාවය සැක සහිත ය.

(iv) ණය ගැනුම්කරු ගෙවා තිබුණේ වාරික දෙකක් පමණි. 2022 ජූලි 31 දිනට මුළු හිඟ ණය මුදල රුපියල් 252,236,697 ක් වූ අතර එය අවසන් තක්සේරුව අනුව රුපියල් 210,000,000 ක දේපළෙහි මුළු වටිනාකමෙන් අයකර ගත නොහැක.

(v) 2022 අප්‍රේල් මාසයේදී ණය ගැණුම්කරුවන් විසින් කරන ලද ඉල්ලීම සඳහා දඩ මුදල් සහ කලින් පියවීම් ගාස්තු ඉවත් කිරීමට බැංකුව තීරණය කර ඇත. කෙසේ වෙතත්, ඔවුන් මේ දක්වා

	ඉතිරි ශේෂය ගෙවා නොතිබුණි				
(ඊ)	බැංකුව විසින් 2018 ජුනි 14 දින මහජන බැංකුව සමග හවුල් (syndicated) ණය මුදලක් RPI ප්‍රයිවට් ලිමිටඩ් (මාලදිවයින් සමාගම) වෙත ලබා දී ඇත. බැංකුව හා මහජන බැංකුව විසින් පිළිවෙලින් එ.ජ.ඩොලර් මිලියන 09 ක් සහ එ.ජ.ඩො. මිලියන 01 ක් ලබා දී තිබුණි. 2022 අගෝස්තු 16 විගණන දිනය වන විටත් ණයකරු විසින් කිසිදු ප්‍රාග්ධන ආපසු ගෙවීම් සහ හිඟ පොළිය වන එ.ජ.ඩො.2.15 ක් ගෙවා නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. (i) වානිජමය අරමුණක් සඳහා විදේශීය සමාගමකට ණය ලබා දීම ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ නිශ්චිතව දක්වා ඇති විෂය පථය යටතේ ආවරණය නොවුවද, පෙර සඳහන් ණය මුදල සංචාරක කර්මාන්තය යටතේ ඉදිකිරීම් අරමුණක් සඳහා විදේශීය සමාගමක් වෙත ලබා දී ඇත. (ii) ණය ලබා දීමට ප්‍රථම බැංකුව විසින් විස්තීරණ ණය ඇගයීමක් හෝ	2021/2022/2023	අනුමත මාර්ගෝපදේශ හා චක්‍රලේඛවලට අනුකූලව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීමට සහ ඵලදායි හා කාර්යක්ෂම ලෙස හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.	අධ්‍යක්ෂ මණ්ඩලය 2023 ජුනි 9 වැනි දින පැවති රැස්වීමේදී, “RPI ආයතනයට අදාළ සම්මේලනික ණයෙහි වර්තමාන තත්ත්වය ” යන කරුණ නීතිපති උපදෙස් අපේක්ෂාවෙන් යොමුකිරීමට තීරණය කර ඇත. බැංකුව විසින් 2023 ජුනි 19 දිනැති ලිපියක් අංක (LD/2023/374) ගරු. නීතිපති උපදෙස් ඉල්ලා ඇත.	බැංකුවට ණය ආපසු අයකර ගැනීමට නොහැකි වූ අතර 2024 මැයි 31 වන විට මුළු හිඟ මුදල (ප්‍රාග්ධනය + පොලී) ඩොලර් මිලියන 13.18 ක් මෙන්ම ණය සේවා සංචිත ගිණුමහි අවම ශේෂය 2024 මැයි 31 වන දිනට ණය ගැනුම්කරු විසින් නඩත්තු කර නොතිබුණි. එය ඩොලර් 27,533.53 ක් විය. නීතිපතිවරයාගේ ලිපිය අපේක්ෂාවෙන් සිටියි.

අවදානම් තක්සේරුවක් කල බව සනාථ කර ගැනීමට කිසිදු සාක්ෂියක් නිරීක්ෂණය නොවීය.

(iii) පසු ණය සමාලෝචන යාන්ත්‍රණය මත වූ 1641/2015 චක්‍රලේඛය ප්‍රකාර බැංකුව විසින් අනුමැතිය ලබා දීමෙන් පසු මාස 03 ක් ඇතුලත ණය පහසුකම් සමාලෝචනයක් සිදු කර නොතිබුණි.

(iv) 2018 ජුනි 21 දින බැංකුව විසින් පළමු ණය ලබා දිමේ සිට වසරක ප්‍රාග්ධන ආපසු ගෙවීම් සහන කාල සීමාවක් ලබා දී තිබුණි. කෙසේ වෙතත් විවිධ හේතූන් යටතේ 2018 ජුනි සිට 2022 ජුනි දක්වා ප්‍රාග්ධන හා පොළී ආපසු ගෙවීම් සඳහා ආරම්භක සහන කාල සීමාව කිහිපවරක් දීර්ඝ කර තිබුණි.

(v) ණය සහන පැකේජයක් (Moratorium)ලබා දීමට අදාල වන ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කල 2020 අංක 5 දරන චක්‍රලේඛය අනුව ඉහත ව්‍යාපෘතිය සඳහා අධ්‍යක්ෂ

මණ්ඩලය විසින් ණය සහන පැකේජ පහසුකම ලබා දී තිබුනද සේවාදායක සමාගම විදේශීය සමාගමක් හෙයින් ඉහත ණය මුදල පෙර කී චක්‍රලේඛයේ විෂය පථය යටතට නොපැමිණේ.

(vi) 2021 ජුලි වලින් පසු කාලයට අදාලව රක්ෂණාවරණය බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(vi) ණය ගිවිසුම අනුව, අවම වටිනාකම එ.ජ.ඩොලර් 270,000ක ණය සේවා සංචිත ගිණුමක් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විවෘතකර පවත්වා ගෙන යා යුතුය. කෙසේ වෙතත් ණය සේවා සංචිත ගිණුමේ අවම ශේෂය ණයකරු (RPI) විසින් පවත්වාගෙන ගොස් නොතිබු අතර 2022 ඔක්තෝබර් 21 දිනට එහි වර්තමාන ශේෂය එ.ජ.ඩොලර් 39,310 කි.

(viii) ණය ගිවිසුම අනුව ණය දෙන්නන් විසින් ව්‍යාපෘතියේ ප්‍රගතිය අධීක්ෂණය කිරිම සඳහා ස්වාධීන ව්‍යාපෘති අධීක්ෂකයෙකු ලෙස

	හෝටල් ඉදිකිරීමේ සුදුසුකම් ලත් විශේෂඥයකු පත් කල යුතුය. කෙසේ වෙතත් ණය දෙන්නන් විසින් එවැනි පුද්ගලයෙකු පත්කර නොතිබූ අතර ණයකරු විසින් (සීමාසහිත RPI ප්‍රයිවට් සමාගම) පත් කරන ලද වරලත් ප්‍රමාණ මිනින්දෝරුවකු ගේ ප්‍රගති වාර්තාවක් මත යැපී තිබුණි.				
(උ)	අනුරාධපුරය, ඇල්පිටිය, ගල්නෑව, කතරගම, කිරිදිවැල, මොණරාගල, රත්නපුර සහ කැකිරාව යන ප්‍රදේශවල පිහිටි ඉඩම්වල ඉදිකිරීම් කටයුතු සඳහා බැංකුව රුපියල් මිලියන 83.6ක් වැය කර තිබුණද 2021 වසර අවසන් වන විටත් එම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි.	2021/2022/2023	එම ඉඩම්වලට අදාළ බදු ගිවිසුම් අත්සන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය.	1. මොනරාගල - මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ලිපි ලේඛන යවා මෙම ක්‍රියාවලියට අදාළ බදු ගෙවන ලදී. 1. කිරිදිවැල - බදු ගිවිසුම් කෙටුම්පතට අවශ්‍ය සංශෝධන සිදු කිරීමෙන් පසු එය ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත යවන ලදී. 2. කැකිරාව - 2021 ඔක්තෝබර් 22 වැනි දින සිහිකැඳවීම යවන ලදී. 3. අනුරාධපුර - 2021.11.23 වැනි	2024 සැප්තැම්බර් 30 දක්වා අදාළ ඉඩම්වල බදු අයිතිය ලබා ගැනීමට බැංකුවට නොහැකි විය.

				දින සිහිකැඳවීම යවන ලදී. 4. ඇල්පිටිය - 2021.10.22 වැනි දින සිහිකැඳවීම යවන ලදී. 5. ගල්නෑව - කෙටුම්පත් බදු ගිවිසුම් 2023 ජුනි 07 දින නීති දෙපාර්තමේන්තුවට ලැබිණි. 6. කතරගම - බැංකුව දිගුකාලීන කල්බදු ගිවිසුමට අත්සන් තැබූ අතර අවසන් ගිවිසුම තවමත් ලැබී නැත. 8. රත්නපුර - 2024 ඔක්තෝබර් 21 වැනි දින සිහිකැඳවීම යවන ලදී.	
(ඍ)	පර්චස් 38.8 ක ඉඩමක් බැංකුව 2008 වසරේ සිට වසර 50 ක කාලයකට නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන ඇත. එම ඉඩමේ නව ගොඩනැඟිල්ලක් සංවර්ධනය කිරීමට කළමනාකාරිත්වය තීරණය කර තිබුණද මෙතෙක් කිසිදු ඉදිකිරීමක් ආරම්භ කර නොතිබුණි.	2021/2022/2023	බැංකුව නිෂ්කාර්යව වත්කම් ලෙස තබා නොගෙන නිශ්චිත කාර්යයක් සඳහා ඉඩම භාවිතා කළ යුතුය.	බැංකු ප්‍රධාන කාර්යාලයට යාබදව ඇති කූපර්ස් ලේන් ඉඩම ආක්‍රමණය කරන්නන් සඳහා ඉඩම් කට්ටි ලබා දීමේ අරමුණින් මාරු කිරීමට අවශ්‍ය බැවින් නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් බැංකුවට මෙම ඉඩමේ ස්ථිර සංවර්ධන කටයුතුවල නිරත නොවන ලෙස උපදෙස් දෙන ලදී. පවතින දේපළ වෙනුවට කොල්ලුපිටිය	2024 සැප්තැම්බර් 30 දක්වා බැංකුව කිසිදු ඉදිකිරීම් කටයුත්තක් ආරම්භ කර නැත

				ප්‍රදේශයෙන් විකල්ප ඉඩම් ඉල්ලා සිටියි.	
(එ)	ශාඛා කළමණාකරුවන්ගෙන් ලද තහවුරු කිරීම්වලට අනුව, 2023 අප්‍රේල් 30 දිනට රුපියල් 328,969,565 ක ණය මුදල්වලට අදාළ ණය ලිපිගොනු 425 ක් අස්ථානගත වී ඇත. අස්ථානගත වූ ණය ලිපිගොනු අතර පුද්ගලික ණය ලිපිගොනු 134 ක්, නිවාස ණය ලිපිගොනු 272 ක්, නීති ලිපිගොනු 10 ක් සහ ස්ථාවර තැන්පතු වලට එරෙහිව ලබා දී ඇති ණය ලිපිගොනු 9 ක් ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.	2022/2023	ගොනු කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සෑම ශාඛාවකම ශක්තිමත් විය යුතුය.	අතුරුදහන් වූ ණය ලිපිගොනු මාසිකව නිරීක්ෂණය කරන ලෙස සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්ට උපදෙස් දී ඇත. ණය කමිටුව කාර්තුමය පදනමින් යාවත්කාලීන කරනු ලැබේ.	2024 අප්‍රේල් 30 වන විට, අස්ථානගත වූ ලිපිගොනු සංඛ්‍යාව 330 දක්වා අඩු කර ඇත. 262,295,557. අස්ථානගත වූ ණය ලිපිගොනු අතරට පුද්ගලික ණය ලිපිගොනු 95ක්, නිවාස ණය ලිපිගොනු 229ක්, නීත්‍යානුකූල ලිපිගොනු 4ක් සහ ස්ථාවර තැන්පතුවලට එරෙහිව ලබාදුන් ණය ලිපිගොනු 2ක් ඇතුළත් වේ.
	(i) මෙම අස්ථානගත වූ ණය ලිපිගොනු 425 න් සියයට 30 ක් හෙවත් ණය ලිපිගොනු 126 ක් අක්‍රීය ගණයට අයත් ණයවලට සම්බන්ධ ඒවා විය. ඒ අතරින් ලිපිගොනු 30ක් නිවාස ණය සම්බන්ධයෙන් වන අතර ලිපිගොනු 95ක් පුද්ගලික ණය සම්බන්ධයෙන් වන අතර එක් ගොනුවක් ස්ථාවර තැන්පතුවට එරෙහි ණයක් විය. 2023 අප්‍රේල් 30 දිනට එම අක්‍රීය				

ණයවල මුළු හිඟ මුදල රුපියල් 50,325,463 ක් වූ අතර එය ලබා දී ඇති මුළු මුදලින් සියයට 66 ක් නියෝජනය විය.

(ii) අස්ථානගත වූ ණය ලිපිගොනු සංඛ්‍යාව 425 න්, රුපියල් 2,766,086 ක හිඟ ශේෂයක් සහිත ණය ලිපිගොනු සංඛ්‍යාව දහයක් නීත්‍යානුකූල ලිපිගොනු විය. මෙම ලිපිගොනු අස්ථානගත වීම හේතුවෙන් බැංකුවට ණය ගැණුම්කරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වූ අතර ණය ආපසු අයකර ගැනීමෙන් පසු ගනුදෙනුකරුවන්ගේ ඔප්පුව මුදා හැරීමට නොහැකි විය. මෙය දිගුකාලීනව බැංකුවේ යහපත් ප්‍රතිරූපයට බාධාවක් විය හැක.

(iii) ගංවතුර තත්ත්වය හේතුවෙන් කඩුවෙල ශාඛාවේ අස්ථානගත වූ ණය ලිපිගොනු සංඛ්‍යාව 425 න් 254 ක් හෙවත් සියයට 59 ක් අස්ථානගත වී ඇත. මෙයින් ණය ලිපිගොනු සංඛ්‍යාව 35ක් අක්‍රීය ගණයට අයත් ණයවලට

	අදාළ වේ. මෙම ණයවල මුළු හිඟ ශේෂය රුපියල් 16,266,596 කි.				
	(iv) ප්‍රධාන කාර්යාල ශාඛාවේ අතුරුදන් වූ ණය ලිපිගොනු 24ක් වූ අතර ඉන් ණය ලිපිගොනු 20ක් අක්‍රීය නිවාස ණය කාණ්ඩයටද ඉන් ලිපිගොනු 16ක් එම ශාඛාවේ කාර්ය මණ්ඩල සාමාජිකයකු විසින් සිදු කරන ලද වංචාවලට අදාළ ඒවා විය. ණය ලිපිගොනු නොමැතිවීම හේතුවෙන් වංචා කළ කාර්ය මණ්ඩල සාමාජිකයාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව ප්‍රශ්නාර්ථයකි.				
(ඒ)	පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචයේ (CAS) මෙහෙයුම් සම්බන්ධයෙන් 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත යටතේ 2022 පෙබරවාරි 28 දිනැති 2022 අංක 02 දරන සාමාන්‍ය නියෝගයේ 5.6 වගන්තියට අනුව, සෑම පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සාමාජිකයෙකුම නිතිපතා උපස්ථ කිරීම සඳහා වගකිව යුතුය. දත්ත සමුදායන් , එහි සියලුම තොරතුරු සහ දත්ත පොදු	2022/ 2023	ප්‍රධාන කාර්යයන් සඳහා ස්වයංක්‍රීය උපස්ථ ක්‍රියා පටිපාටිය සුමට ලෙස ක්‍රියාත්මක වීම සඳහා කාඩ්පත් මධ්‍යස්ථානය විසින් පවත්වාගෙන යා යුතුය.	කාඩ්පත් මධ්‍යස්ථානය එහි සියලුම ස්වයංක්‍රීය ක්‍රියාකාරකම් සඳහා ස්වයංක්‍රීය උපස්ථ ක්‍රියාත්මක කර ඇත, ප්‍රතිසන්ධානය සහ කාඩ්පත් කළමනාකරණ පද්ධතිය වැනි ක්ෂේත්‍ර ඇතුළත් වේ. මෙම උපස්ථ සේවාදායක සහ දත්ත සමුදා මට්ටම් දෙකෙහිම තොරතුරු තාක්ෂණ අංශය	කාඩ්පත් මධ්‍යස්ථානය 2024 මැයි 31 වන විට ප්‍රතිසන්ධාන සහ කාඩ්පත් කළමනාකරණ පද්ධතිය හැර එහි සියලුම ප්‍රධාන කාර්යයන් සඳහා ස්වයංක්‍රීය උපස්ථ ක්‍රියා පටිපාටියක් පවත්වා ගෙන නොමැත.

	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචයේහි මෙහෙයුම් වලට අදාළව සහ ප්‍රතිසාධන ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම පද්ධතියේ අසාර්ථකත්වය හෝ දත්ත දූෂණය හෝ නැතිවීම. කෙසේ වෙතත්, පාරිභෝගික මුදල් ආපසු ගෙවීම, ආරවුල් හැසිරවීම, ආරෝපණ සහ ප්‍රතිසන්ධානය වැනි සමහර ප්‍රධාන කාර්යයන් සඳහා ස්වයංක්‍රීය උපස්ථ ක්‍රියා පටිපාටිය පවත්වා ගැනීමට කාඩ්පත් මධ්‍යස්ථානය අසමත් වී ඇත.			විසින් උනන්දුවෙන් හසුරුවනු ලැබේ. කෙසේ වෙතත්, අයකිරීම් සැකසීම, ආරවුල් හැසිරවීම, මුදල් ආපසු ලබා දීම සහ අතිරේක ප්‍රතිසන්ධාන වාර්තා ඇතුළු දෛනික අත්පොත කාර්යයන් පරිශීලක පරිගණකවල ගබඩා කර ඇත. වර්තමානයේ, මෙම කාර්යයන් සඳහා උපස්ථයන් අතින් ගන්නා අතර බාහිර දෘඪ තැටි මත පමණක් සුරැකේ. කාඩ්පත් මධ්‍යස්ථානයේ පරිගණක සඳහා විශේෂයෙන් සකස් කරන ලද වඩාත් විධිමත් සහ ආරක්ෂිත උපස්ථ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය සමඟ දැනට සාකච්ඡා කෙරෙමින් පවතී.	
(ඔ)	2022 දෙසැම්බර් 31 දිනට ආයතනික ණයවල මුළු හිඟ ශේෂය රුපියල් මිලියන 90,191.55 ක් වූ අතර එයින් රුපියල් මිලියන 5,908.13 ක් අක්‍රීය කාණ්ඩය යටතේ විය. මෙම සම්පූර්ණ හිඟ ශේෂය 2023 මැයි මස අවසානයේදී රුපියල් මිලියන 90,445 දක්වා වැඩි කර ඇති අතර ඉන්	2022/ 2023	බැංකුව විසින් ණය ලබා දීමට පෙර නිසි පාරිභෝගික ඇගයීම් සිදු කළ යුතු අතර හිඟ ණය ආපසු අයකර ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය.	ණය ආපසු අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් / එකඟතාව ලබා ගැනීම සඳහා සිරස්තල සහිත විදේශ ණය නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. රාජ්‍ය ආයතන දෙකට සම්බන්ධ අක්‍රීය ණය	2023 දෙසැම්බර් 31 දිනට ආයතනික ණයවල මුළු හිඟ ශේෂය රුපියල් මිලියන 80,202.94 ක් වූ අතර එයින් රුපියල් මිලියන 5,955.57 ක් අක්‍රීය ණයට අයත් විය. මෙම මුළු හිඟ

රුපියල් මිලියන 5,730 ක් අක්‍රීය ගණයට අයත් වේ. ඉහත අක්‍රීය ණය ශේෂයෙන් සියයට 66 ක් විදේශ ණය නියෝජනය කරන අතර සියයට 29 ක් භාණ්ඩාගාර ඇපකර මගින් සුරක්ෂිත කර ඇති රජයට සම්බන්ධ සමාගම් දෙකකට ලබා දුන් ණය නියෝජනය කරයි.

වලින් එකක හිඟ මුදල් පියවා ඇත.

අනෙක් රාජ්‍ය ආයතනයට සම්බන්ධ ණය පිළිබඳ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනුවත් කර ගැටලුව විසඳීමට සහාය ඉල්ලා සිටියේය.

අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව 2023 ජූනි 21 දිනැති ලිපියක් මගින් බැංකුවට දන්වා සිටියේ මෙම කාරණය ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇති බවයි.

බැංකුව ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් අමතා අදාළ නිලධාරීන් සමඟ මේ පිළිබඳව සාකච්ඡා කිරීමට රැස්වීමක් ඉල්ලා සිටියේය. රැස්වීම් දිනයක් තවමත් ලබා දී නැත.

ශේෂය 2024 මැයි මස අවසානයේදී රු. මිලියන 79,941 ක් වූ අතර ඉන් රුපියල් මිලියන 5,933 ක් අක්‍රියාකාරී කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලදී.

3.5 නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පසු ලාභය (අලාභය) රු.	මතය
2021	62,963,591,055	56,328,825,053	6,353,515,999	547,287,343	තත්ත්වාගණනය නොකළ
2022	62,882,057,803	55,884,400,728	6,716,407,077	326,325,400	තත්ත්වාගණනය නොකළ
2023	67,941,107,381	59,532,025,601	8,127,831,780	1,376,359,784	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	**2.1 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා** රු.1,032,542 ක හඳුනා නොගත් වැටුප් අත්තිකාරම් වටිනාකමක් වර්ෂ 5 කට වැඩි කාලයක් තිස්සේ 2500901001 දරණ ගිණුමෙහි පවත්වාගෙන ගොස් තිබුණි. පසුගිය වසරේ විගණනයේදී ද මෙම කරුණ අවධාරණය කර තිබුණද එම ගැටලුව නිවැරදි කිරීමට අදාළ අධිකාරිය අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දිය යුතුය.	මෙම වටිනාකම් හඳුනාගෙන නොමැති අතර අභ්‍යන්තර විගණන අංශය මගින් විමර්ශන සිදු කරමින් පවතී. මෙම තත්වය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව **(BAC)** වෙතද වාර්තා කර ඇත. විමර්ශනය අවසන් වන තුරු අප විසින් ආදායම් ප්‍රකාශයෙහි ප්‍රතිපාදන සලසා ඇත.	මුලින්ම මෙම අයිතමයන් හඳුනා නොගත් ඒවා ලෙසට හඳුනාගෙන, වැටුප් සම්බන්ධ වියදම් ලෙස වෙනම ලෙජර් ගිණුමක් විවෘත කර වැටුප් අත්තිකාරම් ගිණුමෙන් වැටුප් සම්බන්ධ වියදම් ගිණුමට රු.1,032,542 ක් මාරු කර ඇත. තවද, මෙවැනි

				දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා වෛද්‍ය බිල් අත්තිකාරම් සහ වැටුප් අත්තිකාරම් සඳහා වෙන වෙනම ගිණුම් ගත කර සියළු ගණුදෙණු සැසඳීම් යාවත්කාලීනව සිදුකර ඇත.

2.2 ගෙවිය යුතු මුදල්

(i) වෙන්දේසියේ විකුණුම් වලින් වැඩිපුර අයකර ගැනීම (1310190028) පවරා ගත් දේපළ විකිණීමෙන් ලද රු..902,213 ක අතිරික්ත මුදල අදාළ ගනුදෙනුකරුවන්ට නොගෙවා 2023 දෙසැම්බර් 31 දිනට වසරකට වැඩි කාලයක් තිස්සේ මෙම ගිණුමේ රඳවාගෙන තිබුණි.	2023, 2022	වැඩිපුර අයකර ගැනීම් කිසිදු ප්‍රමාදයකින් තොරව නිරවුල් කළයුතු වේ.	මෙය 2024 වර්ෂය තුල නිරවුල් කරනු ඇත.	මෙය 2024 වර්ෂය තුල නිරවුල් කරනු ඇත.
(ii) මුදල් අතිරික්තය - 1310190004 රු.200,973 ක	2023	දිගු කාලයක සිට පවතින ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමට	මේවා හඳුනාගත නොහැකි අයකැමි අතිරික්ත මුදල් වේ. කෙසේ වෙතත්,	මුදල් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයෙහි අතිරික්තය සඳහා

අතිරික්ත මුදල 2023 දෙසැම්බර් 31 දිනට වසරකට වැඩි කාලයක සිට ඉහත ලෙජර් ගිණුමෙහි දක්වා තිබුණි.		පියවර ගතයුතු වේ.	අතිරික්ත ශේෂයන් හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතී.	මාසික සැසඳීම් කාලීනව සිදුකරන අතර අතිරික්තය ඉවත් කිරීමට ශාඛාවලට අඛණ්ඩව උපදෙස් දෙනු ලැබේ.

2.3 අත්තිකාරම්

(i) ඔලිම්පස් ඉදිකිරීම් පුද්ගලික සමාගම (Olympus Constructions (Pvt) Ltd) ඔලිම්පස් ඉදිකිරීම් පුද්ගලික සමාගම විසින් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ඉල්ලා සිටි රු.මිලියන 350 ක ණය පහසුකමක් 2019 ජුනි 07 දින පැවති විශේෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කර තිබුණි. ඒ අනුව 2019 ජූලි 08 සහ 2019 ඔක්තෝබර් 28 යන දිනයන්හිදී එම සමාගමට පිළිවෙලින් රු. මිලියන 100 ක හා රු. මිලියන 150 ක ණය පහසුකම් ප්‍රදානය කර තිබුණි. තවද, ණය ලබා ගැනීමේදී බැංකුව	2023, 2021	ණය ලබාදීමට පෙර නිසි පාරිභෝගික ඇගයීමක් සිදු කළ යුතු අතර එම ණය අයකර ගැනීමට සතුටුදායක ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණය සමඟ එකඟ වේ. නීතිමය ක්‍රියාමාර්ග අඛන්ඩව සිදුවේ. බැංකුව විසින් වත්කම් බැහැර කිරීමේ හැකියාව පරීක්ෂා කරමින් සිටී.	බැංකුව විසින් 2019 දී ණය පහසුකමක් අනුමත කරන ලදී, 2021 දෙසැම්බර් මාසයේදී එන්තරවාසි යවා ඇත. 2022 ජනවාරි මාසයේ දී නඩුවක් ගොණු කර ඇති අතර 2022 මැයි 25 වන දින නඩුව විභාගයට ගන්නා ලදී. 2024 අප්‍රේල් මාසයේදී, ගනුදෙනුකරු විසින් බේරුම් කිරීමක් යෝජනා කරන ලද අතර, අඛණ්ඩ නීතිමය ක්‍රියාමාර්ග වලට සහ වත්කම් අපහරණය කිරීමට යොමු වෙමින්

සමඟ ඇති කර ගත් විශේෂ ගිවිසුමේ කොන්දේසිවලට අනුකූල වීමට ගණුදෙණුකරු අසමත් වී තිබුණි. පස් ප්‍රමාණනය කළ නොහැකි බවට අභ්‍යන්තර තක්සේරු නිලධාරියා වාර්තා කර ඇති බැවින් අභ්‍යන්තර තක්සේරු වාර්තාව ලැබීමට නියමිත බව සඳහන් කරමින් 2019 ජූනි 07 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 01/SPL/06/2019 (ලේඛණ අංක.01) මගින් මෙම ණය සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එබැවින් ඉඩමේ වටිනාකම සහ ඉඩමේ පස් ආදායම යන දෙකම සලකා ඉඩම තක්සේරු කළ බාහිර තක්සේරු නිලධාරියා (ලංකා බැංකුවේ තක්සේරුකරුවකු (panel valuer of Bank of Ceylon) විසින් ලබා දුන් රු. බිලියන 1 ක	බැංකුව විසින් එම යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී. <u>වත්මන් තත්ත්වය</u> අංක CHC/14/2022 දරන නඩුව මීළඟ පියවර - 07/10/2024 සහ 11/10/2024 නඩු විභාගය/ බේරුම්කරණය සිදුවේ.

තක්සේරුව සලකා බලා ණය ලබා දී තිබුණි. කෙසේ වෙතත්, 2019 ජූනි 07 දින අභ්‍යන්තර තක්සේරු නිලධාරියා විසින් පස් ආදායම ඇතුළත් නොකර රු. මිලියන 72 කට (FSV) ඉඩම තක්සේරු කර සිය තක්සේරු වාර්තාව ඉදිරිපත් කර තිබුණි. එසේම, ඉඩම් වටිනාකමට අස්පෘශ්‍ය වත්කම් වටිනාකම ඇතුළත් නොකිරීමට මුලසිටම ඔහු නිර්දේශ කර තිබුණි.

ණය ප්‍රදාණය කළ මුල් කාලයේදීම එනම් 2020 ජනවාරි 07 වන දින ණය මුදල අක්‍රිය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. ඉඩම විකිණීමට බැංකුව විසින් අවස්ථා දෙකකදී (2022 නොවැම්බර් 18 සහ 2021 ජූනි 22) පුවත්පත්වල දැන්වීම් පළ කර තිබුණු අතර, රුපියල් මිලියන 44ක

	එක් ටෙන්ඩරයක් පමණක් ලැබී තිබුණි. කෙසේ වෙතත්, ටෙන්ඩර් කමිටුව දේපල විකිණීම ප්‍රතික්ෂේප කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය ශේෂය රු.303, 805, 400 ක් විය. බැංකුව විසින් නඩු ගොණුකර ඇති අතර එය විභාග වෙමින් පවතී.				
(ii)	**බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී (Bimputh Finance PLC)** ණය කළඹේ සුරැකුමට සහ දයා සමූහයේ ආයතනික ඇපකරයට එරෙහිව බැංකුව විසින් 2018 ජූලි 18 දින බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී වෙත (Bimputh Finance PLC) රුපියල් මිලියන 350 ක ණය මුදලක් ප්‍රදානය කර තිබුණි. මෙම ණය මුදල 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී ණය කාණ්ඩයට අයත් වූ අතර එය 2022 ජූනි	2023, 2021	ණය ලබාදීමට පෙර නිසි පාරිභෝගික ඇගයීමක් සිදු කළ යුතු අතර එම ණය අයකර ගැනීමට සතුටුදායක ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණය සමඟ එකඟ වේ. බැංකුව විසින් සේවාදායකයාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කළ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ගොනු කරන ලද ක්‍රියාමාර්ග අවසන් කරන ලදී.	Bimputh Finance PLC, මුලදී ශක්තිමත් මූල්‍ය හැකියාවක් සහිත HDFC බැංකුවේ ප්‍රමුඛ සේවාදායකයකු වූ අතර, රජයේ ප්‍රතිපත්ති වෙනස්වීම්, COVID-19 බලපෑම් සහ ආර්ථික අර්බුද හේතුවෙන් ණය අයකර ගැනීම් සහ ලාභදායිත්වය පහත වැටීමකට මුහුණ දීමට සිදුවිය. පසුව කාලයක් ණය

29 අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. තවද, දුර්වල ප්‍රාග්ධනීකරණය, ද්‍රවශීලතා අවදානම සහ එහි වත්කම්වල ගුණාත්මක භාවයේ දැඩි පිරිහීම වැනි ප්‍රධාන සාධක සලකා බැලීමෙන් පසුව බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී හි ෆිච් (Fitch) ශ්‍රේණිගත කිරීම "BB (lka)" සිට "CC (lka)"දක්වා පහත හෙළා ඇති බව නිරීක්ෂණය විය.පසුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 සැප්තැම්බර් 01 සමාගමේ බලපත්‍රය අවලංගු කර තිබුණි.

2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය ශේෂය රු.307, 008, 053 ක් වූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව බැංකුව විසින් ණය ගොණුව වසා දැමීමට කටයුතු කර තිබුණි.

ආපසු ගෙවීම කළමණාකරණය කර ගත්තද 2022 මැයි මාසයෙන් පසු මුදල් ප්‍රේෂණය කිරීමට අපොහොසත් වූ අතර, 2023 සැප්තැම්බර් 1 දින ඔවුන්ගේ බලපත්‍රය අවලංගු වූයෙන් බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

<u>වත්මන් තත්ත්වය</u>

බිම්පුත් ඇවර කිරීම සඳහා ඉහල උසාවියේ (සිවිල්) අංක 41/24Co දරණ නඩුව ගොනු කර ඇත. - පුවත්පත් නිවේදනය / සහාය- 24/9/2024

(iii) මාදම්පේ මිල් සමාගම **(Madampe Mills (Pvt) Limited)** බැංකුව විසින් 2016 සැප්තැම්බර් 13 දින වසර 2ක පොලී සහන කාලයක් සහිතව වසර 5ක කාලයක් සඳහා සියයට 9ක සහනදායී පොලී අනුපාතයක් යටතේ ගනුදෙනුකරුවෙකුට රු. මිලියන 50ක ප්‍රදානය කර තිබුණි. තවද සහන කාලයද ඇතුළුව ණය ආපසු ගෙවීමේ කාලය වසර 7 ½ දක්වා දීර්ඝ කර තිබුණි. සමාගමේ ව්‍යාපෘති යෝජනාවට අනුව ඔවුන්ගේ පුරෝකථනය කරන ලද නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට සමාගම අසමත් විය. ණය ලබා ගැනීමෙන් පසු සමාගම 2020 සහ 2021 වර්ෂයන්හි පිළිවෙලින් රුපියල් මිලියන 109.4 සහ රුපියල් මිලියන 12.9 ක අලාභයක් වාර්තා කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත	2023, 2021	ණය ලබාදීමට පෙර නිසි පාරිභෝගික ඇගයීමක් සිදු කළ යුතු අතර එම ණය අයකර ගැනීමට සතුටුදායක ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණය සමඟ එකඟ වේ. <u>වර්තමාන තත්වය</u> දේපළ පවරා ගැනීමට ගණුදෙණුකරු විසින් ගොනු කරන ලද නඩුව, CHC 19/24/MR. 2024/02/16 දින සමතයකට පත්විය. එකඟතා ප්‍රකාශය 14/08/2024 ගොනු කර ඇත.	වෙන්දේසිය නැවැත්වීම සඳහා ගණුදෙණුකරු විසින් 2024 පෙබරවාරි මාසයේදී රුපියල් මිලියන 40ක් ගෙවා ඇති නමුත් 2024 මාර්තු වන විට ඉතිරි ශේෂය ගෙවීමට අපොහොසත් වූ බැවින්, බැංකුව විසින් වෙන්දේසි ක්‍රියාවලිය නැවත ආරම්භ කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 60% සීමාව ඉක්මවන 78.13% ක වැඩි කරන ලද LTV අනුපාතයක් අනුමත කර ඇත. නෛතික නිෂ්කාෂණ ලබාගෙන උකස් බැඳුම්කරය සක්‍රීය කර ඇත. <u>වත්මන් තත්ත්වය</u> ගණුදෙණුකරු විසින් ගොනු කරන ලද CHC 19/24/MR දරන

නිරීක්ෂණ සිදු කරනු ලැබේ, ණය මෙහෙයුම් අත්පොතෙහි 4.2.11 වගන්තියට පටහැනිව, බැංකුව විසින් උකස් දේපලෙහි බලකර විකුණුම් වටිනාකමෙන් සියයට 78.13 ක් ණයක් ලෙස ප්‍රදානය කර තිබූ අතර , ඉඩම් උකසට අමතරව ඉහත ණය පහසුකම සඳහා සමාගමේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු පුද්ගලික ඇපකරුවන් ලෙස ඇප වී තිබුණි. ණය මෙහෙයුම් අත්පොතෙහි 3.4.5 (අ) වගන්තියට පටහැනිව, බැංකුව තෙවන පාර්ශ්වයකට හිමි දේපළක් සුරක්ෂිතය ලෙස ලබා ගෙන තිබුණි. උකස් දේපලෙහි අයිතිය සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු නොවූ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ බිරිඳ සතු විය. බැංකුවට උකස් ඉඩම පවරා ගැනීමට තවම අසමත් වී	නඩුව 2024/02/16 දින සමතයකට පත්විය. එකඟතා ප්‍රකාශය14/08/20 24 දින ගොනු කර ඇත.

තිබුණි.. 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය ශේෂය රු. 70,418,522 ක් වූ අතර ගණුදෙණුකරුට එරෙහිව බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.				
(iv) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට(SEC) අයත් ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ සංවිධානය (NEMO) බැංකුව ජාතික උපකරණ සහ යන්ත්‍රෝපකරණ සංවිධානය (NEMO) වෙනුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට (SEC) පොරොන්දු නෝට්ටුවක උකසට එරෙහිව රු. මිලියන 71.40 ක ණය පහසුකමක් ප්‍රදානය කර තිබුණි. ණය පහසුකම ප්‍රදානය කරන අවස්ථාවේ අපේක්ෂා කළ පරිදි මෙම ආයතනය ක්‍රියා කර නොතිබූ අතර දැනට අක්‍රීය ණයක් ලෙස බාන්ඩ ගතකර තිබුණි. ගනුදෙනුකරුගේ ණය ආපසු ගෙවීමේ හැකියාව ඇගයීමකින්	2023, 2021	ණය ලබා දීමට පෙර නිසි පාරිභෝගික ඇගයීමක් සිදු කළ යුතු අතර එම ණය අයකර ගැනීමට සතුටුදායක ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණය සමඟ එකඟවේ. බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.	කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රු. මිලියන 150 ක ණය පහසුකමක් බැංකුව විසින් අනුමත කරන ලද අතර, රු. මිලියන 71.93 ක් ලබා දී ඇත. ජාතික යොවුන් සේනාංකයෙන් එකතුව රු. 36,808,935 ක ගෙවීම් දෙකක් ලැබී ඇත. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) ණය ආපසු ගෙවීමේ සැලැස්මක් ඉදිරිපත් කර නොමැති බැවින් නෛතික කටයුතු සිදුවෙමින් පවතී. ඊළඟ නඩු දිනය 2024 ඔක්තෝබර් 4 ට යෙදී ඇත. වත්මන් තත්ත්වය

තොරව බැංකුව ඉහත ණය ලබා දී තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය ශේෂය රු. 41,572,112 ක් වූ අතර ගණුදෙණුකරුට එරෙහිව බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබුණි.				අංක CHC 8/21 MR දරණ නඩුව - නඩු විභාගය 04/10/2024
(v) නොමික් ඉන්ටර්නැෂනල් (Nomic International) නොමික් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් (Nomic International Limited) විසින් කළඹ වර්ධනය (Portfolio growth) සහ දැනට පවතින ණය (ණය අංකය 114730000006) නිරවුල් කිරීම සඳහා රු. මිලියන 50 ක ණය පහසුකමක් ඉල්ලා සිටි අතර එය 2022 ජනවාරි 27 දින පැවති ණය කමිටු රැස්වීමේදී අනුමත කර තිබුණි. ඒ අනුව 2022 පෙබරවාරි 17 වැනි දින බැංකුව එම සමාගමට රුපියල් මිලියන 25 ක ණය පහසුකමක් එම සමාගමට ප්‍රදානය කර තිබුණි. බැංකුව ඔවුන්ගේ ණය කළඹට එරෙහිව මෙම ණය ප්‍රදානය මෙම ණය ප්‍රදානය	**2023**	ණය ගිවිසුමේ සහ ණය ප්‍රදාන ලිපියේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූල වීම අවශ්‍ය වේ. එම ණය අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ.	අවශ්‍ය සියලුම ලියකියවිලි 2024/08/14 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. නඩුව ගොනු කිරීමට නියමිතය. .	ණය නැවත අයකර ගැනීමට ඇති ගැටළු උපුටා දක්වමින් නොමික් ඉන්ටර්නැෂනල් ලිමිටඩ් 2022 නොවැම්බර් මාසයේ සිට රුපියල් මිලියන 25 ක ආයතනික ණය පහසුකමක් ගෙවීම පැහැර හැර ඇත. ආපසු ගෙවීමේ සැලැස්මක් ඉල්ලා සිටියද, ඔවුන් ප්‍රතිචාර නොදක්වන ලදී. Nomic හි ප්‍රධාන විධායක නිලධාරියා ආයතනික වෙනස්කම් පෙන්වා දී තිබූ අතර සමාගම ණය දීම නතර කර ඇත. ඔවුන් වෙනත් දේපලක් උකස සඳහා යෝජනා කළ නමුත් අවශ්‍ය ලියකියවිලි සැපයීමට අපොහොසත් විය.

කර තිබූ අතර අධ්‍යක්ෂකවරුන්ගෙන් පුද්ගලික ඇපකර ලබාගෙන තිබුණි. පසුව එම ණය 2023 මාර්තු 09 දින අක්‍රිය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ,

- 2023 ජුනි 20 දින ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසුව එන්තරවාසි ලිපිය යැවීමට බැංකුව තීරණය කර තිබුණි.

- ණය ගිවිසුමේ (i) වගන්තියෙහි සඳහන් විශේෂ කොන්දේසිය අනුව, එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ, සමාගමේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් සහතික කරන ලද විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සඳහා බැංකුවට ඉදිරිපත් කළ යුතුවේ.කෙසේ වෙතත්. 2022 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන

HDFC බැංකුව ලබාගන්නා ලද උපදෙස් පරිදි 2024 ජුනි 24 දින නීතිමය ක්‍රියාමාර්ගයට අවතීර්ණ වී ඇත.

වත්මන් තත්ත්වය

අවශ්‍ය සියලුම ලියකියවිලි 2024/08/14 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. නඩුව ගොනු කිරීමට නියමිතය

ලද මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීමට බැංකුව අසමත් වී තිබුණි.

- ණය ගිවිසුමේ (ii) වගන්තියෙහි විශේෂ කොන්දේසිය අනුව, ක්‍රියාකාරී ණය ලැයිස්තුව අධ්‍යක්ෂවරුන් විසින් අර්ධ වාර්ෂික ව යාවත්කාලීන කර සහතික කළ යුතු අතර එය බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුවේ. කෙසේ වෙතත්, 2022 වර්ෂයේ 2 වන අර්ධ වර්ෂය සඳහා කළඹ ලබා ගැනීමට බැංකුව අසමත් වී තිබුණි.
- 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය මුදල රු. මිලියන 27.5ක් වූ අතර හිඟ හිටි දින ගණන දින 388 ක් විය. බැංකුව විසින් නඩුවක් ගොණුකළ යුතු වේ.

(vi) ඉතා වැදගත් වෘත්තිකයන් සඳහා ලබා දී ඇති ණය 2016 සැප්තැම්බර් 28 දිනැති අංක GCL/2016/210 චක්‍රලේඛයට අනුව, බැංකුව විසින් ඉතා වැදගත් වෘත්තිකයන් (VIP) සඳහා නිවාස ණය පහසුකම් හඳුන්වා දී තිබූ අතර, මෙම යෝජනා ක්‍රමය යටතේ එකතුව රු.. 282, 985,000 ක් වූ ණය 140ක් ප්‍රදානය කර තිබුණි. එයින් එකතුව රු. 47,198,171.41 ක් හෙවත් මුළු ණය ප්‍රමාණයෙන් සියයට 16.68 ක් වූ ණය 27 ක් 2023 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබුණි. කෙසේ වෙතත්, සුරැකුම් නොමැතිකම හේතුවෙන් ණය අයකරගැනීමේ ද්විතියික අවස්ථාව බැංකුවට අහිමි වී තිබුණි.	2023, 2022, 2021	ණය අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුයි.	VIP ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. ණය රැසක් මේවනවිට නිරවුල් කර ඇත. දැනට ණය ප්‍රාග්ධනය රුපියල් මිලියන 34.65 ක ණය 23 ක් අක්‍රීය ණය ලෙස පවතී.	VIP ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. දැනටමත් බොහොමයක් ණය අයකරගෙන ඇත. දැනට රු. මිලියන 42.8 ක අක්‍රීය ණය ප්‍රාග්ධනයක් සහිත ණය 26 ක් පවතී. <u>වත්මන් තත්ත්වය</u> 2024 අගෝස්තු 31 වන විට, අක්‍රීය ණය (NPL) කාණ්ඩය යටතේ වර්ගීකරණය කළ VIP ණය 23 ක් ඇති අතර මුළු හිඟ ප්‍රාග්ධනය රු. මිලියන 34.65 ක් වේ.

(vii)එම්. ද පෝල් (M.De Paul) බැංකුවේ කොළඹ ශාඛාව විසින් රු. මිලියන 16ක EPF පාවෙන ණය පහසුකමක් (EPF floating loan facility) 2021 දෙසැම්බර් 02 දින ඉහත ගණුදෙණුකරු වෙත ප්‍රදානය කර තිබූ අතර පසුව, එය 2022 අප්‍රේල් 3 වැනි දින අක්‍රිය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු. 20,784,782.07 ක් වූ අතර හිඟ හිට ඇති දින ගණන දින (DPD) 701 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. • 2021 මාර්තු සිට 2023 දෙසැම්බර් දක්වා කාලය තුළ බැංකුවට මෙම ගනුදෙනුකරුගෙන් රු.112, 970 ක එක් ගෙවීමක් පමණක් ලැබී	**2023**	මෙම ණය අයකර ගැනීමට අවශ්‍ය පියවර ගතයුතු වේ.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	ගණුදෙණුකරු 2021 දෙසැම්බර් මාසයේදී රු. මිලියන 16 ක ණයක් අපගේ කොළඹ ශාඛාවෙන් ලබා ගෙන ඇති අතර එම ණය ඔහුගේ සේවක අර්ථසාධක අරමුදලින් සුරක්ෂිත කර ඇත. ඔහු Shelly's Design Studio හි කළමනාකාර අධ්‍යක්ෂවරයා වූ අතර වැටුපෙන් වාරික කපා ගැනීමට ආයතනයෙන් ලබා ගත් ගිවිසුම මත මෙම ණය මුදල නිදහස් කර ඇත. ඔහු තම සේවක අර්ථසාධක අරමුදල ඉවත් කර ගැනීමට සැලසුම් කර ඇති බව 2022 නොවැම්බර් 22 අප වෙත දැනුම් දුන් නමුත්, වංචනික ලෙස

	තිබුණි. • සැක කටයුතු හේතුවක් මත මහ බැංකුව මෙම ගනුදෙනුකරුගේ සේවක අර්ථසාධක අරමුදල රඳවා තබා ගෙන තිබුණි. එබැවින් 2022 දෙසැම්බර් 31 දිනට රු. 5,522,788 ක හිඟ මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි. • සේවායෝජකයා විසින් එකඟ වූ පරිදි ණය ගණුදෙණුකරුගේ වැටුප HDFC බැංකුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.				මුදල් ආපසු ගැනීමේ උත්සාහයන් හේතුවෙන් කම්කරු කාර්යාලයෙන් එය අත්හිටුවවන ලෙසට ඉල්ලීමක් ලැබී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෙන්වා දී තිබුණි. පරීක්ෂණයක් සිදුවෙමින් පවතින අතර සමාගම විසින් සමාන මාසික වාරික (EMI (ගෙවීම් පිළිබඳ ව්‍යාජ සහතික අඛණ්ඩව ලබා දී ඇති අතර, එය වසා දමා ඇති බව පසුව අනාවරණය විය.
(viii)	එකතුව රු. මිලියන 3,621 ක EPF ණය 5,237 ක් 2023 වර්ෂය තුළ ප්‍රදානය කර තිබූ අතර ඉන් රු. මිලියන 1,441 (සියයට 40) ක් වූ EPF ණය 2,114 ක් සඳහා 2023 වසර	**2023**	මෙම ණය අයකර ගැනීමට අවශ්‍ය පියවර ගතයුතු වේ.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	වර්තමානයේ EPF ණය BSO එකක් සමඟ ප්‍රදානය කෙරේ. තවද හැකි සෑම විටම සේවා නියුක්ත ණය ගැණුම්කරුවන් ගේ වැටුප බැංකුව

තුළ එක වාරිකයක් හෝ ගෙවා නොතිබුණි.				වෙත ප්‍රේෂණකරවා ගැනීමට බැංකුව උත්සා දරයි.
2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම				
(i) **2011** අංක **7** දරන බැංකු පනතේ නියෝගයන් හි **B.2.5**(ආ) වගන්තියට අනුව**,** විවිධ කර්මාන්ත**,** ව්‍යාපාර සහ පුද්ගලික අංශ ආදී ලෙස බාණ්ඩ ගතකරණය ගැණුම්කරුවන් ඇගයීමට බැංකුව අසමත් වී ඇත. අපගේ නිරීක්ෂණයට අනුව**,** පද්ධති යාවත්කාලීන කිරීම තවම අවදානම් කළමනාකරණ අංශයේ අවශ්‍යතාවලට අනුකූලව සිදු නොවේ. කර්මාන්ත.ව්‍යාපාර සහ බාණ්ඩ වශයෙන් අවධානම ශ්‍රේණි ගත කිරීමේදී ව්‍යාපාර	**2023**	බැංකු පනතේ උපදෙස් වලට අනුකූල විය යුතු වේ.	නිරීක්ෂණය සමග එකඟවේ.	අවදානම් ශ්‍රේණිගත කිරීමේ පහසුකම් මූලික බැංකු පද්ධතියට ඇතුළත් කරන තෙක් අතින් **(manually)** කටයුතු කිරීම දැනටමත් ආරම්භය කර ඇත.

ණය මත අක්‍රීය ණය අනුපාතය (ආයතනික ණය සහ ව්‍යාපාර උකස්) **(NPL)** අනුපාතය 2023.12.31 දින වන විට මුළු ව්‍යාපාර ණය කළඹින් දළ වශයෙන් **75%**ක් පමණ බව නිරීක්ෂණය විය.				
(ii) 2011 අංක 7 දරන බැංකු පනතේ නියෝගයන්හි D.2.5 වගන්තිය අනුව මෙහෙයුම් අවදානම් සිදුවීම්වල බරපතලකම අඩු කිරීම සඳහා අවදානම් අවම කිරීමේ (iii) පියවරයන් භාවිතා කිරීම නිර්දේශ කර ඇත. අඛණ්ඩතාව සහ ආපදා ව්‍යාපාර ප්‍රතිසාධන සැලැස්මේ කොටසක් ලෙස තොරතුරු තාක්‍ෂණය ප්‍රමාණවත් ලෙස යොදා ගැනීම අවදානම් අවම කිරීම සඳහා ද	2023	බැංකු පනතේ උපදෙස් වලට අනුකූල විය යුතු වේ.	නිරීක්ෂණය සමග එකඟ වේ.	තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පාලන සඳහා මූලික ආරක්ෂක ප්‍රමිතීන් **ISMS (**තොරතුරු ආරක්ෂණ කළමනාකරණයේ **ISO** ප්‍රමිතිය) ක්‍රියාත්මක කිරීම යටතේ ආවරණය වේ .

වැදගත් වේ. තවද, 2014 අංක 04 මහ බැංකු දිශානතිය **(direction)** අනුව, තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා මූලික ආරක්ෂක ප්‍රමිතිය(**Baseline Security standard**) බැංකුව විසින් 2015 ජූලි 1 දින සිට ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වෙතත්, වසර 9 ක් තිස්සේ පහත සඳහන් ආරක්ෂක පාලනයන් ස්ථාපිත කර නොතිබුණි. මෙම තත්ත්වය බැංකුව තුළ ඉහළ මෙහෙයුම් අවදානමක් ඇති කළ හැකිය.

පාලනයේ නම	පාලනයන් ගණන	සම්පූර්ණ කරන ලද පාලනයන් ගණන
තොරතුරු ආරක්ෂණ සිද්ධීන් කළමනාකරණය	5	3
තොරතුරු පද්ධති අත්පත් කර ගැනීම, සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම	13	5
මෙහෙයුම් ආරක්ෂාව	16	10
ව්‍යාපාර අඛණ්ඩ කළමනාකරණය	5	1

(iv) මෙහෙයුම් අත්පොතෙහි 5 වගන්තිය අනුව බැංකු ශාඛා 36හි 2023.12.31 දිනට තැන්පතු ශේෂයේ එකතුව රු. 180,589,212.86 ක් වූ මූලික ශේෂය සහිත (v) ගිණුම් 71661ක් ගණුදෙණුකරුගේ විධිමත් අයදුම් පතක් (mandate) හා අදාල ලියවිලි නොමැතිව බැංකුව විසින් පවත්වාගෙන ගොස් තිබුණි.	2023	ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දිය යුතුවේ.	නිරීක්ෂණය සමඟ එකඟ වේ	HDFC සමිතියක් ලෙස ක්‍රියාත්මක වීමේදී අසම්පූර්ණ විස්තර සහිත සමහර ගිණුම් විවෘත විය. ශේෂයන් ප්‍රතිලාභ ඉතුරුම් ගිණුම් වෙත මාරු කරමින් පවතී., අක්‍රිය ගිණුම් අතහැර දැමූ දේපළ ලෙස CBS පද්ධති පරාමිතීන් ගැලපීම සිදුකරමින් පවතී. තොරතුරු තාක්ෂණ අංශය පැරණි පද්ධතියෙන් අවශ්‍ය දත්ත ලබා ගනිමින් පවතී
2.5 තොරතුරු තාක්ෂණ පොදු පාලනයන්;				
තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම. දත්ත සමුදා පරිපාලකයින්(Data Base Administrators) (DBAs) බැංකුවක සංවේදී තොරතුරු ආරක්ෂා කිරීම සහ ආරක්ෂක කඩවීම් වැළැක්වීම සඳහා ප්‍රධාන	2023	අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ තනතුරු සඳහා සුදුසු පුද්ගලයින් වහාම බඳවා ගත යුතුවේ.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	බුද්ධිගලනය හේතුවෙන් තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් ගේ සැලකියයුතු හිඟයක් පවතී. පුද්ගලික ආයතනවලට

කාර්යභාරයක් ඉටු කරයි. බැංකුවේ අනුමත කාර්ය මන්ඩලය තුල දත්ත සමුදා පරිපාලක තනතුරක් පවතී. බැංකුවේ දත්ත සමුදා පරිපාලක තනතුර 2023 ජුනි 21 සිට පුරප්පාඩු වී ඇති බව නිරීක්ෂණය විය.

තවද, 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය තුල තොරතුරු ආරක්ෂණ තර්ජන විශ්ලේෂක, කළමනාකරු IS, කළමනාකරු SOC, SOC විශ්ලේෂක, විධායක GRC (තනතුරු දෙකක්) කළමනාකරු DBA, කළමනාකරු- ඩිජිටල් බැංකුකරණය, මෘදුකාංග සංවර්ධනයේ තාක්ෂණික ප්‍රමුඛයා, ඩිජිටල් බැංකුකරණයේ තාක්ෂණික ප්‍රමුඛයා, මෘදුකාංග ඉංජිනේරු - IV වැනි තීරණාත්මක රැකියා තනතුරු, පාලන විධායක අවදානම සහ අනුකූලතා, සහය ඉංජිනේරු තනතුරු ද පුරප්පාඩු වී ඇත.

එබැවින්, මෙය බැංකුවේ තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරිත්වය කෙරෙහි

ඉහල වැටුප් (higher packages) පිරිනමමින් බඳවා ගැනීම් සිදු කිරීමේ හැකියාව ඇති අතර HDFC අනුමත වැටුප් පරිමාණයන් සහ සම්මත බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටි සමඟ කටයුතු කළ යුතුය.

එහෙයින් මෙම තනතුරු ප්‍රචාරණය කිරීමට කළමනාකාරිත්ව ය අඛණ්ඩ උත්සාහයන් ගත්තද තොරතුරු තාක්ෂණ පුරප්පාඩු පිරවීම ඉතා අභියෝගාත්මක වී ඇත

සැලකිය යුතු අවදානමක් ඇති කළ හැක.

2.6 මෙහෙයුම් සමාලෝචනය

2.6.1 හඳුනාගත් පාඩු

i. අම්පාර ශාඛාව ලබා දුන් වංචනික ණය 2018 වර්ෂය තුළ අම්පාර ශාඛාව මගින් පුද්ගලික ඇඟලුම් කම්හලකට රුපියල් 8,000,000 ක වංචනික ණය හතක් ලබා දී ඇත. පසුව එය අක්‍රිය ණය කාණ්ඩයට මාරු කර ඇත. 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු. 14,957,108 කි.	2023, 2022, 2021	අනාගතයේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා කළමනාකාරිත්වය ශක්තිමත් සහ ඵලදායී අභ්‍යන්තර පාලන සහ වැළැක්වීමේ පියවර හඳුන්වා දිය යුතුවේ.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.නීතිමය කටයුතු සිදුවෙමින් පවතී.	නඩු අංක 1329/M දිසා අධිකරණය මහියංගනය - ඉදිරි කටයුතු සඳහා 1 වන විත්තිකරු, 2 වන සහ 3 වන විත්තිකරුවන්ට ග්‍රාම නිලධාරී මගින් සිතාසි භාර දී ඇත. - 4 වෙනි විත්තිකරු - Exparte Trial, මූලික නඩු විභාගය 2024/10/04 දින සිදුවේ. නඩු අංක B 3228/23 සහ B2381/22- 2024/10/16 දින EQD වාර්තාව සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනය සිදුකිරීමට නියමිතයි. දින පළමු විත්තිකරුට එරෙහිව නඩුව අංක 6296/M දිසා අධිකරණය අම්පාර - 2024/10/21 විභාග වීමට නියමිත වේ.

ii. ණය පද්ධතියෙන් මකා දැමීම හේතුවෙන් EPF අරමුදල්/වාර්තා නොමැති වීම ණය පද්ධතියෙන් මකා දැමීම හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල්/වාර්තා නොමැති වීම කරණ කොට 2022 කාලසීමාව සඳහා EPF ගනුදෙනුකරුවන් 70 දෙනෙකුට රුපියල් මිලියන 3.45 ක හිඟ මුදල් ගෙවීම මහ බැංකුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. එමගින් බැංකුවට රුපියල් මිලියන 12.49 ක පාඩුවක් සිදුවිය හැකිය	**2023, 2022**	දක්වා ඇති ගණුදෙණු **(underlined transactions)** වලින් බැංකුවට සිදුවන පාඩුව වළක්වා ගැනීමට හෝ අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් සම්පූර්ණ අභ්‍යන්තර විමර්ශනයක් සිදුකර අවසන් කර ඇති අතර වර්තමානයේ මහ බැංකුවෙන් අදාළ තොරතුරු ලබා ගැනීමේ ක්‍රියාවලියක නිරතව සිටී. එය අවසන් වූ පසු වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට ඉදිරිපත් කෙරේ. කළමනාකාරීත්වය විසින් ගෙවිය යුතු මුදල් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ආරම්භ කරනු ඇත. වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට නියමිත වේ.	අභ්‍යන්තර විගණන අංශය (IAD) විසින් පුළුල් පරීක්ෂණයක් පවත්වා එහි වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. බාහිර විගණන සමාගමක් දැන් වෙනම පරීක්ෂණයක් සිදු කරමින් සිටින අතර, අවසන් වූ පසු, ඔවුන්ගේ වාර්තාව ද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට ඉදිරිපත් කරනු ඇත
iii. NIVI කිරි ගොවිපළ (පුද්ගලික) සමාගම බැංකුවේ ණය මෙහෙයුම් අත්පොතේ 4.2.1.1 වගන්තියට අනුව, ව්‍යාපාරික කටයුතු සඳහා ණය ලබා ගැනීමේදී උකස් දේපළෙහි බලකර විකුණුම් වටිනාකමෙන් සියයට 60ක් ණය මුදල ලෙස සැලකිය හැකිය. ඊට පටහැනිව කුලියාපිටිය ශාඛාව විසින් Nivi Dairy Farm වෙත එකතුව රු.49,603,274ක	**2023**	අනාගතයේදී මෙවැනි තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා කළමනාකාරිත්වය විසින් ශක්තිමත් සහ ඵලදායී අභ්‍යන්තර පාලන සහ වැළැක්වීමේ පියවර හඳුන්වා දිය යුතුය.	ගණුදෙණුකරුට එරෙහිව නඩු පැවරීම සඳහා ශිවන් කුරේ මහතා වෙත ලියකියවිලි භාර දෙන ලදී.	ගනුදෙනුකරුට එරෙහිව නඩු පැවරීම සඳහා ශිවන් කුරේ මහතාට ලේඛන භාර දෙන ලදී. ගනුදෙනුකරු අතුරුදහන් වීම සහ ලිපිනයන් මෑතකදී සොයා ගත් බැවින් බැංකුව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නියමිත වේ.

ව්‍යාපාරික ණය 03ක් (602725000177, 602730000001 සහ 602730000002) ලබා දී ඇති අතර එය බලකර වටිනාකමින් 124% කි. කෙසේ වෙතත්, බැංකුව විසින් ඉහත සඳහන් දේපල 2019 අගෝස්තු 01 දින පවරා ඇති අතර එය 2021 ඔක්තෝබර් 08 වන දින රුපියල් මිලියන 31 කට විකුණා, පහත දැක්වෙන ආකාරයෙන් ඉහත ණය පියවා ඇත. තවද, අයකරගැනීමට ඇති ඉතිරි මුදල වන රු.39,806,829 සඳහා සුරක්ෂණයක් නොමැතිව ඉතිරිව ඇති බව නිරීක්ෂණය විය.එයින් බැංකුවට අලාභයක් සිදු වීමට ඉඩ ඇත.

ණය අංකය	අයකරගත යුතු මුළු මුදල (රු.)	අයකරගත් මුදල (රු.)	අයකර නොග මුදල (රු.)	Remarks
602725000177	19,914,715	19,914,715	0	අයකර ගෙන අවසන්
602730000001	31,114,145	11,828,411	19,285,734	අක්‍රිය ණය ලෙස සලකා අධිකරණයේ නඩුවක් ගොණුකර ඇත
602730000002	20,521,095	0	20,521,095	

2.6.2 මෙහෙයුම්

අකාර්යක්ෂමතා

2023 දෙසැම්බර් 31 දිනට පවරා ගත් දේපල (VP) යටතේ වර්ගීකරණය කරන ලද හිඟ ණය වාරික හා හිඟ පොලී වටිනාකම රු. 393,718,086 කි. ඉන් රු. 29,584,465 ක් වූ පවරා ගත් දේපළ 84ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ වෙන්දේසි නොකර පවතී.	2023	දේපළ විකුණා හිඟ ශේෂයන් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	2023 දෙසැම්බර් 31 දිනට වසර පහ ඉක්ම වූ පවරා ගත් දේපළ 84ක් ඇත. ඉන් මායිම් සත්‍යාපනය කිරීමේ දුෂ්කරතා සහිත පවරා ගත් දේපළ 51ක් ඉතිරිව ඇත. කෙසේ වෙතත් දේපළ 9 ක අයිතිය නිරවුල් කර ගැනීම සඳහා අධිකරණ යේ කටයුතු සිදුවෙමින් පවතී. ඉතිරි දේපළ (දේපළ 24) කිහිප වතාවක් ටෙන්ඩර් කර ඇති නමුත් සාධාරණ අර්පණයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

2.7 ප්‍රසම්පාදන

බැංකුව විසින් ණය ප්‍රතිසාධන කළමනාකරණ පද්ධතියේ (Debt Recovery Management System) ව්‍යාපෘතිය Avonet Technologies (PVT) Ltd වෙත රුපියල් මිලියන 12 කට 2018 දී ප්‍රදානය කර ඇති අතර 2019 මැයි 21 දින එළැඹි ගිවිසුම අනුව පිරිවැය	**2022**	ප්‍රසම්පාදන කටයුතු සඳහා නිසි ලියකියවිලි පවත්වාගෙන යාම අවශ්‍ය වේ.	නිරීක්ෂණය සමඟ එකඟ වේ.	කළමනාකාරිත්ය විකුණුම්කරුවන් සමඟ සාකච්ඡා කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවැය අඩු කර ඇත. අනාගත ක්‍රියාකාරකම් ලේඛනගත කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද

රුපියල් මිලියන 9.9 ක් වී තිබුණි. (a) සාකච්චා වලට අනුව, බැංකුව විසින් මිල අඩු කිරීම් ලංසුකරුගෙන් ලිඛිතව ලබා ගත යුතුවේ . කෙසේ වෙතත්, එවැනි ලේඛනයක් විගණනයට ඉදිරිපත් කිරීමට බැංකුව අපොහොසත් විය.			ලියකියවිලි පවත්වා ගැනීමේ දුර්වලතා පිළිබඳ ඔබගේ අවධානයට යොමු වූ කරුණු සමඟ අපි එකඟ වන අතර ඉදිරියේදී ලියකියවිලි පවත්වා ගතයුතු ආකාරය පිළිබඳ දැනුවත් කර ඇත.
(b) කාර්ය සාධන බැඳුම්කරය 2020 මාර්තු 05 දිනෙන් කල් ඉකුත් වී ඇති අතර එම බැඳුම්කරය දීර්ඝ කිරීම සඳහා ටෙන්ඩර් මණ්ඩලයේ ලේකම් විසින් 2020 පෙබරවාරි 26 වැනි දින ඉල්ලීමක් කර ඇත. කෙසේ වෙතත්, දීර්ඝ කරන ලද කාර්ය සාධන බැඳුම්කර	2022	නිරීකෂණය සමඟ ඒකඟ වේ. කනස්සල්ලට එකඟ වූ අතර අදාළ නිලධාරීන් සැපයුම්කරු සමඟ සාකච්ඡා කර 2023 මැයි මස අවසානය හෝ ඊට පෙර නැවුම් කාර්ය සාධන ආරක්ෂාවක් ඉදිරිපත් කිරීමට එකඟ වී ඇත. එවැනි අතපසුවීම් වළක්වා ගැනීම සඳහා, අපි අදාළ නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ආරම්භ කරන්නෙමු.	නිලධාරීන් සැපයුම්කරු සමඟ සාකච්ඡා කර 2023 මැයි මස අවසානය හෝ ඊට පෙර නව කාර්ය සාධන සුරක්ෂණයක් ඉදිරිපත් කිරීමට එකඟ වී ඇත. එවැනි අතපසුවීම් වළක්වා ගැනීම සඳහා අපි අදාළ නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ආරම්භ

විගණනයට ඉදිරිපත් කර නොතිබුණි..				කරන්නෙමු.

2.8 මානව සම්පත් කළමණාකරණය

පහත සඳහන් ප්‍රධාන කළමනාකරණ තනතුරු දීර්ඝ කාලයක් පුරප්පාඩු වී ඇති බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය බැංකුවේ කාර්ය සාධනය කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති කරනු ඇත. • නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ණය සහකාර සාමාන්‍යාධිකාරී – ණය (2022 දෙසැම්බර් 22 සිට) සහකාර සාමාන්‍යාධිකාරී (අයකිරීම්) • ප්‍රධාන තොරතුරු නිලධාරී •සහකාර සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී	2023	ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා බඳවා ගැනීම් කඩිනමින් සිදුකළ යුතු වේ.	**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -ණය (DGM –credit) සහකාර සාමාන්‍යාධිකාරී - ණය (AGM –credit) සහ සහකාර සාමාන්‍යාධිකාරී - අයකිරීම් - (AGM (Recovery)** ----------------------- පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා ඇත. බඳවා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී. **ප්‍රධාන තොරතුරු නිලධාරී සහ සහකාර සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ - (Chief Information officer & AGM – IT)** ප්‍රධාන තොරතුරු නිලධාරියා තොරතුරු	ණය සහ ප්‍රතිසාධන ප්‍රධානියා බඳවා ගැනීමට මණ්ඩලය අනුමත කර ඇත - එක් තනතුරක් (අමුණන ලද මණ්ඩල මිනිත්තුව බලන්න). 2024/09/08 දින 4 වන වරටත් නැවත ප්‍රචාරණය කරන ලදී. අපේක්ෂකයාගේ ඉහළ වැටුප් අපේක්ෂාව හේතුවෙන්. තොරතුරු තාක්ෂණ ප්‍රධානියා CIO ලෙස ක්‍රියා කළේය. මෙම තනතුර තවදුරටත් සංවිධානයේ

(2023 මාර්තු 04 සිට)

තාක්ෂණ අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.මෙවැනි තනතුරක් තවදුරටත් ආයතනය තුල පවත්වාගෙන යනු නොලැබේ.කෙසේ වෙතත් මානව සම්පත් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුව තොරතුරු තාක්ෂණ අංශය ප්‍රතිව්‍යුහ ගත කිරීම සඳහා උපාදේශකයකු බඳවා ගැනීමට හා නවCore Banking පද්ධතියක් ප්‍රතිශ්ඨානය කිරීමට තීරණය කර ඇත.විද්වත් යෝජනාව අනුව දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහ ගත කරනු ලැබේ.

ප්‍රධාන මෙහෙයුම් නිලධාරී(Chief Operating Officer)

ශාඛා සංඛ්‍යාව හා එහි ප්‍රමාණය අනුව මෙම තනතුර බැංකුවට අවශ්‍ය නොවන බවට මණ්ඩලය තීරණය කර ඇත.

නොතිබුණි.

කෙසේ වෙතත්, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම සහ නව මූලික බැංකු ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශකයෙකු පත් කිරීමට BHRC සහ මණ්ඩලය තීරණය කළහ. විශේෂඥ යෝජනාව මත දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කෙරේ.

ශාඛා සංඛ්‍යාව සහ ප්‍රමාණය අනුව බැංකුවට මෙම තනතුර අවශ්‍ය නොවන බව මණ්ඩලය තීරණය කළේය. DGM-ණය සහ ප්‍රතිසාධන සහ ප්‍රධාන කළමනාකරුවන් බඳවා ගැනීමට තීරණය කළ අතර ඔවුන්ට සහ ප්‍රධාන විධායක

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -ණය හා අයකිරීම් සහ ප්‍රධාන කළමණාකරු බඳවා ගැනීමට තීරණය කර ඇත ප්‍රධාන මෙහෙයුම් නිලධාරී රාජකාරි ප්‍රධාන විධායක නිලධාරීට අනුයුක්ත කර ඇත.	නිලධාරියාට COO හි ඇතැම් කාර්යයන් පවරන ලදී.

3.6 ප්‍රාදේශිය සංවර්ධන බැංකුව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	245,889,512,000	230,496,189,000	15,393,322,000	306,303,000	තත්ත්වාගණනය නොකළ
2022	285,395,150,000	269,169,023,000	16,226,127,000	1,349,395,000	තත්ත්වාගණනයනො කළ
2023	299,717,438,000	281,851,716,000	17,865,722,000	863,518,000	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. වලට අනුගත වීම හේතුවෙන් අතිරේක ගණනය කිරීම් පැනනගී. බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. වලට සම්බන්ධ සටහන් පොදු ලෙජරයට ගැලපීමකින් තොරව සෘජුවම මූල්‍ය ප්‍රකාශන වලට සටහන් පැනවීම.	2021, 2022, 2023	මූල්‍ය ප්‍රකාශන සැකසීමට අදාළ අභ්‍යන්තර පාලන ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්න.	කළමනාකාරීත්වය විසින් වැළැක්වීමේ පියවර ගෙන නොමැත.	මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්ව ය විසින් පියවර ගෙන නොමැත.
(ආ)	තනි පුද්ගල සැලකිය යුතු පාරිභෝගිකයින් සඳහා සමාලෝචන ක්‍රියාවලියක් නොතිබීම හානිකරණ ගණනය කිරීමේ ක්‍රියාවලියේ සඵලතාවයට බාධාවක් විය හැකි අතර තවදුරටත් වැඩිදියුණු කිරීම් අවශ්‍යවේ.	2021, 2022, 2023	හානිකරණ ගණනය කිරීමේ ක්‍රියාවලියේ නිරවද්‍යතාවය නිරීක්ෂණය කිරීම සහ සහතික කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක්	කළමනාකාරීත්වය විසින් වැළැක්වීමේ පියවර ගෙන නොමැත.	මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්ව ය විසින් පියවර ගෙන නොමැත.

			ස්ථාපිත කිරීම.		
(ඈ)	එකම විස්තරය යටතේ පොදු ලෙජර ගිණුම් කිහිපයක් බැංකුව විසින් නිර්මාණය කර ඇති අතර එමගින් අදාළ ලෙජර ගිණුම්වලට සටහන් ඇතුලත් කිරීමේදී ව්‍යාකූල වේ. තවද, සමහර ආදායම් ගිණුම් සම්බන්ධයෙන් ඍණ ශේෂයන් නිරීක්ෂණය විය.	2021,2022,2023	මූල්‍ය ප්‍රකාශන සැකසීමට අදාළ අභ්‍යන්තර පාලන ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.	තොරතුරු තාක්ෂණ අංශය සමඟ සම්බන්ධීකරණයෙන් සහ සීබීඑස් විකුණුම්කරු සමඟ සහයෝගයෙන් අදාළ ලෙජර් ගිණුම්වල ගැටලු විසඳීමට කටයුතු කරනු ඇත.	කෙසේවෙතත්, මේ ගැටළුව තවමත් විසඳී නොමැත.
(ඈ)	2023 දෙසැම්බර් 31 දිනට ණය ප්‍රධාන ගොනුවට අනුව ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශය වල සටහන් අංක 21 ට අනුව ශේෂයන් අතර,ලැබිය යුතු අවසාන ණය ශේෂය හා ලැබිය යුතු පොලී සම්බන්ධයෙන් රු. 46,401,371 ක වෙනසක් නිරීක්ෂණය කරන ලදී.	2023	තවදුරටත් ප්‍රමාදයකින් තොරව නොගැලපෙන වාර්තා සමථයකට පත් කිරීමට සහ පොදු ලෙජරයේ දක්වා ඇති ශේෂයේ නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.	මෙම ගැටළුව නිවැරදි කිරීම් සඳහා කටයුතු කරනු ඇත.	කෙසේවෙතත්, මේ ගැටළුව තවමත් විසඳී නොමැත.
(ඉ)	2023 දෙසැම්බර් 31 දිනට කල්බදු (හස්තමය) ප්‍රධාන ගොනුවේ සහ පොදු ලෙජර් ශේෂයේ හිඟ ශේෂයන් අතර රුපියල් 47,047,552ක වෙනසක් නිරීක්ෂණය විය.	2023	තවදුරටත් ප්‍රමාදයකින් තොරව නොගැලපෙන වාර්තා සමථයකට පත් කිරීමට සහ පොදු ලෙජරයේ දක්වා ඇති ශේෂයේ නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.	බැංකුවේ ලීසිං අංශයේ අදාළ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් වෙනස ඉවත් කර ගැනීමට සහ 2024 දෙසැම්බර් 31 දිනට පෙර වෙනස සමථයකට පත් කිරීමට කටයුතු කරනු ඇත.	කෙසේවෙතත්, මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්වය විසින් තවමත් පියවර ගෙන නොමැත.

(ඊ)	2023 දෙසැම්බර් 31 දිනට "අක්‍රීය ණය සඳහා අවිනිශ්චිත පොලී " පොදු ලෙජර ගිණුමට අදාළව (පොදු ලෙජර අංක 230110105), පොදු ලෙජරයට අනුව ශේෂය සහ ශේෂ පිරික්සුම අනුව ශේෂය අතර රු.42,429,586 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් , මෙම වෙනස පද්ධතියට ඇතුළු නොකර හස්තමය ලෙස පවත්වාගෙන යාම කර ඇත.	2023	තවදුරටත් ප්‍රමාදයකින් තොරව නොගැලපෙන වාර්තා සමථයකට පත් කිරීමට සහ පොදු ලෙජරයේ දක්වා ඇති ශේෂයේ නිරවද්‍යතාවය සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.	මෙම ගැටළුව නිවැරදි කිරීම් සඳහා කටයුතු කරනු ඇත.	කෙසේවෙතත්, මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්වය විසින් තවමත් පියවර ගෙන නොමැත.
(උ)	රඳවා ගැනීමේ බද්ද (ඩබ්එච්ටී) අඩු කිරීමට අදාළ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2022 දෙසැම්බර් 23 දින නිකුත් කරන ලද අංක: එස්ඊසී/2022/ඊ/03 චක්‍රලේඛයේ 7 වැනි වගන්තියට අනුව, ඩබ්එච්ටී අඩු කළ සෑම නියෝජිතයකුම ඩබ්එච්ටී අඩු කළ මාසය අවසන් වී දින 30ක් ඇතුළත ඩබ්එච්ටී සහතිකයක් නිකුත් කිරීම අවශ්‍ය වේ. එබැවින්, වෙනත් මූල්‍ය ආයතන විසින් අඩු කරන ලද පොලී මත ඩබ්එච්ටී වලට අදාළ ඩබ්එච්ටී සහතික බැංකුව විසින් එකතු කළ යුතුය. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන අංක: 28 හි ලැබිය යුතු (ගිණුම් අංක: 140105155) යටතේ ඇතුළත් වූ රුපියල් 234,542,876 ක ඩබ්එච්ටී	2023	තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඩබ්එච්ටී සහතික ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.	ඩබ්එච්ටී සහතික අදාළ ආයතනයෙන් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.	කෙසේවෙතත්, මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්වය විසින් තවමත් පියවර ගෙන නොමැත.

<table>
<tr><td></td><td>ලැබිය යුතු ශේෂයට අදාළ ඩබ්එච්ටී සහතික නොතිබුණි.</td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>(ඌ)</td><td>නිරීක්ෂණයට අනුව, පහත දැක්වෙන පොදු ලෙජර් (ජීඑල්) ගිණුම් ශේෂයන් කිසිදු ගනුදෙනුවකින් තොරව යම් කාල සීමාවක් තුළ වගකීමක් ලෙස ඉදිරියට ගෙන ගොස් තිබුණි. විස්තර පහතින් දක්වා ඇත.
<table>
<tr><th>විස්තර</th><th>වටිනාකම (රු.)</th><th>අවසන් ගණුදෙනු දිනය</th></tr>
<tr><td>කි ඇණු ගබඩාවට යන්ත්‍රෝපකරණ ගැනීම</td><td>1,857,543</td><td>01.02.2018</td></tr>
<tr><td>රණවිරු දිවිනැගුම චක්‍රීය අරමුදල</td><td>213,772,526</td><td>27.03.2019</td></tr>
<tr><td>ගෙවිය යුතු වන්දි -එල්ඩීබී</td><td>30,781,727</td><td>25.02.2021</td></tr>
</table></td><td>2023</td><td>දිගුකාලීන හිඟ ශේෂයන් තවදුරටත් ප්‍රමාදයකින් තොරව පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.</td><td>2024 දෙසැම්බර් 31 දිනට පෙර ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

රණවිරු සේවා අධිකාරිය මෙම අරමුදල ආරම්භ කළ පාර්ශ්වය වන බැවින් එම අධිකාරිය සමඟ සාකච්ඡා කර එම මුදල් යොදවා නව ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරනවා.

මෙම ජීඑල් හි ශේෂයන් එල්ඩීබී, ආර්ඩීබී සමඟ ඒකාබද්ධ කිරීමට අදාළව ඇති ඕනෑම බැඳීමක් ගෙවීම සඳහා භාවිතා කර ඇත.</td><td>කෙසේවෙතත්, මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්වය විසින් තවමත් පියවර ගෙන නොමැත.

කෙසේවෙතත්, මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්වය විසින් තවමත් පියවර ගෙන නොමැත.

කෙසේවෙතත්, මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්වය විසින් තවමත් පියවර ගෙන නොමැත.</td></tr>
<tr><td>(එ)</td><td>රුපියල් 5,563,554.97 ක් වූ ස්ථාවර තැන්පතු සංඛ්‍යාව 5169 ක් වසර කිහිපයක් (2007 සිට) බැංකුව විසින් පොලී නොගෙවා හෝ අලුත් කිරීමකින් තොරව තබා ගෙන ඇති බව නිරීක්ෂණය විය.</td><td>2023</td><td>තවදුරටත් ප්‍රමාදයකින් තොරව ශේෂයන් පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.</td><td>2024 දෙසැම්බර් 31 දිනට ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.</td><td>වාර්තා කරන දිනය වන විට ගනුදෙනුකරුවන් විසින් ගිණුම් කිහිපයක් ආපසු ලබාගෙන ඇත.</td></tr>
<tr><td>(ඒ)</td><td>පෙන්නුම් කරන පරිදි ප්‍රසම්පාදන තීරණවල නිසි උපායමාර්ගික සමාලෝචනයක්</td><td>2023</td><td>අනාගතයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර</td><td>කළමනාකාරීත්වය විසින් කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොමැත.</td><td>මෙතෙක් කළමනාකාරීත්වය විසින් පියවර ගෙන නොමැත.</td></tr>
</table>

නොමැතිකම නිසා එවැනි තීරණ ක්‍රියාත්මක කිරීමට පෙර පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය, ශක්‍යතා අධ්‍යයනය සහ අවදානම් තක්සේරු කිරීම් සිදු නොකිරීම: උදා. වීසා ඩෙබිට් කාඩ්පත් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය දැනට බැංකුව විසින් ආරම්භ කර ඇතත්, සමස්ත පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය, ශක්‍යතා අධ්‍යයනය සහ අවදානම් තක්සේරුව ඇතුළුව සවිස්තරාත්මක ඇගයීම් පිළිබඳ සාක්ෂි නොමැත. මේ අතර, බැංකුව විසින් නිසි ඇගයීමකින් තොරව වීසා ඩෙබිට් කාඩ්පත වෙත මාරු වෙමින් ජේසීබී ඩෙබිට් කාඩ්පත් මිලදී ගෙන ඇත.	එවැනි විශ්ලේෂණයක් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.

3.7 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	බදු පසු ලාභය (අලාභය)	මතය
	රු.	රු.	රු.	රු.	
2021	53,323,053,000	47,039,481,000	6,283,573,000	252,989,000	තත්ත්වාගණනය නොකළ
2022	56,964,945,000	50,490,460,000	6,474,485,000	201,798,000	තත්ත්වාගණනයනො කළ
2023	59,066,511,000	53,612,342,000	5,454,169,000	(1,003,131,000)	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	ණය පියවූ පසුවත් සේවක අර්ථසාධක අරමුදල් ණය සඳහා වාරික ලද අවස්ථා නිරීක්ෂණය විය. එවැනි ලද ගෙවීම් “ගනුදෙනුකරුවන්ට ආපසු ගෙවීමේ වසාදැමූ ණය ගිණුම” ට බැර කර තිබූ අතර 2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහ එම ගිණුමේ සමුච්චිත ශේෂය රු.25,241,363ක් විය.	2021, 2022, 2023	දිගුකාලීන හිඟ ශේෂයන් සාධාරණ කාලයක් තුළ පාරිභෝගිකයාට දැනුම් දීමට සහ ආපසු ගෙවීමට බැංකුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.		පෙර වර්ෂයේ ශේෂය රුපියල් 48,931,177 ක් වූ අතර, පසුගිය වසර හා සසඳන විට ශේෂයේ රුපියල් 23,689,814 ක අඩුවීමක් නිරීක්ෂණය විය.
(ආ)	විවිධ හේතු නිසා අදාළ ණය ගිණුමට හෝ පාරිභෝගිකයාගේ ඉතිරි කිරීමේ ගිණුමට බැර නොවීම හේතුවෙන් ගනුදෙනුකරුවන් විසින් ඔවුන්ගේ ණය ගිණුම් සඳහා කළ ගෙවීම් “විසර්ජනය නොකළ ණය	2021,2022,2023	පැරණි හිඟ ශේෂයන් හඳුනාගෙන සාධාරණ කාල සීමාවක් තුළ බේරුම් කළ යුතුය.	බැංකුව විසින් 2023 වර්ෂය තුළ හඳුනාගෙන ඇති දිගු හිඟ ශේෂයන් සැලකිය යුතු ප්‍රමාණයක් ආපසු ගෙවාඇත.	පෙර වර්ෂයේ අනුරූපී ශේෂය රුපියල් 62,948,841 ක් වූ අතර එම නිසා පසුගිය වසර හා සසඳන විට ශේෂයේ රුපියල් 24,012,878 කින්

ශේෂ ගිණුම" නම් වූ ගිණුමකට බැර කර තිබුණි. ණය ගණන 16,587ක් සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ සමුච්චිත ශේෂය රු.38,935,963ක් විය. විස්තර පහත දැක්වේ.

වර්ෂය	ණය ගණන	වටිනාකම (රු.)
Before 2020	689	3,133,424
2020	2,474	2,327,850
2021	270	851,451
2022	9,142	6,766,853
2023	4,012	25,856,385
Total	**16,587**	**38,935,963**

අඩුවීමක් නිරීක්ෂණය විය.

(ඇ) බැංකුව විවිධ නිෂ්පාදන කාණ්ඩ යටතේ ණය පහසුකම් ලබා දී ඇත. පසුගිය වසර තුනක කාලය තුළ විවිධ නිෂ්පාදන කාණ්ඩ සහ නිෂ්පාදන කාණ්ඩ අනුව අක්‍රිය ණය අනුපාතය අතර ණය පහසුකම් බෙදා හැරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

i) වතු කාණ්ඩ ඇතුළුව පුද්ගලික, පුද්ගලික උකස්, උකස් සහ සේ.අ.අ. ණය පසුගිය වසර තුනක කාලය තුළ බැංකුවේ ප්‍රධාන නිෂ්පාදන කාණ්ඩ වූ අතර එය බැංකුවේ මුළු ණය කළඹෙන් සියයට 95 කට දායක විය.

2023

ණය කළඹ විවිධාංගීකරණය කිරීමට සහ EPF ණයවල NPL අනුපාතය අඩු කිරීමට පවතින පද්ධති වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.

ණය ආපසු අයකරගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග ශක්තිමත් කර ඇත.

ණය කළඹ විවිධාංගීකරණය කිරීමට බැංකුව විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. NPL අනුපාතය 2022 ට සාපේක්ෂව 2023 දී වැඩි වී ඇත.

	ii) ක්ෂුද්‍ර හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය ඇතුළු ආර්ථිකයේ අනෙකුත් අංශ සඳහා ණය ලබා දීමේ බැංකුවේ දායකත්වය ඉතා නොවැදගත්ය.				
	iii) වතු ණය කාණ්ඩය සහ සේ.අ.අ. ණය කාණ්ඩය පසුගිය වසර තුනක කාලය තුළ බැංකුවේ ඉහළම අක්‍රිය ණය අනුපාත වාර්තා කරන ලදී.				
(ඈ)	2023 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අක්‍රීය ණය/අදියර 3 ණය අනුපාතය සියයට 25.99 කි. කෙසේ වෙතත්, EPF ණය ආපසු අයකර ගැනීමේ හැකියාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහතික කරනු ලබන අතර, එබැවින් EPF ණය හැර ගණනය කරන ලද බැංකුවේ අක්‍රීය ණය / අදියර 3 ණය අනුපාතය සියයට 12.32 ක අඩු ප්‍රතිශතයක් පෙන්නුම් කලද බලපත්‍රලාභී විශේෂිත බැංකු කර්මාන්තයේ සාමාන්‍යය අනුපාතය වන සියයට 10.6 ට වඩා වැඩි වූවකි. එහි විස්තර පහත දැක්වේ.	2023	බැංකුවේ අක්‍රිය ණය අනුපාතය අවම කිරීම සඳහා සතුටුදායක ක්‍රියාමාර්ග ගත යුතුය.	ණය ආපසු අයකරගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග ශක්තිමත් කර ඇත.	NPL අනුපාතය 2024 දී තවදුරටත් වැඩිවී ඇත.

විස්තරය	31.12.2023	31.12.2022
NPL අනුපාතය (සියලු ණය)		
මුළු ණය සහ අත්තිකාරම් (රුපියල් මිලියන)	41,007	41,117
මුළු අක්‍රිය ණය / අදියර 3 ණය (රුපියල් මිලියන)	10,659	9,054
අක්‍රිය ණය / අදියර 3 ණය අනුපාතය (%)	25.99%	22.02%
NPL අනුපාතය (EPF ණය හැර)		
මුළු ණය (EPF ණය හැර) (රුපියල් මිලියන)	32,167	32,736
මුළු අක්‍රිය ණය (EPF ණය හැර) (රුපියල් මිලියන)	5,051	3,262
අක්‍රිය ණය / අදියර 3 ණය අනුපාතය (%)	15.7%	9.97%

(ඉ)	1984 අංක 29 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු (සංශෝධන) පනතට අනුව සුදුසුකම්ලත් පුද්ගලයින් නව දෙනෙකු පත් කළ යුතු වුවද අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන්නේ අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් පමණි.	2023	අධ්‍යක්ෂ මණ්ඩලයට නියමිත අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පත් කිරීමට කටයුතු කල යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලයට නියමිත අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පත් කිරීමට කටයුතු කර නොමැත.	අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන්නේ අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් පමණිග
(ඊ)	2017 අංක 05 සහ 2022 අංක 04 දරන බැංකු පනත් විධාන මගින් නියම කර ඇති පරිදි රුපියල් බිලියන 7.5 ක අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවය 2023 දෙසැම්බර් 31 දිනට පෙර බැංකුව විසින් සම්පූර්ණ කර නොමැත.	2023	අවම නියාමන ප්‍රාග්ධනය බැංකුව විසින් පවත්වාගෙන යා යුතුය.	ප්‍රාග්ධනය රැස් කිරීම සඳහා. පැවතීමේ ණය (Perpetual Dedt) ලබාගැනීමට මුදල් අමාත්‍යාංශයෙන් එකඟතාවය ලබා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් සිදු කර ඇත.	2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මුළු ප්‍රාග්ධන වටිනාකම රුපියල් 6,474,484,706 ක් පමණි.

(උ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 150(3) වගන්තිය මගින් ආපසු ගෙවීම සඳහා අයදුම් කිරීමට වසර හතරක සහන කාලයක් ලබාදී තිබුණද, DRL සහ NBT ලැබිය යුතු ශේෂයන් පිළිවෙලින් රුපියල් 3,603,588 සහ 15,591,023 ක් මූල්‍ය ප්‍රකාශන තුළ නිරීක්ෂණය විය.	2022,2023	දිගුකාලීන ලැබිය යුතු මුදල් ආපසු අයකර ගැනීමට හෝ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට පියවර ගත යුතුය.	DRL සහ NBT ලැබිය යුතු ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට හෝ අයකර ගැනීමට ක්‍රියා කර නොමැත.	DRL සහ NBT ලැබිය යුතු ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට හෝ අයකර ගැනීමට ක්‍රියා කර නොමැත.
(ඌ)	බැංකුවේ තොරතුරු පද්ධතියෙහි ධාරිතාවය ප්‍රමාණවත් නොවන අතර පද්ධතිය තුළ යම් වැදගත් දත්ත පවත්වා ගැනීමටත් අවශ්‍ය අවස්ථාවලදී දත්ත සහ පද්ධති උපස්ථ ලබාගැනීමටත් නොහැකි වී ඇත.	2023	තොරතුරු පද්ධතිය කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා බැංකුව ප්‍රමාණවත් ගබඩා ධාරිතාවක් පවත්වා ගත යුතුය.	තොරතුරු පද්ධතියේ ගබඩා කිරීමේ ධාරිතාව වැඩි කිරීමට පියවර ගෙන නොමැත.	තොරතුරු පද්ධතියේ ගබඩා කිරීමේ ධාරිතාව වැඩි කිරීමට පියවර ගෙන නොමැත.
(එ)	පසුගිය මාසයේ මුළු ණය කළඹ වැඩ කරන දින 5ක් ඇතුළත ණය තොරතුරු කාර්යාංශයට (CRIB) යැවිය යුතුය. කෙසේ වෙතත්, අලුතින් හඳුන්වා දී ඇති ආයතනික ණය සහ පොලී සහන ණය පිළිබඳ විස්තර යැවීම මාස 30 කාලයක් ප්‍රමාද වී තිබුණි.	2023	නියමිත කාල සීමාව තුළ අදාල තොරතුරු CRIB වෙත යැවිය යුතුය.	නව හර බැංකු පද්ධතිය බැංකු ක්‍රියාත්මක කිරීමත් සමඟ CRIB වෙත වාර්තා කිරීමේ ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා දත්ත පිරිසිදු කිරීමේ ක්‍රියාකාරකම් සිදු වෙමින් පවතී. ආයතනික ණය සහ සහන ණය පිළිබඳ විස්තර CRIB වෙත පසුව යොමුකර තිබුණි.	ආයතනික ණය සහ සහන ණය පිළිබඳ විස්තර CRIB වෙත පසුව යොමුකර තිබුණි.
(ඒ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2 වගන්තියට අනුව සකස් කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම බැංකුව විසින් සකස් කර	2023	2006 ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට බැංකුව විසින් කටයුතු ක යුතුය.	ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම බැංකුව විසින් සකස් කර නොතිබුණි.	ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම බැංකුව විසින් සකස් කර නොතිබුණි.

නොතිබුණි.

(ඔ)	ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික රජයේ ප්‍රසම්පාදන පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2019 දෙසැම්බර් 17 දිනැති PED චක්‍රලේඛ අංක 08/2019 අනුව, සියලුම රාජ්‍ය ආයතන 2020 ජනවාරි 31 ට පෙර ජාතික e-GP පද්ධතිය සමඟ ලියාපදිංචි විය යුතුය. කෙසේ වෙතත් e-GP පද්ධතිය සමඟ ලියාපදිංචි වීම සඳහා බැංකුව කටයුතු කර නොතිබුණි.	2023	ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන ක්‍රමය ක්‍රියාත්මක කිරීමට බැංකුව කටයුතු කල යුතුය.	බැංකුව විසින් ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන ක්‍රමය ක්‍රියාත්මක කර නොමැත.	බැංකුව විසින් ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන ක්‍රමය ක්‍රියාත්මක කර නොමැත.
(ඕ)	අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණවත් බව සහ අඛණ්ඩතාව සමාලෝචනය කළ යුතුය. කෙසේ වෙතත්, වර්තමානයේ බැංකුව ඔවුන්ගේ කළමනාකරණ තොරතුරු පද්ධතිය ලෙස AS400 භාවිතා කරන අතර එය තොරතුරු සහ වාර්තා උත්පාදනය කිරීමේදී කර්මාන්ත අවශ්‍යතා සඳහා පහසුකම් සපයනු නොලැබේ.	2022	බැංකුවේ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණවත් බව සහ අඛණ්ඩතාව මණ්ඩලය විසින් සහතික කළ යුතුය.	හර බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.	හර බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති අතර ව්‍යාපෘතිය දත්ත සංක්‍රමණ අදියරෙහි පවතී.

3.8 මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සි

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පසු ලාභය (අලාභය) රු.	මතය
2021	34,277,459,000	30,108,504,000	4,168,955,000	529,044,000	තත්ත්වාගණනය නොකළ
2022	31,231,781,000	27,536,237,000	3,695,544,000	(495,608,000)	තත්ත්වාගණනය නොකළ
2023	33,699,122,000	30,028,450,000	3,670,672,000	20,888,000	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී, ආපසු අයකර ගැනීමට නොහැකිවීම මත අක්‍රිය ණය සහ අත්තිකාරම් රු.47,777,741 ක් දක්වා ලියා හැර තිබුණි.	2021	ණය ලියා හැරීමට ප්‍රථම ආපසු අයකර ගැනීමට හැකි සෑම ප්‍රයත්නයක්ම ගැනීමට නිර්දේශ කෙරේ.	නැවත අයකර ගැනීම සඳහා කළ හැකි සියලු ක්‍රියාමාර්ග සලකා බැලීමෙන් අනතුරුව, අවසාන විකල්පය ලෙස ලියා හැරීමේ යෝජනාව අනුමැතිය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. සෑම ලියා හැරීමක් සඳහාම සාධාරණීකරණය කරමින් විස්තරාත්මක පත්‍රිකාවක් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.	අයකර ගැනීමට සියළු ප්‍රයත්නයන් ගැනීමෙන් පසු සමාගමේ ප්‍රතිපත්තිය අනුව මණ්ඩල අනුමැතිය ඇතිව ලියාහැර ඇත.
(ආ)	2021 වර්ෂය තුළ අංගනයේ පැවති වාහන බැහැර කිරීම සම්බන්ධයෙන් පවත්නා තොරතුරුවලට අනුව, අංගනයේ පැවති වාහන	2021	සමාගමට සිදුවිය හැකි පාඩු අවම වන පරිදි විචක්ෂණශීලීව තීරණ ගැනීමට නිර්දේශ කෙරේ.	බැහැර කිරීමේ තීරණය ඉවත් කිරීමේ කමිටුව විසින් ගනු ලැබේ. බැහැර කිරීමේ කමිටුව තීරණ ගැනීමේදී සෑම විටම	වියහැකි අලාභ අවම කිරීමට සමාගමේ ඉවත් කිරීමේ කමිටුව විසින් තීරණ ගනු ලැබේ.

	296 ක් බැහැර කර තිබුණි. මෙම වාහන අතර වාහන 274 ක් ඉවත් කර ඇත්තේ එම වාහනවලින් අයකරගත යුතු සම්පූර්ණ හිඟ වටිනාකමට වඩා අඩුවෙනි. එම වාහන සඳහා අයකර ගැනීමට නියමිත සම්පූර්ණ හිඟ මුදල රු.794,099,816ක් වූ අතර සමස්ත බැහැර කළ වටිනාකම රු.352,612,690ක් විය. එබැවින් අංගනයේ පැවති වාහන බැහැර කිරීමෙන් රු.441,487,125ක අලාභයක් සිදුව තිබුණි.			සමාගමට සිදුවිය හැකි පාඩු අවම කිරීමට වග බලා ගත යුතු වේ. එසේම වාහනය බැහැර කිරීමෙන් අනතුරුව සහ සමාගමේ පොත්වල බැහැර කිරීමේ අලාභයක් සටහන් වූ සෑම අවස්ථාවකම ණය ගැනුම්කරුට සහ ඇපකරුවන්ට බැහැර කිරීමේ අලාභය සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කරනු ඇත.	
(ඇ)	හඳුනා නොගත් සෘජු තැන්පතු, ඉදිරිපත් නොවූ ගෙවීම්, පාරිභෝගික එකතු කිරීමේ ගිණුම් සහ වැටුප් පාලන ගිණුම්වල වසර 1 සිට වසර 5 ට වැඩි කාලසීමාවක් සඳහා එකතුව රුපියල් 154,783,481 ක දීර්ඝ කාලයක සිට හිඟව පවතින ශේෂ නිරීක්ෂණය විය. එම දීර්ඝකාලීන හිඟ ශේෂයන් පිළිබඳ කාල විශ්ලේෂණය පහත වගුවේ දක්වා ඇත.	2022	දීර්ඝ කාලීන හිඟව පවතින ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට හා සමාගමේ නියෝග සහ ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු බව නිර්දේශ කෙරේ.	<u>හඳුනා නොගත් සෘජු තැන්පතු</u> අදහස් දැක්වීම සටහන් කරගන්නා ලදී. මේවා විමර්ශන ක්ෂේත්‍රයේ කිසිදු හඳුනාගැනීමකින් තොරව ගණුදෙනුකරුවන් විසින් කරන ලද සෘජු තැන්පතු වේ. මණ්ඩලයේ අනුමත දිගුකාලීන හිඟ ශේෂ ඉවත් කිරීමේ ප්‍රතිපත්තියට අනුව දිගුකාලීන හිඟ ශේෂ ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. මීට අමතරව, සාධාරණීකරණයක් සහිතව කෙටි කාලසීමාවක් සමග ඕනෑම දිගුකාලීන හිඟ ශේෂයන් ඉවත් කිරීමට ප්‍රතිපත්තිය	වර්තමාන දිගු හිඟ ශේෂ ප්‍රතිපත්තිය අනුව,සෑම වර්ෂ 5 කට වරක් ශේෂ ගිණුම් පොත්වලින් ඉවත් කරන අතර ,එම නිසා 2019 වර්ෂයට අදාල ශේෂ 2024 වර්ෂයේදී නිරවුල් කෙරේ.

	හිඟ කාලසීමාව (වර්ෂ)				
ශේෂය	0 – 1 (රු. මිලියන)	1 – 3 (රු. මිලියන)	3 – 5 (රු. මිලියන)	වසර 5 ට වැඩි (රු. මිලියන)	එකතුව (රු. මිලියන)
හඳුනා නොගත් සෘජු තැන්පතු	2.83	4.53	5.15	6.38	18.89
ඉදිරිපත් නොවූ ගෙවීම්	0.54	1.37	0.49	1.67	4.07
පාරිභෝගික එකතු කිරීමේ ගිණුම්	5.48	1.30	0.53	100.03	107.34
වැටුප් පාලන ගිණුම්	23.62	0.63	0.19	0.04	24.48
එකතුව	32.48	7.83	6.36	108.12	154.78

සංශෝධනය කෙරේ.

<u>ඉදිරිපත් නොවූ ගෙවීම්</u>

මූල්‍ය අංශය විසින් ඉවත් කිරීම සඳහා අදාල අංශ සමග පසු විපරම් සිදු කරයි. ඉතිරි ඕනෑම ශේෂයක් මාස 06 කට පසු දෙන ලද පොදු ලෙජර ගිණුමකට මාරු කෙරේ. මණ්ඩලයේ අනුමත දිගුකාලීන හිඟ ශේෂ ඉවත් කිරීමේ ප්‍රතිපත්තිය අනුව දිගුකාලීන හිඟ ශේෂ ඉවත් කෙරේ.

<u>පාරිභෝගික එකතු කිරීමේ ගිණුම්</u>

ශේෂය අතරින් රු. මිලියන 100, එම්එස්බී හි ආයෝජනයක් සඳහා නවාරා කැපිටල් වෙතින් ලද අත්තිකාරම් අරමුදල්වලට අදාල වේ. කොන්දේසි කඩ කිරීම හේතුවෙන් එකඟ වූ ආයෝජනය සිදු නොවීය. ඉන් අනතුරුව නවාරා කැපිටල් විසින් ගෙවන ලද අත්තිකාරම ආපසු ලබාදීම සඳහා නිතිමය ක්‍රියාමාර්ග ගොනු කර ඇත. අදාල නඩුව අවසාන අදියරේ පවතී. නඩුව අවසන් වන තුරු ශේෂය පවත්වා ගත යුතුය. මෙම මුදල පාරිභෝගික එකතුවක් නොවන බැවින් ශේෂය සුළු ණයහිමි ගිණුමකට මාරු කරනු ලැබේ.

පාරිභෝගික

				එකතුකිරීම් නිරවුල් කිරීමට අදාල වන වෙනත් ශේෂයන් කොන්ත්‍රාත් නිරවුල් කිරීමත් සමග ඉවත් වේ. දිගු කාලයක් හිඟව පවතින ඕනෑම ශේෂයක් සමාගමේ ප්‍රතිපත්තිය අනුව ඉවත් කෙරේ. <u>වැටුප් පාලන ගිණුම</u> අදහස් දැක්වීම සටහන් කරගන්නා ලදී. 2017 සිට 2020 දක්වා ශේෂ දැනටමත් ඉවත් කර ඇත. අනෙකුත් දිගු කාලීන හිඟ ශේෂයන් ඉවත් කෙරෙමින් පවතී.	
(ඇ)	2018 මූල්‍ය ව්‍යාපාර පනත අංක 3 දරන නියෝගය , 1 වගන්තියේ විශේෂයෙන් දක්වා ඇති අවම නියාමන මට්ටම ඉක්මවා ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය පවත්වා ගැනීමට සමාගම අපොහොසත් වී ඇත. 2022 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සියයට 12.01 ක් වන අතර එය අවම නියාමන අවශ්‍යතාවය වන සියයට 12.5 ට වඩා අඩුය.	2022	උපුටා දක්වන ලද නියෝගයට අනුකූලවීම අවශ්‍ය වේ.	අදහස් දැක්වීම සටහන් කරගන්නා ලදී. වර්තමානයේදී සමාගම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයේ අවශ්‍යතාවයට අනුකූල වේ.	වර්තමානයේදී මෙය අනුකූල වේ.
(ඉ)	2022 වර්ෂය තුල සමාගම විසින් නැවත අත්කරගත් වාහන 96 ක් අලෙවි කර තිබුණි. කෙසේ වෙතත්, එම වාහන 96 අතරින් වාහන 67 ක් තක්සේරු	2022	සමාගමට සිදුවිය හැකි පාඩු අවම වන පරිදි විචක්ෂණශීලීව තීරණ ගැනීමට නිර්දේශ කෙරේ.	වාහන මෙහෙයුම් ක්‍රියාපරිපාටියේ නිර්ණායක තුල වාහන බැහැර කිරීම සිදු කරනු ලැබේ. මෙම විධිවිධාන යටතේ වාහනවල බල	එවන ලද පිළිතුරෙහි සඳහන් කරුණු සැලකීමේදී, බල කරනලද විකුණුම්

	වාර්තාවේ සඳහන් බල කරනලද විකුණුම් වටිනාකමට වඩා අඩු මිලකට අලෙවි කර තිබුණි. මෙම ගණුදෙනුවෙන් සමාගමට සිදුවූ සමස්ත පාඩුව රු.17,818,600 කි.		කරනලද විකුණුම් වටිනාකමට වඩා අඩු ඉදිරිපත් කිරීමක් ලැබුණු තත්වයක් තුල බැහැර කිරීමේ කමිටුව බැහැර කිරීමේ තීරණයකට පැමිණේ. සමාලෝචිත කාලසීමාව ඇතුලත වාහනවල අගය දැඩිලෙස පිරිහුණු අතර විශේෂයෙන් ඉන්පසුව ඇතිවූ දේශපාලන අස්ථාවරත්වය හා ආර්ථික අර්බුදය නිසා වාහන බල කරනලද විකුණුම් වටිනාකමට බැහැර කිරීම සිදුකළ නොහැකි විය.කෙසේ වෙතත්, බල කරනලද විකුණුම් වටිනාකමට සියයට 20 කට වඩා අඩුවෙන් වාහන බැහැර කළද , සියළුම වාහන ගණුදෙනු ලාභ මත බැහැර කිරීමට සමාගමට හැකිවිය. ප්‍රතිපත්තියක් වශයෙන් බල කරනලද විකුණුම් වටිනාකමට සියයට 80 කට වඩා ඉහලින් වාහන බැහැර කිරීමට බැහැර කිරීමේ කමිටුව තීරණය කර තිබුණි.	වටිනාකමට අඩුවෙන් ඉවත් කිරීමට ඉවත් කිරීමේ කමිටුව තීරණය කර තිබුණි.
(ඊ)	සමාගම විසින් 2018 සිට 2022 2021 දක්වා කිහිප වතාවකදී විශේෂිත ගණුදෙනුකරුවෙකුට කෙටි කාලීන ණය, කාලීන ණය සහ ණය සහන ණය පහසුකම් ප්‍රදානය කර තිබුණි.2021	සමාගම විසින් මුළු හිඟ මුදල ගණුදෙනුකරුගෙන් හෝ ඇපකරුගෙන් අය කර ගැනීම සඳහා සතුටුදායක ක්‍රියාමාර්ග ගත	ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශිත සහන පැකේජ යටතේ ශීර්ෂගත පහසුකම ප්‍රතිව්‍යුහගත කර ඇත.වසංගත තත්වය හා අයහපත් ආර්ථික තත්වය	හිඟ ශේෂ අයකර ගැනීමට නීතිමය කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

වර්ෂයේදී එම ගණුදෙනුකරුගේ අවිධිමත් ගෙවීම් රටාව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සහන වැඩසටහන අනුව, සමාගම විසින් ඉහත සියළු ණය රු. 38,644,244 ක එක් ණය මුදලකට හරවා පහසුකම ප්‍රතිව්‍යුහගත කර තිබුණි. ප්‍රතිව්‍යුහගත පහසුකම පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ.

- ණය පටිපාටි අත්පොත අනුව ප්‍රතිව්‍යුහගත ක්‍රියාවලියට ප්‍රවේශවීමට පෙර සමාගම විසින් ණය ගැණුම්කරුගේ ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳ ඇගයීමක් සිදුකොට නොතිබුණි.
- ණය ගැණුම්කරුගේ අසතුටුදායක ණය තොරතුරු කාර්යාංශ ඉතිහාසය පිළිබඳ සලකා බලා නොතිබුණි.සීබීයු/2021/606/016 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව, පසු ණය මෙහෙයුම් අංශය විසින් ව්‍යාපාර කාර්යසාධනය පිළිබඳ කාලීන සමාලෝචනයක් සිදුකර ණය කමිටුව වෙත වාර්තා කර නොතිබුණි.
- ඇපකරුගේ මාසික ආදායම සාධාරණීකරණය කිරීමට අවශ්‍ය විශ්වාසනීය සාක්ෂි ලේඛන ලබාගෙන නොතිබුණි.

- සමාගමට

යුතු බවට නිර්දේශ කෙරේ.

සේවාදායකයාට දැඩි ලෙස බලපා තිබුණි.තාවකාලික සහන පැකේජය යටතේ පහසුකම නැවත උපලේඛණගත කර ඇති බැවින් අපගේ සාමාන්‍ය ණය ඇගයීම අත්හැරීමට අපට සිදුවිය.

මුදල් අයකරගැනීම සඳහා අනෙක් විකල්පය නීතිමය කටයුතු ආරම්භ කිරීම නිසා පවතින ලේඛන යොදාගනිමින් ප්‍රතිව්‍යුහගත කිරිම සිදු කරන ලද අතර, රටේ පැවති තත්වය හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ 2020 අංක 05 දරන චක්‍රලේඛයේ අංක 4 (iii) වගන්තියේ උපදෙස් පරිදි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම තාවකාලිකව නවතා දමන ලදී.

ආපසු ගෙවීම ආරම්භ කිරීමට මාස 03 ක මුලික සහන කාලයක් සහිතව 2021 දෙසැම්බර් මාසයේදී ශීර්ෂගත ප්‍රතිව්‍යුහගත කිරීමේ පහසුකම ප්‍රදානය කර තිබුණි.කෙසේ වෙතත් පොරොන්දු වූ පරිදි සේවාදායකයා විසින් පළමු කුලී වාරිකයේ සිට හිඟ කුලී වාරික ලබාදීම සිදුකළේ නැත. 2022 පෙබරවාරි

	ඇපකරු වෙත ලඟාවීමට නොහැකිවීම නිසා ඇපකරුට එරෙහිව වැඩිදුර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.		මාසයේ සිට අප විසින් සේවාදායකයා සන්නිවේදනය කිරීමට හැකි සෑම උත්සාහයක් ගනු ලැබුවද ඔහු විසින් ඒවා සඳහා ප්‍රතිචාර දැක්වූයේ නැත. එම නිසා ණය මුදල් ආපසු අයකරගැනීමට ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට වඩා වැඩිදුර සමාලෝචනයක් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව අපගේ අදහස වූ අතර ඒ අනුව මෙම පහසුකම 2022 ජුලි 05 දිනෙන් අවසන් කර ලිපිගොනුව නීතිමය කටයුතු ආරම්භ කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුවට මාරු කරන ලදී. නීති දෙපාර්තමේන්තුව විසින් යවන ලද ඉල්ලීම් ලිපියට ධනාත්මක ප්‍රතිචාර නොලැබීම හේතුවෙන් එම සේවාදායකයාට එරෙහිව 2023 ජනවාරි 16 දින හෝ ඊට ආසන්න දිනයකදී කොළඹ වාණිජ මහාධිකරණයේ අංක එච්සී/සිවිල්/ 7/2023 දරන නඩුව ගොනු කර ඇති අතර නඩුව ක්‍රියාත්මක වෙමින් පවතී.	
(උ)	ණය ගැණුම්කරුවන් 2022 විසින් ණය මුදල් වලට එරෙහිව උකසට තබන	නීතිමය අවසරය ලබා ගැනීමෙන් පසු ආයෝජන	අත්පත් කරගැනීමේදී සියළුම ආයෝජන	එක් දේපලක් දේපල විකුණා ඇති අතර අනෙකුත් දේපල

	ලද දේපල, පහසුකම අක්‍රීය තත්වයට පත්වීම හේතුවෙන් සමාගම විසින් අත්පත් කරගෙන තිබුණ අතර ඒවා මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන දේපල ලෙස වර්ගීකරණය කර තිබුණි. සමාගම විසින් අත්පත් කරගෙන තිබුණ දේපල 05 ක් ආයෝජන දේපල ලෙස පෙන්වා තිබුණද පෙර ඉඩම් හිමියන් සමඟ පවතින නීතිමය තත්ත්වයන් හේතුවෙන් සන්තකයේ තබාගැනීම සීමා කර ඇත. උකසට තබන අවස්ථාවේදී දේපලවල නීතිමය හිමිකම පිළිබඳ සමාගම සැලකිල්ලක් දක්වා නොතිබුණි.	දේපල එලදායී ආකාරයෙන් භාවිතා කිරීම හා ණය ලබාදීමේදී උකසට තබන ලද දේපලවල නීතිමය වටපිටාව පිළිබඳ සහතික විය යුතු බවට නිර්දේශ කෙරේ.	ලෙස වර්ගීකරණය කරන ලදී. මෙම වත්කම් ආයෝජන දේපල ලෙස හඳුනාගන්නා අවස්ථාවේදී සමාගමට දේපල සඳහා පැහැදිලි හිමිකමක් ඇති අතර නීතිමය නඩු කිසිවක් නොවීය.මෙම දේපල සඳහා නීතිමය හිමිකම ලබාගැනීමෙන් පසු නීතිමය නඩු ආරම්භ විය. එබැවින් එය වත්කම් හඳුනාගැනීමේ නිර්නායකයට අනුකූල වේ. මීට අමතරව එහි වර්තමාන තත්වය සැලකිල්ලට ගනිමින් මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 6.05 ක ප්‍රතිපාදනයක් සිදු කර ඇත.	04 ක් සඳහා නීතිමය කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.
(ඌ)	සමාගම විසින් 2023 සමාලෝචිත වර්ෂය තුළදී , ආපසු අයකර ගැනීමට නොහැකිවීම මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ එකතුව රු.මිලියන 64.09 ක් වූ අක්‍රිය ණය සහ අත්තිකාරම් **127** ක් ලියා හැර තිබුණි.	ණය හා අත්තිකාරම් ලියා හැරීමට ප්‍රථම ආපසු අයකර ගැනීමට හැකි සෑම ප්‍රයත්නයක්ම ගැනීමට නිර්දේශ කෙරේ.	අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ලියාහැරීම් ප්‍රතිපත්තියෙහි දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුව, දිගු කාලයක් තුල නොලැබුණු ගෙවීම්/ අනාරක්ෂිත ඉවත්කිරීම් ශේෂයන් වැනි පහසුකම් ලියාහැරීමට කළමනාකරණය තීරණය කරනු ලබයි.කෙසේ වෙතත් , ලියාහැරීමට පෙර හිඟ ගෙවීම් එකතුකර ගැනීමට හැකි සියළු අයකරගැනීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති	හිඟ අයකරගැනීමට සියළු අයකරගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු සමාගමේ ප්‍රතිපත්තිය අනුව මෙය සිදුකරනු ලබයි.

			අතර පහසුකම සම්පූර්ණයෙන් නිරවුල් වන තුරු නීතිමය ක්‍රියාවලිය තවදුරටත් පවත්වාගෙන යනු ලබයි.	
(එ)	සමාගම විසින් 2019 සිට 2023 2021 දක්වා කෝපරේට් රිස්ක් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත කෙටි කාලීන ණය සහ ණය සහන ණය පහසුකම් ප්‍රදානය කර තිබුණි. 2021 වර්ෂයේදී එම ගණුදෙනුකරුගේ අවිධිමත් ගෙවීම් රටාව සහ එම ගණුදෙනුකරුගේ ඉල්ලීම අනුව පසුගිය ගෙවීම් ඉතිහාසය නොසලකා සමාගම විසින් ඉහත සියළු ණය රු.මිලියන 250.32 ක එක් ණය මුදලකට හරවා පහසුකම ප්‍රතිව්‍යුහගත කර තිබුණි. ප්‍රතිව්‍යුහගත පහසුකම පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ. • ණය පරිපාටික අත්පොතෙහි සඳහන් උපදෙස්වලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව උකස් කරන ලද දේපලෙහි බලකරන ලද විකුණුම් අගය (FSV) ඉක්මවා මුළු ණය මුදල ලබා දී ඇත. • ණය ගන්නා සමාගමේ මූල්‍ය තත්ත්වය ඇගයීම සඳහා සමාගම විසින්	ණය පහසුකම් ලබා දීමේදී ණය ප්‍රතිපත්ති උපදෙස් සහ ලේඛනවල නිරවද්‍යතාවය නිවැරදිව ඇගයීමට ලක් කළ යුතු බව නිර්දේශ කෙරේ.	හිඟ මුදල් අයකරගැනීමට නීතිමය කටයුතු ආරම්භ කර ඇත.	නීතිමය කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබාගෙන නොතිබුණි.

- සමාගම පුද්ගලික ඇපකරුට දන්වා නොතිබූ අතර ඇපකරුට එරෙහිව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ සමස්ත අවදානම අවම කිරීම සඳහා ණය කමිටුව විසින් නිර්දේශ කරන ලද පහත සඳහන් උපාය මාර්ග සමාගම විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

I 2020/2021 මුදල් වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබා ගත යුතුය.

II අනාගත ව්‍යාපාර සැලසුම්, සමාගමේ පවතින / යෝජිත ව්‍යාපාර ව්‍යාපෘති පිළිබඳ විස්තර සහ පුරෝකථනය කළ මූල්‍ය ප්‍රකාශන ලබා ගත යුතුය.

III පහසුකම් සම්පූර්ණයෙන් පියවා ගැනීම දක්වා අයදුම්කරන සමාගමේ ව්‍යාපාර කාර්ය සාධනය, CRIB වාර්තා සහ

	මුදල් ප්‍රවාහ තත්ත්වය පිළිබඳව වරින් වර සමාලෝචන පැවැත්විය යුතුය. 1 වන සමාලෝචනය ප්‍රතිව්‍යුහගත කළ ණයෙන් මාස 6ක් ඇතුළත සිදු කළ යුතු අතර පශ්චාත් ණය අධීක්ෂණ ඒකකය/මධ්‍යම ව්‍යාපාර ඒකකය මගින් ණය කමිටුවට වාර්තා කළ යුතුය.				
(ඒ)	සමාගම විසින් 2010 මැයි මාසයේදී සීගිරිය වයිස්රෝයි හොටේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත රු.මිලියන 34.14 ක කාලීන ණය පහසුකමක් ප්‍රදානය කර තිබුණි.මෙම ණය පහසුකම 2014 දෙසැම්බර් මාසයේදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි.පහත නිරීක්ෂණ කරනු ලැබේ. • ප්‍රදානය කරන ලද ණය මුදල උකසට තබා ඇති දේපලෙහි බල කරන ලද විකිණීමේ වටිනාකමට වඩා වැඩි විය. • සුරැකුම ලෙස උකසට තබා ඇති දේපළෙහි හිමිකාරිත්වය සම්බන්ධයෙන් යම් නීතිමය ගැටලු තිබුණි.	2023	සමාගම විසින් මුළු හිඟ මුදල ගණුදෙනුකරුගෙන් හෝ ඇපකරුගෙන් අය කර ගැනීම සඳහා සතුටුදායක ක්‍රියාමාර්ග ගත යුතු බවට නිර්දේශ කෙරේ.	උකස් කර ඇති දේපල සඳහා නීත්‍යානුකූල අවසරය ලබා ගැනීමට සමාගම කටයුතු කර ඇත.	නීතිමය තීන්දුව ලැබී ඇත. වෙන්දේසිය නියම කර ඇති අතර 2024/10/24 දින පැවැත්වීමට නියමිතය

(ඔ)	සමාගම විසින් ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ ප්‍රවීණයකු වන සීමිත වගකීම සහිත සමාගමක් වන ප්ලාන්ටේෂන්ස් ඩිවලප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත රු. මිලියන 52.34 ක කාලීන ණය පහසුකමක් ප්‍රදානය කර තිබුණි. සුරකුම් ලෙස දේපල 2 ක් හා එක් පුද්ගල ඇපයක් ලබාගෙන තිබුණි. වාරික මුදල් නොගෙවීම මත මෙම ණය පහසුකම 2014 දෙසැම්බර් මාසයේදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි.පහත නිරීක්ෂණ කරනු ලැබේ. • මෙම පහසුකම් සඳහා උකස් කර ඇති දේපල රජයේ බදු දේපල වේ. • ණය ගත් සමාගමේ අධ්‍යක්ෂවරයා සොයා ගත නොහැක.	2023	ණය පහසුකම් ලබා දීමේදී ණය ප්‍රතිපත්ති උපදෙස් සහ ලේඛනවල නිරවද්‍යතාවය නිවැරදිව ඇගයීමට ලක් කළ යුතු බව නිර්දේශ කෙරේ.	හිඟ මුදල් අයකර ගැනීම සඳහා ණය ලබා ගත් සමාගමේ අධ්‍යක්ෂවරයා සොයා ගැනීමට සමාගම විසින් සෑම උත්සාහයක්ම ගෙන ඇත.	ණය ලබා ගත් සමාගමේ අධ්‍යක්ෂවරයා සොයා ගැනීමට සමාගම තවමත් ක්‍රියාවලියක යෙදී සිට සමාගම විසින් තවමත් ණය ලබා ගත් සමාගමේ අධ්‍යක්ෂවරයා සොයා ගැනීමේ ක්‍රියාවලියේ යෙදී සිටි.
(ඕ)	දේපල උකසක් මත, 2010 දී එකක් රු. මිලියන 20 ක හා රු.මිලියන 5 ක ණය පහසුකම් දෙකක් අනුර මැන්පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කර තිබුණි. වාරික මුදල් නොගෙවීම මත මෙය 2010 දී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි.තවද ගණුදෙනුකරු	2023	ණය පහසුකම් ලබා දීමේදී ණය ප්‍රතිපත්ති උපදෙස් සහ ලේඛනවල නිරවද්‍යතාවය නිවැරදිව ඇගයීමට ලක් කළ යුතු බව නිර්දේශ කෙරේ.	මෙම දේපල බැහැර කිරීමට සමාගම විසින් සියළු ප්‍රයත්නයන් සිදු කර ඇත.	මෙම දේපල බැහැර කිරීමට සමාගමට තවමත් නොහැකි වී ඇත.

	විසින් 2012 වර්ෂයේදී ඉහත සඳහන් දේපල ස්වේච්ඡාවෙන් සමාගම වෙත මාරු කර තිබුණි. පහත නිරීක්ෂණ කරනු ලැබේ. • ඉඩමට නීත්‍යානුකූල ප්‍රවේශයක් නොමැතිකම සහ එය ගංවතුර ප්‍රදේශයක පිහිටා තිබීම හේතුවෙන් සමාගමට ඉහත දේපල විකිණීමට නොහැකි විය. • 2022 පෙබරවාරි දිනැති තක්සේරු වාර්තාවට අනුව එහි අගය ශූන්‍ය වේ				
(ක)	සමාගම 2014 සිට 2017 දක්වා රෙදිපිළි වෙළඳපොලේ කීර්තිමත් සිල්ලර වෙළෙන්දෙකු වන රංජනාස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත චක්‍රීය සහ කාලීන ණය පහසුකම් ප්‍රදානය කර ඇත. දැනට පවතින පහසුකම් සඳහා ආපසු ගෙවීම නොකඩවා සිදු නොවන බැවින්, සමාගම 2019 අගෝස්තු මාසයේදී පවත්නා කාලීන ණයෙහි හිඟ ශේෂය වන රු. මිලියන 25.22 ක මුදලකට ප්‍රතිව්‍යුහගත කර ඇත. ප්‍රතිව්‍යුහගත පහසුකම පිළිබඳ පහත නිරීක්ෂණ කරනු ලැබේ. • ක්‍රියාපටිපාටි	2023	ණය පහසුකම් ලබා දීමේදී ණය ප්‍රතිපත්ති උපදෙස් සහ ලේඛනවල නිරවද්‍යතාවය නිවැරදිව ඇගයීමට ලක් කළ යුතු බව නිර්දේශ කෙරේ.	ඉල්ලීම් ලිපිය නිකුත් කර ඇත.	ණයට ගත් සමාගම නැවතත් 2024 පෙබරවාරි සිට මසකට රු.500,000 බැගින් ප්‍රාග්ධන ආපසු ගෙවීම් සිදු කරන අතර දැනටමත් රු. මිලියන **3.5** ක් ගෙවා ඇත.

අත්පොතෙහි 3.0 වගන්තියට අනුව, ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට පෙර දැඩි පාලන ක්‍රම යොදවා පසු විපරම් කර නොතිබූ අතර අධීක්ෂණය සහ සුපරීක්ෂණ කොටස නිසි ලෙස සිදු කර නොතිබුණි.

- නිසි ඇපකරු ඇගයීමක් සිදු කර නොතිබුණි
- ණය ලබා ගත් සමාගමේ මූල්‍ය තත්ත්වය ඇගයීම සඳහා සමාගම විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබාගෙන නොතිබුණි.
- ණයට ගත් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු වාරික 3ක් පමණක් ගෙවා ඇති අතර, 2023 දෙසැම්බර් මාසයේ නිකුත් කරන ලද ඉල්ලීම් ලිපියෙන් පසුව, ගණුදෙනුකරු විසින් 2024 පෙබරවාරි සිට මසකට රු.500,000 බැගින් වූ ප්‍රාග්ධන ආපසු ගෙවීමක් කරගෙනයනු ලබයි.

3.9 ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	බදු පසු ලාභය (අලාභය) රු.	මතය
2021	8,704,836,000	1,897,832,000	6,807,004,000	255,144,000	තත්ත්වාගණනය නොකළ
2022	8,457,711,000	1,349,029,000	7,108,682,000	460,588,000	තත්ත්වාගණනයනො කළ
2023	9,511,536,000	1,287,671,000	8,223,865,000	758,720,000	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා 2021 ජනවාරි 05 දිනැති ලිපිය මගින් දන්වා සිටියේ 2021 සැප්තැම්බර් 30 වන විට බැංකුව ඈවර කිරීමට හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) සමඟ ඒකාබද්ධ කිරීමට නියමිත බවයි. එදින සිට ක්‍රියාත්මක වන පරිදි, බැංකුවේ මෙහෙයුම් කටයුතු අත්හිටුවා තිබුණු අතර ණය ගෙවීම් සිදු නොකරන ලද අතර අලුතින් තැන්පතු ලබා ගැනීම ද සිදු කර නොතිබුණි. කෙසේ වුවද, මෙම වාර්තා කරන දිනය දක්වා බැංකුව ඈවර කර හෝ ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) සමඟ	2021	ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට ක්ෂණික ක්‍රියාමාර්ග ගත යුතුය.	ඒකාබද්ධ කිරීම සම්බන්ධ ඉදිරි කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ සහ මුදල් අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගැනීමට අපේක්ෂා කරන බව ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ (NSB) කළමනාකාරීත්වය විසින් දැනුම් දෙන ලදී. මහා භාණ්ඩාගාරය මගින් ඒකාබද්ධ කිරීම සඳහා අනුමැතිය ලබා දීමෙන් අනතුරුව පමණක් නීති උපදෙස් ලබා දිය හැකි බව නීතිපති දෙපාර්තමේන්තුව මගින් ඔවුන්ගේ 2022.09.09 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත. ඒ අනුව, ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන්	ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත වත්කම් සහ බැරකම් අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය 2024 සැප්තැම්බර් 30 දිනට සිදුවෙමින් පවතී.

<table>
<tr><td></td><td>ඒකාබද්ධ කර හෝ නොතිබුණි.</td><td></td><td></td><td>ප්‍රතිපත්තිමය නියෝගයක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) මගින් මෙම කරුණ 2022.09.21 දිනැති ලිපිය මගින් භාණ්ඩාගාර ලේකම් වෙත යොමු කර ඇති අතර, ඔවුන්ගේ තීරණය මෙතෙක් ලැබී නොමැත.</td><td></td></tr>
<tr><td>(ආ)</td><td>ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවෙන් පවරා ඇති පහත දැක්වෙන වත්කම් සම්පූර්ණයෙන්ම හානිකරණය කර ඇති අතර එම ශේෂයන් සත්‍යාපනය කිරීමට සාක්ෂි කිසිවක් හමු නොවුණි.
<table>
<tr><th>අයිතමය</th><th>වටිනාකම (රු.)</th></tr>
<tr><td>අත්තිකාරම් මත ගෙවිය යුතු වට්ටම්</td><td>13,356,809</td></tr>
<tr><td>ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) නීති කටයුතු වෙනුවෙන් වූ තැන්පතු අරමුදල</td><td>7,098,200</td></tr>
</table></td><td>2022</td><td>මූල්‍ය ප්‍රකාශන වල ඇති සෑම ශේෂයන් සඳහාම සාක්ෂි සහ සවිස්තරාත්මක සටහන් පවත්වා ගත යුතුය.</td><td>ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුව (PSDB) පවරා ගන්නා විට අත්තිකාරම් මත ගෙවිය යුතු වට්ටම් ශේෂය මාරු කර ඇත. එබැවින්, සත්‍යාපනය සඳහා සාක්ෂි නොපැවතුණි.

ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB)සේවකයින්ගේ පාරිතෝෂික ගෙවීම් පිළිබඳ ගැටළුවක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියාචනා නඩු දෙකක් විභාග වෙමින් පවතින අතර එහි සම්පූර්ණ වටිනාකම රු. 7,098,200 කි.</td><td>ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුව භාරදීමේදී එය මාරු කර ඇති බැවින් අත්තිකාරම් ශේෂයන් සඳහා ගෙවන ලද වට්ටම් සඳහා සවිස්තර සටහන සහිතව ශේෂයන් සොයා ගැනීමට බැංකුව අසමත් වී ඇත. 2024 සැප්තැම්බර් 30 දිනට අභියාචනා නඩු දෙක අවසන් කර නැත.</td></tr>
<tr><td>(ඇ)</td><td>පහත දක්වා ඇති ලැබිය යුතු ශේෂ වර්ෂ කිහිපයක සිට අයකර ගැනීමකින් තොරව හිඟව පැවතුණි.</td><td>2022</td><td>දිගුකාලීන හිඟ ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය.</td><td>ලැබිය යුතු මුද්දර ගාස්තු - වටිනාකම යනු ණය පැහැර හරින ලද පාරිභෝගියකුගේ උකස් කළ දේපළක් බැංකුවට ලබා ගැනීමේදී කරන ලද ගෙවීමකි. මෙම වටිනාකම ආපසු අයකර</td><td>2024 සැප්තැම්බර් 30 දක්වා මුද්දර ගාස්තු අය කර ගැනීමට බැංකුවට නොහැකි විය. ශේෂ පියවීමට</td></tr>
</table>

විෂයය	වටිනාකම (රු.)
ලැබිය යුතු මුද්දර ගාස්තු	1,999,000
පසු දාතම් චෙක්පත් වට්ටම් ගිණුම	349,200
ලැබිය යුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පතු- සහනාධාර	3,045,845

				ගත හැකි වන්නේ දේපළ බැහැර කළ විට පමණි. පසු දාතම් චෙක්පත් වට්ටම් ගිණුම - ශේෂය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. ලැබිය යුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පතු- සහනාධාර 2021 අප්‍රේල් 01 සිට 2022 ජූනි 30 දක්වා වූ කාලය සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ගෙවන ලද පොළිය සම්බන්ධයෙන් බැංකුව වෙත භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල මෙය වේ.	කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත. 2024 සැප්තැම්බර් 30 වන විට බැංකුව රු.50,000 ක් අයකර ගන්නා ලදී.
(ඈ)	"ගෙවිය යුතු වෙනත් ණය හිමියන් '' යටතේ හෙළිදරව් කරන ලද ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) ණය ගැනීම් වලින් රු. 32,249,689 ක වටිනාකමක් වසර දෙකකට වඩා වැඩි කාලයක් පැවතුණි.	2022	හිඟ ශේෂ සාධාරණ කාලසීමාවක් තුළ සැසඳීම සිදු කර නිෂ්කාශනය කළ යුතුය.	ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB)-ණයහිමියන් - ප්‍රමුඛ ඉතුරුම් හා සංවර්ධන බැංකුවේ (PSDB) ණය ගිණුමේ නොපියවූ ශේෂයන් ඉතිරිව පැවතුණි.	2024 සැප්තැම්බර් 30 දිනට බැංකුවේ පොදු ලෙජර ගිණුමේ ශේෂය එලෙසම පැවතුනි.
(ඉ)	ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ උපදෙස් පරිදි ඒකාබද්ධයට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවය වුවද, බැංකුව වගකීම් විරහිතව ක්‍රියා කළ අවස්ථා කිහිපයක් තිබුණි. සමහර අවස්ථා පහත දැක්වේ. (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ 2023	2023	මව් සමාගම සමඟ සාකච්ඡා කර බැංකුව ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය වේගවත් කළ යුතුය.	අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයේ කිසියම් හිඟයක් සඳහා මව් සමාගම විසින් අරමුදල් සපයනු ලබන බවට මව් සමාගම 2020 දෙසැම්බර් 20 දින එකඟතාවක් ලබා දී ඇත. මහ බැංකුව මව් සමාගමෙන් ඒ පිළිබඳව සහතිකයක් ඉල්ලා ඇති අතර බැංකුව ද ඔවුන්ගේ සහතිකය 2023 පෙබරවාරි 14 වන දින	ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත වත්කම් සහ බැරකම් අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය 2024 සැප්තැම්බර් 30 දිනට සිදුවෙමින් පවතී.

පෙබරවාරි 03දිනැති ලිපියට අනුව දක්ෂ කාර්ය මණ්ඩලයක ඇති ඌනතාවය හේතුවෙන් ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවහි ඇති මෙහෙයුම් දුෂ්කරතාවයන් නිසා බැංකුව විසින් ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය නැවත අවධාරණය කරන ලදී.

(ii) ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා 2022 මැයි 27 දිනැති ලිපිය මගින් පෙන්වා දී ඇත්තේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව යන දෙකටම ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව සඳහා වූ මුදල් මණ්ඩලය විසින් අනුමත කර ඇති විසඳුම් රාමුව ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දී තිබූ බවයි. කෙසේ වෙතත් , විසඳුම් රාමුවට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට දැනුම් දෙන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීම සහතික

යවා ඇති අතර මව් සමාගමෙන් එම සහතිකය 2023 මැයි 26 වන දින යවා ඇත.

	කිරීමට බැංකු දෙකම අපොහොසත් වී තිබුණි. (iii) ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂකගේ 2022 ජනවාරි 13දිනැති ලිපියේ දක්වා ඇති පරිදි යථාර්ථවාදී නොවන පුරෝකථන සහ ප්‍රධාන අවදානම් තක්සේරු සාධක නොසලකා බැංකුව විසින් 2026-2022 කාලසීමාව සඳහා උපාය මාර්ගික ව්‍යාපාර සැලැස්ම ඉදිරිපත් කර තිබුණි				
(ඊ)	මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් වගකීම් ශේෂයන් යටතේ හඳුනා නොගත් බැංකු තැන්පතුවලින් සමන්විත රු. 5,360,365 ක හඳුනා නොගත් අවිනිශ්චිත ගිණුම් ශේෂයක් ඇතුළත් විය.	2023	සාධාරණ කාලසීමාවක් තුළ බැංකුව හඳුනා නොගත් අවිනිශ්චිත ගිණුමක් නිෂ්කාශනය කළ යුතුය	මෙම තැන්පතු ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සඳහා කිසිදු ප්‍රකාශයක් නොමැතිව ගනුදෙනුකරුවන් විසින් සෘජුවම සිදු කරන ලදී. බැංකුවට අනුව, ඔවුන් හඳුනා ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගෙන ඇති අතර 2023 වර්ෂයේ සහ 2024 අගෝස්තු මාසය දක්වා මෙම ගිණුමට කිසිදු මුදලක් එකතු වී නොතිබුණි.	2024 සැප්තැම්බර් 30 දිනට බැංකුවේ පොදු ලෙජර ගිණුමේ ශේෂය එලෙසම පැවතුනි.